# 2024

# කාර්යසාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசன, மத மற்றும் கலாச்சார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious & Cultural Affairs

# කාර්යසාධන වාර්තාව

# 2024

**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,**

**කොළඹ 07.**

| | | |
|---|---|---|
| දුරකථන | : | 011- 2307694 |
| | | 011- 2307674 |
| ෆැක්ස් | : | 011- 2307688 |
| | | 011- 2300513 |
| විද්‍යුත් තැපැල | : | mbsecoffice@gmail.com |
| වෙබ් අඩවිය | : | http://www.mbs.gov.lk |

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
# බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**අන්තර්ගතය** **පිටු අංක**

**බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01-06

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 07-20

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 21-53

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 54

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 55-56

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 57-61

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 62-68


**සංස්කෘතික කටයුතු අංශය**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 69-78

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 79-96

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 97-104

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 105-106

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 107-109

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 110-112

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 113-127

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 128-137

**ජාතික උරුම අංශය**


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 138-151 |
| පරිච්ඡේදය 02 | - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 152-183 |
| පරිච්ඡේදය 03 | - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 184-189 |
| පරිච්ඡේදය 04 | - කාර්යසාධන දර්ශක | 190-191 |
| පරිච්ඡේදය 05 | - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 192-193 |
| පරිච්ඡේදය 06 | - මානව සම්පත් පැතිකඩ | 194-195 |
| පරිච්ඡේදය 07 | - අනුකූලතා වාර්තාව | 196-203 |

# බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ආධ්‍යාත්මික හා මානව සංවර්ධනය, සංස්කෘතිය හා බැඳුණු ප්‍රධානතම අමාත්‍යාංශයයි. ඒ අනුව වසර 2500 කින් ඔබ්බට විහිදුණු සභ්‍යත්වයක හා ශිෂ්ටාචාරය ආරක්ෂා කරගැනීම, පවත්වාගෙනයාම හා මතු පරපුර වෙත දායාද කිරීම මෙම අමාත්‍යාංශයේ අත්හල නොහැකි වගකීමකි. මේ සඳහා බුදුදහම ප්‍රමුඛස්ථානයෙහි තබමින් සියළු ආගම් අතර සහජීවනය ඇති කරමින් කටයුතු කරන අතරම සමාජ සංස්කෘතික වශයෙන් පෝෂණය වූ සමාජයක් බිහිකිරීමට සංස්කෘතිකාංග සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපගේ ප්‍රමුඛ වගකීම වේ.

ඒ වෙනුවෙන්, රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධ්‍යාත්මික, ගුණගරුක හා සංස්කෘතික වශයෙන් සුපෝෂිත මිනිසෙකු බිහිකිරීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීමට අප බැඳී සිටිමු.

ඒ අනුව පූජනීය ස්ථාන සංවර්ධනය මෙන්ම පූජ්‍ය පක්ෂයේ අභිවෘද්ධිය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ආගම් අතර සහජීවනය ඇති කිරීම වෙනුවෙන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සිදුකරන අතර අධ්‍යාත්මික වශයෙන් පිරිපුන් ගුණගරුක පුරවැසියෙකු බිහිකිරීම උදෙසා අවශ්‍ය කලා අංග පෝෂණය කිරීම, සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම වෙනුවෙන් ද විවිධ වූ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ.

2025 වසරේ සිට ඉදිරියට අප අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී නව රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමාව සාක්ෂාත් කිරීම පිණිස හා Clean Sri Lanka ජාතික වැඩසටහනට සමගාමීව වැඩසටහන් සකස් කරමින් සාරධර්ම පිරි ගුණගරුක, විනයගරුක හා සංස්කෘතික වූ පුරවැසියන්ගෙන් සපිරි සමාජයක් බිහිකිරීමේ අභියෝගය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

එම අරමුණු වෙත ළඟාවීම වෙනුවෙන් අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි කාර්යභාරයන් සම්බන්ධීකරණය කරමින් අමාත්‍යාංශ විෂයපථය ක්‍රියාවට නැංවීමත්, ඒ සඳහා දායක කරගත හැකි වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීමත්, හැකි සෑම අවස්ථාවකදීම ජාත්‍යන්තර සංවිධාන, ජාතික වශයෙන් ක්‍රියාත්මක වෙනත් සංවිධාන, පුද්ගලික අංශය හා ප්‍රජාදායකත්වය ලබා ගැනීමත් අපගේ ක්‍රියාකාරකම්හි තිරසරබව තහවුරු කිරීම සඳහා ඉවහල් කර ගැනේ.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

"තිරසර ලෙස සංවර්ධනය වූ ශ්‍රී ලංකාවක්"

**මෙහෙවර**

“බුදු දහම ප්‍රමුඛව සියලු ආගමික හරපද්ධතීන් මත පදනම්ව, ගුණ ගරුක, විනයගරුක හා ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුතු මතුපරපුරක් බිහිකිරීමට කලා - සංස්කෘතික හා උරුමයන් සංරක්ෂණය ප්‍රවර්ධනය තුළින් වඩා යහපත් අනාගතයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම”

**අරමුණු**

ආධ්‍යාත්මික වශයෙන් පිරිපුන් ගුණගරුක සමාජයක් බිහි කිරීම සඳහා බුදු දහමට ප්‍රමුඛස්ථානයක් ලබා දෙමින් හින්දු, කිතුණු හා ඉස්ලාම් ආගම් සමග සහජීවනයෙන් කටයුතු කිරීම සඳහා

- බුද්ධශාසනයට ප්‍රමුඛස්ථානය දෙමින් එය සුරක්ෂිත කොට පෝෂණය කිරීම.
- සෑම ආගමකටම පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂාකර දෙමින් සියලු ආගමික හා ජනවාර්ගික කොටස් සමග අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා සහජීවනයෙන් ජීවත් විය හැකි සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැගීම.
- ථේරවාදී නිර්මල බුදු දහම සුරක්ෂිත කිරීමේ වගකීම හිමි භික්ෂූන් වහන්සේලා බෞද්ධ දර්ශනය මෙන්ම සෙසු භාෂා හා තාක්ෂණික දැනුමෙන් පරිපූර්ණ කිරීම මෙන්ම අනෙකුත් ආගම්වල පූජකතුමන්ලා දැනුමින් ආධ්‍යාත්මික ගුණයන්ගෙන් පරිපූර්ණ කිරීමට කටයුතු කිරීම.
- ඒ ඒ ආගමික සිද්ධස්ථාන කේන්ද්‍ර කර ගනිමින් ජනජීවිතය ආධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් සංවර්ධනය කරා යොමු කරමින් කුඩාකල සිටම දූ දරුවන් සදාචාර සම්පන්න පුරවැසියන් බවට පත් කිරීම හා විවිධ ආගම් තුලින් සැබෑ දහම් අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම.
- ජාතික හා අන්තර්ජාතික මට්ටමින් ථේරවාද බුදු දහම ව්‍යාප්ත කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කිරීම.
- අවධානයට ලක්නොවී විනාශ වී යන පැරණි බෞද්ධ හා පුරාවිද්‍යාත්මක වටිනාකම් වලින් යුත් ස්ථාන සංරක්ෂණය කොට මතුපරපුරට දායාද කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්මේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- බුදුදහම ඇතුළු අනෙකුත් ආගම් ඇදහීමේ අයිතිය සුරක්ෂිත කිරීම.
- සියලු ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සහ ආගමික අන්තවාදයට එරෙහිව පියවර ගැනීම.
- දහම් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම.
- ආගමික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.
- දුෂ්කර ප්‍රදේශවල පිහිටි ආගමික ස්ථාන වැඩිදියුණු කිරීම.
- සියලු ආගම්වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම.
- රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්යක්ෂම ලෙස පරිපාලනය කිරීම.
- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතියේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විදේශීය රටවල් සමග සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම.
- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයන්හි අභිමානය ප්‍රමුඛ වන සංචාරක වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.
- ජාතීන් අතර සහයෝගය ඇතිකිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදාගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම.
- ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව කතෘ භාග ගෙවීම පිළිබඳ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම අඛණ්ඩ අනුග්‍රහය ලබන සාහිත්‍ය, සිනමා, නාට්‍ය සහ අනෙකුත් කලාවන් සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම.
- කලා හා සංස්කෘතික ආයතන සමග සහයෝගීත්වයෙන් සෑම ප්‍රධාන නගරයකම සංස්කෘතික කලාප පිහිටුවීම.
- විශ්ව සාහිත්‍යය හා නාට්‍ය පිටපත් ජාතික භාෂාවන්ට පරිවර්තනය කිරීම, දිරිමත් කිරීම.
- නවීනතම තාක්ෂණය සපයමින් ජාතික ලේඛනාරක්ෂණය නවීකරණය හා ප්‍රතිසංවිධානය කිරීම.
- බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලයක් හරහා වේදිකා නාට්‍ය කලාව බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ප්‍රවර්ධනය කිරීමට ව්‍යුහාත්මක සැලැස්මක් සැකසීම.
- අද්‍යතන වේදිකා නාට්‍ය කලාව පිළිබඳ පර්යේෂණය හා පුහුණුව සඳහා ජාතික ආයතනයක් පිහිටුවීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම.

## 1.4 සංවිධාන සටහන - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - (බුද්ධශාසන හා ආගමික අංශය)



## 1.5 බුද්ධශාසන හා ආගමික අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
- හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
- ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
- මහා භාරකාර දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින අරමුදල්

- බුද්ධශාසන අරමුදල

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

- ව්‍යාපෘතියේ නම :බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ව්‍යාපෘතිය
- දායක නියෝජිත ආයතනය : ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය
- ක්‍රියාත්මක බලධාරී ආයතනය : බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ඇස්තමේන්තු ගත වියදම : ඉන්දියානු මූල්‍ය ප්‍රදාන ඇ.ඩො.මි. 10.00

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 වර්ෂ 2024 දී ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රගතිය (2024.12.31දිනට)

**( වගු අංක 1 - වර්ෂ 2024 දී ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති ප්‍රගතිය 2024.12.31දිනට)**

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2024 අයවැය මගින් ප්‍රතිපාදන ලැබීම් (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) | 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1. | පූජාභූමි සංවර්ධන වැඩසටහන | 25.00 | 100% | 24.87 | - |
| 2. | ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන | 100.50 | 100% | 99.36 | - |
| 3. | කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 5.00 | 100% | 4.99 | - |
| 4. | අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | 84.00 | 100% | 72.45 | - |
| 5. | තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන | 10.00 | 99% | 8.85 | - |
| 6. | බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ව්‍යාපෘතිය | 13- 1000.00<br>17- 75.00 | 18% | - | මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම හඳුනාගෙන මැනුම් කටයුතු සිදුකරමින් පවතී. |

#### 2.1.1 පූජාභූමි සංවර්ධනය

පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය මෙම අමාත්‍යාංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යය භාරයකි. ඒ අනුව, අධ්‍යාත්මික වශයෙන් පිරිපුන් ගුණ ගරුක සමාජයක් බිහි කිරීමත්, ශ්‍රී ලාංකේය ඓතිහාසික උරුමයන් අනාගත පරපුර වෙත සුරක්ෂිත කොට දායාද කිරීමත් අරමුණු කොට ගනිමින්, කිසියම් විහාරස්ථානයක් පල්ලියක්, කෝවිලක් හෝ දේවාලයක් පූජා භූමියක් ලෙස හඳුනාගෙන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමත්, එම පූජා භූමිය සංවර්ධනය කිරීමත්, මෙම අමාත්‍යාංශයේ කාර්යභාරයට අයත් වේ.

මෙහිදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පූජා භූමි වල පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම සහ පූජනීයත්වය සැලකිල්ලට ගෙන ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය වශයෙන් කොටස් තුනකට වර්ගීකරණය කර එම නිර්ණායක වලට අනුව ගැලපෙන ස්ථාන 1946 අංක 13 දරන (269 වැනි අධිකාරිය වූ) නගර හා ග්‍රාම නිර්මාණ අඥාපනතේ 6 (2) (ආ) හා 21(2) (ආ) වගන්තිය යටතේ පූජනීය ස්ථාන හා එම යෝජනා ක්‍රමය යටතේ දියුණු කිරීමට යෝජිත භූමි ප්‍රදේශ “නාගරික සංවර්ධන ප්‍රදේශ” ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි.

**පූජාභූමියක් ලෙස හඳුනා ගැනීමේදී අවධානය යොමු කරන කරුණු:-**

- ආගමික වැදගත්කම
- ඓතිහාසික වැදගත්කම
- පුරාවිද්‍යාත්මක වැදගත්කම
- සංස්කෘතික වැදගත්කම
- ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම
- පාරිසරික වැදගත්කම
- ආර්ථික හා සමාජීයීය වැදගත්කම

2024 වසරේදී පූජා භූමි සංවර්ධනය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 25 ක් වූ අතර, පළාත් 06ක , දිස්ත්‍රික් 9 ක පූජාභූමි 11ක සංවර්ධන කටයුතු සඳහා රු. මි. 24.99 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර වියදම් වූ මුදල රු.මි. 24.87 කි.

**(වගු අංක 2 - 2024 වර්ෂයේ පූජාභූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා නිදහස් කරන ලද ප්‍රතිපාදන වල සාරාංශය - 2024.12.31 දිනට)**

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය **(2024.12.31 දිනට)** |
|---|---|---|---|---|---|
| | | | | | |
| 01. | බස්නාහිර | කොළඹ | 01 | 99.74% | 100% |
| | | ගම්පහ | 01 | 100% | 100% |
| 02. | නැගෙනහිර | ත්‍රිකුණාමලය | 01 | 99.94% | 100% |
| | | | 01 | | 100% |
| 03. | වයඹ | පුත්තලම | 01 | 99% | 100% |
| 04. | දකුණ | හම්බන්තොට | 01 | 99.95% | 100% |
| | | මාතර | 01 | 99.99% | 100% |
| | | | 01 | | 100% |
| 05. | සබරගමුව | කෑගල්ල | 01 | 99.95% | 100% |
| | | රත්නපුර | 01 | 100% | 100% |
| 06. | මධ්‍යම | මහනුවර | 01 | 99.46% | 100% |
| **එකතුව** | **06** | **09** | **11** | | |

### 2.1.1.1 - පූජා භූමි සන්නස් ප්‍රදානය 2024

2024 රාජ්‍ය වෙසක් උත්සවය මාතලේ දිස්ත්‍රික්කයේ ශ්‍රී ධර්මරාජ පිරිවෙන් විහාරස්ථානයේ පැවැති අතර එහිදී පූජා භූමි වශයෙන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පහත විහාරස්ථාන 06 සඳහා පූජා භූමි සන්නස්පත්‍ර ප්‍රදානය සිදු කරන ලදී.



- මාතලේ උකුවෙල කළල්පිටිය ක්ෂේත්‍රාරාම පුරාණ විහාරය
- පුත්තලම, කරුවලගස්වැව, වෙහෙරගල රජමහා විහාරය
- හම්බන්තොට, අම්බලන්තොට, වාඳුරුප්ප ථේරපුත්තාභය රජමහා විහාරය
- මොණරාගල, බිබිල, කොටසර පියංගලු රජමහා විහාරය
- කෑගල්ල, රඹුක්කන, කඩිගමුව ශ්‍රී නාගවනාරාම රජමහා විහාරය
- නුවරළිය, බඹරකැලේ ශ්‍රී මහා විහාරය යන විහාරස්ථානය

ශ්‍රී ලංකාව පුරා විසිරී පවතින සිද්ධස්ථාන වලින් පූජා භූමි වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද සුවිශේෂී සිද්ධස්ථාන 11 ක් සඳහා සන්නස්පත්‍ර ප්‍රදානෝත්සවයක් 2024.02.15 දින ජනාධිපති කාර්යාලයේදී පැවති අතර එහිදී පහත සඳහන් සිද්ධස්ථාන සඳහා සන්නස් ප්‍රදානය කරන ලදී.



- කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිය ශ්‍රී විජයසුන්දරාරාම රජමහා විහාරය
- කබලෑව ඇඹව ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරය සහ ගම්භාර සිද්ධ කබලෑ මුල් සුනියම් දේවාලය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යාන්ඔය රජමහා විහාරය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාගරපුර සමුද්‍රගිරි වන සෙනසුන
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ශාන්ති විහාරය
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඹගස්වැව පුරාණ රජමහා විහාරය
- ගම්පහ දිස්ත්‍රික්කයේ මැද්දේගම රජමහා විහාර පූජා භූමිය
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඓතිහාසික උද්දකන්දර රජ මහා විහාරය
- පුත්තලම දිස්ත්‍රික්කයේ පොතුවටවන මහා විහාරය
- අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර මුහුදු මහා විහාරය

## 2024 පූජා භූමි සංවර්ධන කටයුතු



ත්‍රිකුණාමලය වෙල්ගම් රජමහා විහාරයේ දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම



තිස්සමහාරාම රජමහා විහාරයේ පොදු වැසිකිළි පද්ධතිය සකස් කිරීම



රත්නපුර දෙල්ගමුව රජමහා විහාරයේ ධර්මශාලාවේ වැඩ නිමකිරීම



කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම කොටවෙහෙර රජමහා විහාරයේ දහම් පාසල් ගොඩනැගිල්ලේ වැඩ නිමකිරීම



මහනුවර දිස්ත්‍රික්කයේ මීගම්මන රජමහා විහාරයේ සංඝාවාසයේ වහළ ප්‍රතිසංස්කරණය කිරීම



බියගම සුදර්ශනාරාම විහාරස්ථානයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම





පිලාකටුමුල්ල ශ්‍රී පුෂ්පාරාම පුරාණ රජමහා විහාරයේ
ධර්මශාලාව ප්‍රතිසංස්කරණය

## 2.1.2 ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන

බුදු දහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය උදෙසා කටයුතු කිරීමේදී විහාරස්ථානයන්හි පවතින භෞතික පහසුකම් ඉහල නැංවීමට රාජ්‍ය දායකත්වය ලබාදෙන වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. ශාසනික මෙහෙවර උදෙසා එම විහාරස්ථානය දක්වන දායකත්වය සලකා බලා අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළ යුතු සංවර්ධන කටයුතු හා ආපදාවට ලක් වූ විහාරස්ථානවලට අදාළ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති තෝරා ගැනීම සිදුවේ.

2024 වසරට අදාළව ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 100.5 ක ප්‍රතිපාදන වෙන් විය. එසේ වෙන් වූ ප්‍රතිපාදන වලින් 2024.12.31 වන විට දිස්ත්‍රික් මට්ටමින් තෝරා ගත් විහාරස්ථානයන්හි අදාළ ව්‍යාපෘති 214 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 100.43 ක වැයකර ඇත.



ඕවාගිරි පුරාණ රජමහා විහාරය
සංඝාවාස ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කිරීම
( අම්පාර දිස්ත්‍රික්කය / අම්පාර ප්‍රා.ලේ)



ශ්‍රී සාම විහාරස්ථානය
ජල කුළුණ ඉදිකිරීම
(අම්පාර දිස්ත්‍රික්කය / අම්පාර ප්‍රා.ලේ.)

**( වගු අංක 3 - 2024 වර්ෂයේ විහාරස්ථාන සංවර්ධන ව්‍යාපෘති සඳහා වැය කරන ලද ප්‍රතිපාදන සාරාංශය -2024.12.31 දිනට)**

| අනු අංක | දිස්ත්‍රික්කය | අනුමත කළ ප්‍රතිපාදන | |
|---|---|---|---|
| | | ව්‍යාපෘති ගණන | ප්‍රතිපාදන (රු.මි.) |
| 1 | කොළඹ | 6 | 2.37 |
| 2 | ගම්පහ | 5 | 2.50 |
| 3 | කළුතර | 25 | 12.70 |
| 4 | මහනුවර | 7 | 3.50 |
| 5 | මාතලේ | 28 | 14.10 |
| 6 | නුවරඑළිය | 2 | 1.00 |
| 7 | ගාල්ල | 9 | 4.50 |
| 8 | මාතර | 6 | 3.00 |
| 9 | හම්බන්තොට | 4 | 2.00 |
| 10 | යාපනය | 0 | - |
| 11 | මන්නාරම | 1 | 0.50 |
| 12 | වවුනියාව | 1 | 0.50 |
| 13 | මුලතිව් | 1 | 0.50 |
| 14 | කිලිනොච්චිය | 0 | - |
| 15 | මඩකලපුව | 7 | 3.50 |
| 16 | අම්පාර | 5 | 2.50 |
| 17 | ත්‍රිකුණාමලය | 3 | 1.50 |
| 18 | කුරුණෑගල | 14 | 7.00 |
| 19 | පුත්තලම | 1 | 0.50 |
| 20 | අනුරාධපුරය | 8 | 4.00 |
| 21 | පොළොන්නරුව | 4 | 2.00 |
| 22 | බදුල්ල | 3 | 1.05 |
| 23 | මොනරාගල | 9 | 4.50 |
| 24 | රත්නපුර | 8 | 4.00 |
| 25 | කෑගල්ල | 12 | 5.40 |
| 26 | ආපදා | 45 | 17.31 |
| | **මුළු එකතුව** | **214** | **100.43** |

### 2.1.3 කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ල නිම කිරීම.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් හානියට පත් කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම් පාසල් ගොඩනැගිල්ලෙහි ජලපවාහන පද්ධතිය සකස් කිරීමට අදාළව 2024 වර්ෂයේ මෙම අමාත්‍යාංශය වෙත රු.මි. 5 ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි. 2024 වසර සඳහා වූ භෞතික ඉලක්කයන් 100% ළඟා කර ගෙන ඇති අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.99 කි.

### 2.1.4 අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම.

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ඩී.ආර්. විජේවර්ධන මාවත කොළඹ 10 යන ස්ථානයේ පිහිටි මහල් 9කින් සමන්විත අර්ධ වශයෙන් වැඩ නිමකර තිබූ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ අධියර වශයෙන් නිම කරමින් මෙම අමාත්‍යාංශය යටතේ කුලී පදනම මත පෞද්ගලික ස්ථානයන්හි පවත්වාගෙන යනු ලැබූ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව එහි ස්ථාපිත කරන ලදී.

2024 වර්ෂයට මෙම ගොඩනැගිල්ලේ කටයුතු නිම කිරීම සඳහා ලද රුපියල් මිලියන 84ක ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ඉතිරි මහලේ හා ශ්‍රවණාගාරයේ කටයුතු නිම කරමින් භාවිතයට සුදුසු තත්වයට පත් කර ඇත.

### 2.1.5 පුණ්‍යග්‍රාම වැඩසටහන

විනයගරුක, ගුණගරුක, සාරධර්ම පිරි නිරෝගිමත්, සාධාරණ සමාජයක් උදෙසා පුණ්‍යවන්ත ග්‍රාමයක් බිහි කිරීම තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන තුලින් අපේක්ෂා කරයි. එබැවින් මෙම වැඩසටහන යටතේ සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

2024 වර්ෂයේ පුණ්‍යග්‍රාම / මත්ද්‍රව්‍ය නිවාරණ වැය විෂය සඳහා රු.මි. 10ක මුදලක් වෙන්වූ අතර, 2024.12.31 දින වන විට පුණ්‍යග්‍රාම - සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන වෙනුවෙන් දිස්ත්‍රික්ක 19ක ගම්මාන 69ක් සඳහා රු.මි. 6.08ක්ද, දීපව්‍යාප්ත මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා රු.මි. 1.17ක් හා මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩමුළු 04ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 2.15 වශයෙන් සමස්ත ප්‍රතිපාදන රු.මි. 9.50ක් නිදහස් කර ඇත.

**( වගු අංක 4 - 2024 වර්ෂයේ පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති සඳහා වැය කරන ලද ප්‍රතිපාදන සාරාංශය -2024.12.31 දිනට)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | සාරධර්ම හා සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා | |
|---|---|---|---|
| | | වැඩසටහන් ගණන | අනුමත ප්‍රතිපාදන (රු.මි.) |
| 01 | කොළඹ | 0 | 0.00 |
| 02 | ගම්පහ | 04 | 0.67 |
| 03 | කළුතර | 08 | 0.19 |
| 04 | මහනුවර | 22 | 0.68 |
| 05 | මාතලේ | 04 | 0.27 |
| 06 | නුවරඑළිය | 10 | 0.15 |
| 07 | ගාල්ල | 11 | 0.40 |
| 08 | මාතර | 17 | 0.50 |

| | | | |
|---|---|---|---|
| 09 | හම්බන්තොට | 07 | 0.32 |
| 10 | අම්පාර | 30 | 0.28 |
| 11 | ත්‍රිකුණාමලය | 06 | 0.12 |
| 12 | කුරුණෑගල | 27 | 0.78 |
| 13 | පුත්තලම | 21 | 0.37 |
| 14 | අනුරාධපුරය | 03 | 0.07 |
| 15 | පොළොන්නරුව | 08 | 0.15 |
| 16 | බදුල්ල | 20 | 0.36 |
| 17 | මොණරාගල | 16 | 0.26 |
| 18 | රත්නපුරය | 16 | 0.29 |
| 19 | කෑගල්ල | 32 | 0.76 |
| 20 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා | 09 | 1.17 |
| 21 | මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කරුවන් පුහුණු කිරීමේ පුහුණු වැඩමුළු සඳහා | 04 | 2.15 |
| **එකතුව** | | **275** | **9.50** |



සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහනට අදාළව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වැටියවෙල ශ්‍රී බෝධිරාජාරාමය විහාරස්ථානයේ පැවති මා පිය වන්දනා වැඩසටහන



සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහනට අදාළව දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කහනාවිට ශ්‍රී විජයාරාම විහාරස්ථානයේ පැවති ළමා අපචාර හා කාන්තා හිංසනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන



මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ පුහුණු කරුවන් පුහුණු කිරීමේ දෙවන වැඩමුළුව - ජාතික කලා නිකේතනය, කුණ්ඩසාලේ



මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධ පුහුණු කරුවන් පුහුණු කිරීමේ තෙවන වැඩමුළුව - පණ්ඩුලගම උතුරුමැද පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය (ප්‍රායෝගික ක්‍රියාකාරකම්)

### 2.1.6 බෞද්ධ විහාරස්ථාන සඳහා සූර්යයබල විදුලිය ලබාදීමේ ඉන්දීය මූල්‍ය ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර බෞද්ධ සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව ඉන්දීය මූල්‍ය ප්‍රදාන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ විහාරස්ථානයන්හි විදුලි පරිභෝජනය වෙනුවෙන් සහන සැලසීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සූර්යයබල විදුලි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර විහාරස්ථානය සඳහා විදුලිබලය නොමිලයේ ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමට දෙරට එකඟතාවයකට එළඹෙන ලදි. භූමිය මත සවිකරනු ලබන මෙගාවොට් 10ක පැනල පද්ධතියක් මගින් ජනනය වන සූර්යය බල විදුලිය ජාතික විදුලිබල සැපයුමට එක්කර එමගින් විහාරස්ථානවල විදුලි අවශ්‍යතාවන් සඳහා සහන ලබාදීමට නියමිතය.

ඒ අනුව මේ වනවිට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අක්කර 47 ක භූමියක් තෝරාගෙන ඇති අතර මෙහි උපදේශන ආයතනය වන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදුකරගෙන යනු ලබයි. මේ යටතේ 2024 වර්ෂය සඳහා රු.මි. 1075 ක මුදලක් වෙන්කරනු ලැබුවද ඉඩම් නිෂ්කාශන කටයුතු ප්‍රමාද වීමත් ජාතික විදුලි පද්ධතියේ ධාරිතාවයන් පිළිබඳව මතු වූ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු 2024 වසර තුළ ආරම්භ කිරීමට ප්‍රමාද විය. එමෙන්ම මෙහි කටයුතු වෙනුවෙන් 2025 වසරේ ජනවාරි මස සිට අප්‍රේල් මස දක්වා රු.මි.282.25 පමණ වෙන්කර ඇත. ඒ අනුව යෝජිත ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර ඇත.

### 2.1.7 වෙනත්

#### 2.1.7.1 වීසා නිර්දේශ ලබා දීම

විදේශගත වන භික්ෂූන් වහන්සේලාට හා විදේශවල සිට මෙරටට වැඩම කර මෙහි රැඳී සිටින භික්ෂූන් වහන්සේලාට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදුවේ.

i. 2024 වර්ෂයේදී විදේශගත වන ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලා සඳහා වීසා නිර්දේශ ලිපි 1438 ක් නිකුත් කර ඇත.
ii. මෙරටට වැඩම කිරීමට නියමිත විදේශීය භික්ෂූන් වහන්සේලාට පැමිණීමේ වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි 217ක් හා මෙරටට වැඩම කර මෙහි රැඳී සිටින භික්ෂූන් වහන්සේලාගේ වාස වීසා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ ලිපි 570ක් නිකුත් කර ඇත.

#### 2.1.7.2 තීරුබදු සහන සඳහා නිර්දේශ ලබා දීම

සිද්ධස්ථාන වෙත ආනයනය කරනු ලබන පූජා භාණ්ඩ වෙනුවෙන් තීරු බදු සහන ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි ලබා දීම සිදුවේ. 2024 වර්ෂය තුළ ලබාදී ඇති නිර්දේශ සංඛ්‍යාව 09 කි.

#### 2.1.7.3 සහන මිලට දැව/වැලි ලබා ගැනීමට නිර්දේශ ලිපි ලබාදීම

අධිකරණය මගින් රාජසන්තක කරනු ලබන වැලි සහ දැව සහන මිලට සිද්ධස්ථානවල ඉදි කිරීම් කටයුතු සඳහා ලබා ගැනීමට අධිකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දීම සිදුවේ. 2024 වර්ෂය තුළ ලබා දී ඇති නිර්දේශ සංඛ්‍යාව 389 කි. (දැව- 62 , වැලි- 327)

**2.1.7.4 දඹදිව වන්දනා චාරිකා සංගම් ලියාපදිංචි කිරීම හා සංචාර වෙනුවෙන් වීසා ගාස්තු සහන ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම**

දඹදිව වන්දනා චාරිකා සංවිධාන මෙම අමාත්‍යාංශයෙන් ලියාපදිංචි කිරීම සිදුවේ. එකී ලියාපදිංචි සංවිධාන වෙත චාරිකා ගමන්වාර සඳහා වීසා සහන ලබා ගැනීමට නිර්දේශ ලිපි ලබාදීම සිදුවේ. 2024 වර්ෂයේදී වන්දනාකරුවන් 20,522ක් සඳහා දඹදිව සංචාර සඳහා ග්‍රාටිස් වීසා නිර්දේශ ලිපි නිකුත් කර ඇත.

**2.1.7.5. විශ්‍රාමශාලා නඩත්තුව හා සංවර්ධනය**

මෙම අමාත්‍යාංශය සතුව දේශීය හා විදේශීය වශයෙන් පහත සඳහන් විශ්‍රාමශාලා පවතී. ඒවායේ නඩත්තුව හා පාලනය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

- **නේපාලයේ පිහිටි දුටුගැමුණු විශ්‍රාම ශාලාව**

නේපාලයේ ලුම්බිණියෙහි රූපන්දෙහි යන ස්ථානයේ පිහිටා ඇත. නේපාලයේ ලුම්බිණි සංවර්ධන භාරය විසින් ශ්‍රී ලංකා රජය වෙත පිරිනමා ඇති භූමියක පිහිටා ඇති මෙම විශ්‍රාම ශාලාව නේපාලයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අධීක්ෂණය යටතේ මෙම අමාත්‍යාංශය මඟින් පාලනය වේ. එකවර 161 දෙනෙකුට පමණ නවාතැන් පහසුකම් ලබාගත හැකිය. සම්මන්ත්‍රණ ශාලාවක් හා විවෘත උත්සව ශාලාවකින් යුක්තය.




- **අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය**

එකවර තිස්දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි මෙම නිවාඩු නිකේතනය මිහින්තලා පාර, කුරුන්දන්කුලම, අනුරාධපුරය යන ස්ථානයේ පිහිටා ඇත.




### 2.1.8 ආගමික කටයුතු අංශය යටතේ ඉටුකළ කාර්යයන්

ආගමික සහජීවනය උදෙසා සියලු ආගම්වලට අයත් දෙපාර්තමේන්තු එක් අමාත්‍යාංශයක් යටතේ ස්ථාපිතකර පවත්වාගෙන යන අතර බෞද්ධ, හින්දු, මුස්ලිම් සහ ක්‍රිස්තියානි යන ආගමික කටයුතු දෙපාර්තමේන්තු මගින් සිදුවන සියලු ආගමික කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය සිදුකරනු ලබන්නේ ආගමික කටයුතු අංශය මගිනි.

ආගමික හා සමාජ සහජීවනය උදෙසා පහත සඳහන් කාර්යයන් මෙම අංශය මගින් ඉටුකරනු ලබයි.

- අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වල ආයතන නොවන අනෙකුත් සියලු රාජකාරි කටයුතු අධීක්ෂණය සහ මගපෙන්වීම.
- එම දෙපාර්තමේන්තු වල විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීමට අවශ්‍ය සහය ලබාදීම සහ ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදුකිරීම.
- සියලු ආගමික දෙපාර්තමේන්තු වලට අදාළ ඉඩම් හා ආගමික කටයුතුවලට සම්බන්ධ වෙනත් රාජකාරි ඉටුකිරීම.
- හින්දු ආගමික, මුස්ලිම් ආගමික හා ක්‍රිස්තියානි ආගමික කටයුතු යන දෙපාර්තමේන්තු තුනෙන් නිර්දේශ කර අප වෙත යොමුකරනු ලබන ඒ ඒ ආගම්වලට අදාළ පූජ්‍ය ප්‍රසාදීන් හා පුද්ගලයන් සඳහා පැමිණීමේ වීසා ලබා දීම හා වාස වීසා දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිෂ්කාෂණ ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කිරීම, එම අමාත්‍යාංශය විසින් දැනුවත් කරන වෙනත් විශේෂ කරුණු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම, ආගමන විගමන දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන සම්බන්ධීකරණය සහ දැනුවත් කිරීම.
- ආගමික චාරිකා සඳහා වීසා සහන වෙනුවෙන් නිර්දේශ ලබා දීම.
- විහාරස්ථාන, කෝවිල්, පල්ලි සහ දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කාර්යයන් වෙනුවෙන් ආධාර මුදල් ලබාදීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අදාළ දෙපාර්තමේන්තු වෙත යොමු කිරීම.
- සියලුම ආගමික ස්ථාන මුල්කරගනිමින් සමාජය තුළ පැන නගින නීතිමය හෝ සාමාජීය ප්‍රශ්න නිරාකරණය කරගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වී, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය උපදේශයන් හා නිර්දේශයන් ලබාදීම.
- මුස්ලිම් ආගමික ග්‍රන්ථ මෙරටට ආනයනය කිරීමේදී එම ග්‍රන්ථ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය ආරක්ෂක නිශ්කාෂණ, ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාගැනීම සහ එම තීරණ සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් පාර්ශව දැනුවත් කිරීම.
- ආගම් අතර අන්තර් සහයෝගය හා සහෝදරත්වය වර්ධනය වන පරිදි සහජීවන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- රාජසන්තක කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍යයන් ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් සහන මිලට ලබාදීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ආගමික කටයුතු උදෙසා දෙපාර්තමේන්තු වෙත විදේශයන්ගෙන් ලැබෙන පරිත්‍යාගයන් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වීම.

- සියලු ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම හා පවත්වාගෙන යාම, අනවසර ආගමික ස්ථාන ඉදිකිරීම පිළිබඳ කටයුතු ඉටුකිරීම සහ මෙම කටයුතුවලදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.

- සියලු ආගමික දෙපාර්තමේන්තුවලට අදාළව අන්තර්ජාතික කටයුතු, විදේශ අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා මහ කොමසාරිස් කාර්යාල මගින් කරනු ලබන ඉල්ලීම්, යෝජනා සම්බන්ධව කටයුතු කිරීම හා එම කටයුතු අධීක්ෂණය කිරීම.

## 2.2 ඉදිරි ඉලක්ක

**(වගු අංක 5 - 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්)**

| අනු අංකය | වැඩසටහන | 2025 පළමු මාස 4 ට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත මූල්‍ය ඉලක්ක (රු.මි.) | 2025 ඉදිරි දැක්මට අනුව භෞතික ඉලක්ක |
|---|---|---|---|
| 01. | ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම | 25.00 | • 2025 රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීමට නියමිත දිස්ත්‍රික්කයේ විහාරස්ථාන සංවර්ධනය සඳහා - රු.මි. 3.00<br>• ස්වාභාවික විපත් වලින් සිදුවූ ආපදා නිසා හානි වූ විහාරස්ථාන නගා සිටුවීම -රු.මි. 8.00<br>• අනෙකුත් දිස්ත්‍රික්කවල විහාරස්ථාන සංවර්ධනය - රු.මි. 14.00 |
| 02. | පුණ්‍යග්‍රාම /මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 2.5 | 2025 වර්ෂයේදී Clean Sri Lanka වැඩසටහනට සමගාමීව Clean mind - Clean family යන සංකල්පය යටතේ වැඩසටහන් දියත් කරනු ඇත |
| 03. | පූජාභූමි සංවර්ධනය | 6.25 | ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති පූජාභූමිවල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය රු.මි. 6.25 |
| 04. | අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | 0.2 | ඉදිකිරීම් නිම කිරීම |
| 05. | විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම - කැළණිය | 20.00 | කඩිනමින් ආදායම් උත්පාදන මට්ටමට පත් කිරීම |
| 06. | ආගමික සිද්ධස්ථාන සඳහා සූර්යබල පහසුකම් සැලසීම | 282.25 | භූමිය මත සවිකරනු ලබන පැනල පද්ධතියක් මගින් ජනනය වන සූර්යබල විදුලිය ජාතික විදුලිබල සැපයුමට එක්කර එමගින් විහාරස්ථානවල විදුලි අවශ්‍යතාවන් සඳහා සහන ලබාදීම. |

ඉහත පිටු අංක 01 සිට 19 දක්වා පිටුවලින් දක්වා ඇති තොරතුරු පරීක්ෂාකර බලා ඇති බවටත්, එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම
තනතුර
දිනය

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.
2025 / 02 / 25

**(වගු අංක 6 - 2025 පූර්ණ වර්ෂය සඳහා අයවැය සම්මත වීම මත ලද ප්‍රතිපාදන අනුව සංශෝධනය කරන ලද 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්)**

| අනු අංකය | වැඩසටහන | 2025 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත මූල්‍ය ඉලක්ක (රු.මි.) | 2025 ඉදිරි දැක්මට අනුව භෞතික ඉලක්ක |
|---|---|---|---|
| 01. | ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම | 100.89 | • 2025 රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීමට නියමිත දිස්ත්‍රික්කයේ විහාරස්ථාන සංවර්ධනය සඳහා - රු.මි. 10.00<br>• ස්වාභාවික විපත් වලින් සිදුවූ ආපදා නිසා හානි වූ විහාරස්ථාන නගා සිටුවීම -රු.මි. 25.89<br>• අනෙකුත් දිස්ත්‍රික්කවල විහාරස්ථාන සංවර්ධනය - රු.මි. 55.00<br>• රාමඤ්ඤ නිකායේ 74 වන ජාතික උපසම්පදා පුණ්‍ය මහෝත්සවයට සමගාමීව විහාරස්ථාන 3 ක් සංවර්ධනය - රු.මි. 10.00 |
| 02. | පුණ්‍යග්‍රාම /මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 10.00 | 2025 වර්ෂයේදී Clean Sri Lanka වැඩසටහනට සමගාමීව Clean mind - Clean family යන සංකල්පය යටතේ වැඩසටහන් දියත් කරනු ඇත |
| 03. | පූජාභූමි සංවර්ධනය | 25.00 | ගැසට් මගින් ප්‍රකාශයට පත්කර ඇති පූජාභූමිවල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය |
| 04. | අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | 52.00 | ඉදිකිරීම් නිම කිරීම |
| 05. | විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම - කැළණිය | 137.11 | ආදායම් උත්පාදන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම |
| 06. | ආගමික සිද්ධස්ථාන සඳහා සූර්යබල පහසුකම් සැලසීම | 1,130.00 | ඉන්දීය මූල්‍ය ප්‍රදාන යටතේ භූමිය මත සවිකරනු ලබන පැනල පද්ධතියක් මගින් ජනනය වන සූර්යය බල විදුලිය ජාතික විදුලිබල සැපයුමට එක්කර එමගින් විහාරස්ථානවල විදුලි අවශ්‍යතාවන් සඳහා සහන ලබාදීම |

ඉහත සඳහන් තොරතුරු පරීක්ෂාකර බලා ඇති බවටත්, එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම
තනතුර
දිනය

ප්‍රින්ස් සේනාධීර
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07

2025 - 06 - 16

## 3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | තත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 285,364,000 | 319,381,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 506,640 | 13,919,938 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 8,124,539 | 10,307,912 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **293,995,179** | **343,608,850** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **293,995,179** | **343,608,850** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | **289,080** | **28,123,276** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)** | | **293,706,099** | **315,485,574** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 131,642,600 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 121,473,310 | 111,859,519 | ඒසීඒ-2(ii) |
| 122,950,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 86,189,860 | 94,410,824 | ඒසීඒ-2(ii) |
| 750,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 292,224 | 443,136 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **255,342,600** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **207,955,394** | **206,713,479** | |
| | **මූලධන වියදම්** | | | | |
| 105,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 81,373,852 | 108,376,657 | ඒසීඒ-2(ii) |
| 39,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 5,648,083 | 72,207,794 | ඒසීඒ-2(ii) |
| 1,215,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 138,402,626 | 129,648,659 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 468,062 | 533,764 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| **1,360,500,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **225,892,622** | **310,766,875** | |
| | තැන්පතු ගෙවීම් | | 737,574 | 2,042,144 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 10,070,398 | 6,752,190 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **10,807,972** | **8,794,334** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **444,655,988** | **526,274,688** | |
| **1,615,842,600** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(150,949,889)** | **(210,789,114)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | **(151,355,497)** | (210,789,114) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **405,608** | - | ඒසීඒ-3 |
| | | | **(150,949,889)** | **(210,789,114)** | |

**3.2** **2024 දෙසැම්බර් 31 දිනට** **ඒසීඒ-පී**

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තතය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,018,643,742 | 1,014,798,116 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 21,063,078 | 19,229,113 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **1,039,706,820** | **1,034,027,229** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (14,230,210) | (15,889,501) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,018,643,742 | 1,014,798,116 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 34,887,680 | 35,118,614 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 405,608 | - |
| **මුළු වගකීම්** | | **1,039,706,820** | **1,034,027,229** |

පිටු අංක 21 සිට 22 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 24 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2025-02-27

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

ප්‍රධාන මූල්‍ය නිලධාරී
නම :
තනතුර :
දිනය : 2025/02/24

ප්‍රධාන ගණකාධිකාරී
නම :
තනතුර :
දිනය : 2025/02/24

ජේ.බී.බී. රත්නායක
ප්‍රධාන ගණකාධිකාරී
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අංක 135 ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07.

## 3.3 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ඒසීඒ-සී**

| | සතය | |
|---|---|---|
| | **2024** රු. | **2023** රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 9,324,852 | 10,677,881 |
| අග්‍රිම ලැබීම් | 285,364,000 | 319,381,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 6,540,488 | 7,250,047 |
| තැන්පතු ලැබීම් | 506,640 | 13,919,938 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **301,735,980** | **351,228,866** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 202,234,078 | 198,251,700 |
| සහනාධාර සහ මාරුකිරීම් | 292,224 | 443,136 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,019,892 | 1,019,168 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 289,080 | 28,123,276 |
| අත්තිකාරම් ගෙවීම් | 8,082,274 | 6,187,225 |
| තැන්පතු ගෙවීම් | 737,574 | 2,042,144 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **213,655,122** | **236,066,649** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **88,080,858** | **115,162,218** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 87,675,250 | 115,162,218 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **87,675,250** | **115,162,218** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(87,675,250)** | **(115,162,218)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **405,608** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **405,608** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | (5) | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම් (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | 117,000,000 | 14,642,600 | - | 131,642,600 | 121,473,310 | - | - | - | - | - | 121,473,310 |
| ගමන් වියදම් | 7,000,000 | - | - | 7,000,000 | 2,646,723 | - | - | - | - | - | 2,646,723 |
| සැපයීම් | 31,350,000 | - | (1,200,000) | 30,150,000 | 24,621,653 | - | - | - | - | - | 24,621,653<br>- |
| නඩත්තු වියදම් | 15,650,000 | - | (800,000) | 14,850,000 | 12,287,133 | - | - | - | - | - | 12,287,133 |
| සේවා | 37,950,000 | - | 2,000,000 | 39,950,000 | 35,690,446 | 31,000,000 | - | - | 31,000,000 | 10,943,905 | 46,634,351<br>- |
| මාරුකිරීම් | 750,000 | - | - | 750,000 | 292,224 | - | - | - | - | - | 292,224<br>- |
| පොලී ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | - | -<br>- |
| වෙනත් පුනරාවර්තන වියදම් | - | - | - | - | - | - | - | - | - | - | -<br>- |
| මුළු එකතුව | **302,400,000** | **14,642,600** | **-** | **317,042,600** | **272,549,667** | **62,000,000** | **-** | **-** | **62,000,000** | **21,887,811** | **294,437,478** |

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ ප්‍රතිපාදන | | |
| | (1) | (2) | (3) | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7) | (8) | (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| මූලධන වියදම් | | | | | | | | | | | - |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 105,500,000 | - | - | 105,500,000 | 81,373,852 | - | - | - | - | - | 81,373,852 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 39,000,000 | - | - | 39,000,000 | 5,648,083 | - | - | - | - | - | 5,648,083 |
| ප්‍රාග්ධන මාරුකිරීම් | - | - | - | - | - | 1,215,500,000 | - | - | 1,215,500,000 | 138,402,626 | 138,402,626 |
| මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | - | - | - | - | - | - | - | - | - | - |
| හැකියා වර්ධනය | 500,000 | - | - | 500,000 | 468,062 | - | - | - | - | - | 468,062 |
| වෙනත් මූලධන වියදම් | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුළු එකතුව | **184,500,000** | **-** | **-** | **184,500,000** | **93,606,141** | **2,431,000,000** | **-** | **-** | **2,431,000,000** | **276,805,252** | **370,411,393** |
| මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව | **486,900,000** | **14,642,600** | **-** | **501,542,600** | **366,155,807** | **2,493,000,000** | **-** | **-** | **2,493,000,000** | **298,693,063** | **664,848,870** |

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| නැත. | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 240,700 | 255,343 | 207,955 | 81% |
| ප්‍රාග්ධන | 1,360,500 | 1,360,500 | 225,893 | 17% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | ආගමික කටයුතු නංවාලීම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු වියදම | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැය විෂයය | | **101-2-6-1409-(8)** | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | ප්‍රතිපාදන වෙන්කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| | **24,200,000** | | | | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | 200,000.00 | | | | | | | 200,000.00 | | | | | | **200,000.00** | 100.00 |
| 2 | ගම්පහ | 256 | 680,000.00 | | | | | | 111,500.00 | 200,000.00 | | | | | 28,500.00 | **340,000.00** | 50.00 |
| 3 | කළුතර | 257 | 1,500,000.00 | | | | | | 327,500.00 | 380,000.00 | 85,000.00 | 200,000.00 | | | 500,000.00 | **1,492,500.00** | 99.50 |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | 88,461.30 | | | | | | | 42,071.82 | | | | | | **42,071.82** | 47.56 |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | 200,000.00 | | | | | | | | | | | | | - | 0.00 |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | ආගමික කටයුතු නංවාලීම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු වියදම | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැය විෂයය | | **101-2-6-1409-(8)** | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | ප්‍රතිපාදන වෙන්කිරීම් | | | | | | හර කිරීම් | | | | | | | | |
| | **24,200,000** | | | | | | | | | | | | | | | | |
| 26 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201 | - | | | | | | | | | | | | | - | |
| 27 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 211 | 898,127.50 | | | | | | | | | 67,618.72 | 898,127.50 | | | **965,746.22** | 107.53 |
| 28 | රේගු දෙපාර්තමේන්තුව | 247 | - | | | | | | | | | | | | | - | |
| 29 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 112 | 1,616,034.87 | 168,830.61 | | 29,467.20 | 39,835.20 | (12,580.40) | 476,046.79 | 877,734.89 | | | | | | **1,579,334.29** | 97.73 |
| 30 | ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය | 224 | - | | | | | | | | | | | | | - | |
| 31 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය | 223 | - | | | | | | | | | | | | | - | |
| 32 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 320 | - | | | | | | | | | | | | | - | |
| 33 | විදුලිබල බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය | | - | | | | | | | | | | | | | - | |
| 34 | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය | 222 | - | | | | | | | | | | | | | - | |
| 35 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 | - | | | | | | | | | | | | | - | |
| | **මුළු එකතුව** | | **5,182,623.67** | **168,830.61** | **-** | **29,467.20** | **39,835.20** | **(12,580.40)** | **915,046.79** | **1,699,806.71** | **85,000.00** | **267,618.72** | **898,127.50** | **-** | **528,500.00** | **4,619,652.33** | 89.14 |
| | | **101** | | - | 228,000.00 | 52,585.00 | 12,556.38 | - | 717,440.00 | 188,062.50 | - | 95,000.00 | - | - | 112,700.00 | **1,406,343.88** | |
| | **මුළු වියදම** | | | **168,830.61** | **228,000.00** | **82,052.20** | **52,391.58** | **(12,580.40)** | **1,632,486.79** | **1,887,869.21** | **85,000.00** | **362,618.72** | **898,127.50** | **-** | **641,200.00** | **6,025,996.21** | **25%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | පූජා භූමි සංවර්ධනය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු වියදම | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත ප්‍රතිපාදනය | | **101-2-6-1-2205** | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | **25,000,000** | | ප්‍රතිපාදන වෙන් කිරීම් | | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | 2,750,000.00 | | | | | | | | | | | | 2,742,961.60 | **2,742,961.60** | 99.74 |
| 2 | ගම්පහ | 256 | 3,000,000.00 | | | | | | | | 473,436.91 | 2,526,563.09 | | | | **3,000,000.00** | 100.00 |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | 1,500,000.00 | | | | | | | | | 1,455,000.00 | | | 37,046.48 | **1,492,046.48** | 99.47 |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | 5,000,000.00 | | | | | | | | | | 432,492.00 | | 4,567,116.00 | **4,999,608.00** | 99.99 |
| 9 | හම්බන්තොට | 263 | 250,000.00 | | | | | | | | | | | 243,281.34 | 6,600.00 | **249,881.34** | 99.95 |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | 6,000,000.00 | | | | | | | 1,500,000.00 | 1,410,000.00 | | | | 3,086,950.00 | **5,996,950.00** | 99.95 |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | 3,000,000.00 | | | | | | | | | | | | 2,970,000.00 | **2,970,000.00** | 99.00 |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | 1,426,805.24 | | | | | | | | | | | 1,383,117.01 | 43,688.23 | **1,426,805.24** | 100.00 |
| 25 | කෑගල්ල | 279 | 2,000,000.00 | | | | | | | | 21,587.60 | 1,945,200.00 | | | 32,388.20 | **1,999,175.80** | 99.96 |
| 26 | ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය | 112 | - | | | | | | | | | | | | | - | |
| 27 | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය | 222 | - | | | | | | | | | | | | | - | |
| 28 | ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය | 224 | - | | | | | | | | | | | | | - | |
| 29 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය | 223 | - | | | | | | | | | | | | | - | |
| 30 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 311 | | | | | | | | | | | | | | - | |
| 31 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 207 | - | | | | | | | | | | | | | - | |
| 32 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 320 | - | | | | | | | | | | | | | - | |
| 33 | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | | - | | | | | | | | | | | | | | |
| එකතුව | | | **24,926,805.24** | **-** | **-** | **-** | **-** | **-** | **-** | **1,500,000.00** | **1,905,024.51** | **5,926,763.09** | **432,492.00** | **1,626,398.35** | **13,486,750.51** | **24,877,428.46** | 99.80 |
| | | **101** | | | | | | | | | | | | | | - | |
| | **මුළු වියදම** | | | **-** | **-** | **-** | **-** | **-** | **-** | **1,500,000.00** | **1,905,024.51** | **5,926,763.09** | **432,492.00** | **1,626,398.35** | **13,486,750.51** | **24,877,428.46** | **100%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම. | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු වියදම | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත ප්‍රතිපාදනය | | 101-2-6-8-2205 | | | | | | | | | | | | | | |
| | 100,500,000 | | ප්‍රතිපාදන වෙන් කිරීම් | | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | 3,166,000.00 | | | | | 98,988.12 | | | | 258,220.88 | 476,190.48 | 993,901.77 | 1,286,660.25 | 3,113,961.50 | 98.36 |
| 2 | ගම්පහ | 256 | 3,100,000.00 | | | | | | | 998,966.09 | 400,000.00 | | | 1,455,416.65 | 229,112.50 | 3,083,495.24 | 99.47 |
| 3 | කළුතර | 257 | 14,725,000.00 | | | | | | | | | 2,450,000.00 | 3,836,914.88 | 3,153,085.12 | 5,139,532.30 | 14,579,532.30 | 99.01 |
| 4 | මහනුවර | 258 | 5,277,000.00 | | | | | | | | 635,000.00 | 485,000.00 | 1,261,000.00 | | 2,836,479.74 | 5,217,479.74 | 98.87 |
| 5 | මාතලේ | 259 | 14,250,000.00 | | | | | 508,135.00 | 4,287,112.81 | 7,385,590.17 | 255,305.11 | 1,160,968.51 | 481,734.80 | | 62,924.16 | 14,141,770.56 | 99.24 |
| 6 | නුවරඑළිය | 260 | 1,800,000.00 | | | | | | | | 776,000.00 | | | 485,000.00 | 507,560.00 | 1,768,560.00 | 98.25 |
| 7 | ගාල්ල | 261 | 9,507,523.50 | | | | | 500,000.00 | 200,000.00 | 388,000.00 | 531,260.39 | 1,455,000.00 | 627,302.00 | 1,029,191.36 | 4,542,080.91 | 9,272,834.66 | 97.53 |
| 8 | මාතර | 262 | 4,395,000.00 | | | | | | | | | 499,913.07 | 1,025,115.73 | 1,068,341.81 | 1,830,221.56 | 4,423,592.17 | 100.65 |
| 9 | හම්බන්තොට | 263 | 2,000,000.00 | | | | | | | | 485,000.00 | | 485,436.89 | 14,563.11 | 1,014,839.42 | 1,999,839.42 | 99.99 |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 12 | මන්නාරම | 265 | 500,000.00 | | | | | | | 500,000.00 | | | | | | 500,000.00 | 100.00 |
| 13 | වවුනියාව | 266 | 500,000.00 | | | | | | 500,000.00 | | | | | | | 500,000.00 | 100.00 |
| 14 | මුලතිව් | 267 | 500,000.00 | | | | | | | 490,196.00 | | | | | | 490,196.00 | 98.04 |
| 15 | මඩකලපුව | 269 | 3,500,000.00 | | | | | | | 485,000.00 | 500,000.00 | 750,000.00 | 30,000.00 | 485,000.00 | 1,235,000.00 | 3,485,000.00 | 99.57 |
| 16 | අම්පාර | 270 | 2,500,000.00 | | | | | | | 100,000.00 | 975,684.20 | 884,931.52 | 489,838.00 | 1,079.00 | 3,076.00 | 2,454,608.72 | 98.18 |
| 17 | ත්‍රිකුණාමලය | 271 | 1,500,000.00 | | | | | | | 264,126.13 | | 220,873.87 | | | 1,015,000.00 | 1,500,000.00 | 100.00 |
| 18 | කුරුණෑගල | 272 | 7,073,000.00 | | | | | | | 510,897.00 | | 485,000.00 | 529,535.60 | 475,000.00 | 5,052,852.79 | 7,053,285.39 | 99.72 |
| 19 | පුත්තලම | 273 | 1,000,000.00 | | | | | | | | | | | 986,356.50 | 4,995.00 | 991,351.50 | 99.14 |
| 20 | අනුරාධපුරය | 274 | 4,800,000.00 | | | | | | | | | 485,000.00 | 986,500.00 | 943,500.00 | 2,335,979.00 | 4,750,979.00 | 98.98 |
| 21 | පොළොන්නරුව | 275 | 2,000,000.00 | | | | | | | | | | 500,000.00 | | 1,499,865.02 | 1,999,865.02 | 99.99 |
| 22 | බදුල්ල | 276 | 3,050,000.00 | | | | | | | | 291,000.00 | | 250,000.00 | | 2,471,496.29 | 3,012,496.29 | 98.77 |
| 23 | මොණරාගල | 277 | 5,461,386.00 | | | | | | | | | 61,385.70 | 1,856,706.44 | 2,467,982.07 | 1,046,155.32 | 5,432,229.53 | 99.47 |
| 24 | රත්නපුර | 278 | 4,000,000.00 | | | | | | | | | | 488,271.98 | 469,144.53 | 2,998,357.60 | 3,955,774.11 | 98.89 |
| 25 | කෑගල්ල | 279 | 5,828,000.00 | | | | | | | 42,000.00 | 82,566.64 | 485,000.00 | 1,090,360.77 | 970,116.60 | 2,963,476.25 | 5,633,520.26 | 96.66 |
| 26 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | | - | | | | | | | | | | | | | - | |
| 27 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 222 | - | | | | | | | | | | | | | - | |
| 28 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 224 | - | | | | | | | | | | | | | - | |
| 29 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201 | - | | | | | | | | | | | | | - | |
| එකතුව | | | **100,432,909.50** | **-** | **-** | **-** | **-** | **1,107,123.12** | **4,987,112.81** | **11,164,775.39** | **4,931,816.34** | **9,681,293.55** | **14,414,907.57** | **14,997,678.52** | **38,075,664.11** | **99,360,371.41** | 98.93 |
| | | **101** | | | | | | | | | | | | | | - | |
| | මුළු වියදම | | | **-** | **-** | **-** | **-** | **1,107,123.12** | **4,987,112.81** | **11,164,775.39** | **4,931,816.34** | **9,681,293.55** | **14,414,907.57** | **14,997,678.52** | **38,075,664.11** | **99,360,371.41** | **99%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | පුණ්‍යග්‍රාම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත ප්‍රතිපාදනය | | **101-2-6-9-2205** | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | **10,000,000** | | ප්‍රතිපාදන වෙන් කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | **-** | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | 67,500.00 | **67,500.00** | |
| 3 | කළුතර | 257 | 191,850.00 | | | | | | | | 23,500.00 | | | 34,000.00 | 133,350.00 | **190,850.00** | 99.48 |
| 4 | මහනුවර | 258 | 611,990.00 | | | | | | | 19,500.00 | | | 10,000.00 | 151,940.00 | 762,240.00 | **943,680.00** | 154.20 |
| 5 | මාතලේ | 259 | 681,700.00 | | | | | | | 254,020.40 | 5,400.00 | | 1,404.60 | 17,800.00 | 283,900.00 | **562,525.00** | 82.52 |
| 6 | නුවරඑළිය | 260 | 148,500.00 | | | | | | | | | | | 9,000.00 | 147,000.00 | **156,000.00** | 105.05 |
| 7 | ගාල්ල | 261 | 407,800.00 | | | | | | | | | | 36,500.00 | 32,000.00 | 339,300.00 | **407,800.00** | 100.00 |
| 8 | මාතර | 262 | 454,200.00 | | | | | | | | | | | 151,500.00 | 356,710.00 | **508,210.00** | 111.89 |
| 9 | හම්බන්තොට | 263 | 326,640.00 | | | | | | | | | | | 19,800.00 | 306,660.00 | **326,460.00** | 99.94 |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | 35,100.00 | | **35,100.00** | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | **-** | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | **-** | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | **-** | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | **-** | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | **-** | |
| 16 | අම්පාර | 270 | 164,440.00 | | | | | | | | | | | | 212,285.00 | **212,285.00** | 129.10 |
| 17 | ත්‍රිකුණාමලය | 271 | 151,200.00 | | | | | | | | | | 37,690.00 | 22,000.00 | 61,505.00 | **121,195.00** | 80.16 |
| 18 | කුරුණෑගල | 272 | 784,900.00 | | | | | | | | | 65,000.00 | 80,000.00 | 182,310.00 | 494,680.00 | **821,990.00** | 104.73 |
| 19 | පුත්තලම | 273 | 372,660.00 | | | | | | | 31,000.00 | 77,360.00 | | 18,300.00 | 198,125.00 | 85,124.00 | **409,909.00** | 110.00 |
| 20 | අනුරාධපුරය | 274 | 457,000.00 | | | | | | | 200,000.00 | 50,000.00 | | | 123,500.00 | 69,650.00 | **443,150.00** | 96.97 |
| 21 | පොළොන්නරුව | 275 | 110,000.00 | | | | | | | | | | | | 112,000.00 | **112,000.00** | 101.82 |
| 22 | බදුල්ල | 276 | 362,000.00 | | | | | | | | 20,000.00 | 19,960.00 | 105,200.00 | 100,100.00 | 161,750.00 | **407,010.00** | 112.43 |
| 23 | මොණරාගල | 277 | 375,110.00 | | | | | | | 109,500.00 | | | 71,660.00 | 63,300.00 | 165,358.00 | **409,818.00** | 109.25 |
| 24 | රත්නපුර | 278 | 294,450.00 | | | | | | | | | | 146,220.00 | 50,000.00 | 90,496.48 | **286,716.48** | 97.37 |
| 25 | කෑගල්ල | 279 | 757,140.00 | | | | | | | | | 53,000.00 | 62,000.00 | 83,400.00 | 594,720.00 | **793,120.00** | 104.75 |
| 26 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 211 | - | | | | | | | | | | | | | **-** | |
| 27 | විදුලිබල මණ්ඩලය | 119 | - | | | | | | | | | | | | | **-** | |
| 28 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 203 | 72,000.00 | | | | | | | 32,000.00 | | | 40,000.00 | | | **72,000.00** | 100.00 |
| එකතුව | | | **6,723,580.00** | - | - | - | - | - | - | **646,020.40** | **176,260.00** | **137,960.00** | **608,974.60** | **1,273,875.00** | **4,444,228.48** | **7,287,318.48** | 108.38 |
| | | **101** | | | | | | | | **105,750.00** | **77,250.00** | | **93,450.00** | | **1,286,729.00** | **1,563,179.00** | |
| | මුළු වියදම | | | - | - | - | - | - | - | **751,770.40** | **253,510.00** | **137,960.00** | **702,424.60** | **1,273,875.00** | **5,730,957.48** | **8,850,497.48** | **89%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | ලිපි ශීර්ෂ / විසිටිං කාඩ් මුද්‍රණය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **101-1-1-0-1201** | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | ප්‍රතිපාදන වෙන්කිරීම් | | | | | | | | | | | | | | |
| | **1,000,000.00** | | | හර කිරීම් | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | | - | |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | - | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | - | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |
| 26 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 211 | 3,304.00 | | | | | | | 3,304.00 | | | | | | **3,304.00** | 100% |
| එකතුව | | | **3,304.00** | - | - | - | - | - | - | **3,304.00** | - | - | - | - | - | **3,304.00** | **100%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | මෘදුකාංග සංවර්ධනය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **101-1-2-0-2106** | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | ප්‍රතිපාදන වෙන්කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| | **35,000,000.00** | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | | - | |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | - | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | - | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |
| 26 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 201 | 200,000.00 | | | | | | | | | | | | 92,276.83 | **92,276.83** | 46% |
| 27 | මුස්ලිම් කටයුතු දෙපාර්තමේන්තුව | 202 | 1,600,000.00 | | | | | | | | | | | | 1,600,000.00 | **1,600,000.00** | 100% |
| එකතුව | | | **1,800,000.00** | - | - | - | - | - | - | - | - | - | - | - | **1,692,276.83** | **1,692,276.83** | 94% |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | වෙනත් දීමනා | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **101-1-2-0-1003** | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | | | | | | | | | | | | | | | |
| | **45,752,100.00** | | ප්‍රතිපාදන වෙන්කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | | - | |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | - | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | - | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |
| 26 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 306 | | | 20,650.00 | | 13,600.00 | 243,000.00 | 45,400.00 | 19,700.00 | 50,050.00 | 132,750.00 | 33,500.00 | 68,050.00 | 51,150.00 | **677,850.00** | |
| එකතුව | | | **-** | **-** | **20,650.00** | **-** | **13,600.00** | **243,000.00** | **45,400.00** | **19,700.00** | **50,050.00** | **132,750.00** | **33,500.00** | **68,050.00** | **51,150.00** | **677,850.00** | |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | වෙනත් දීමනා | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **101-1-1-0-1003** | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | | | | | | | | | | | | | | | |
| | **4,890,500.00** | | ප්‍රතිපාදන වෙන්කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | | - | |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | - | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | - | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |
| 26 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 306 | | | | | | | | | | | 2,375.00 | | | **2,375.00** | |
| එකතුව | | | - | - | - | - | - | - | - | - | - | - | **2,375.00** | - | - | **2,375.00** | |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 101-1-2-0-1201 | | | | | | | | | | | | | | |
| | අනුමත ප්‍රතිපාදනය | | | | | | | | | | | | | | | | |
| | **6,000,000.00** | | ප්‍රතිපාදන වෙන්කිරීම් | හර කිරීම් | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | - | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | - | | | | | | | | | | | | | - | |
| 3 | කළුතර | 257 | - | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | - | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | - | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | - | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | - | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | - | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | - | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | - | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | - | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | - | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | - | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | - | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | - | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | - | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | - | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | - | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | - | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | - | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | - | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | - | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | - | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | - | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | - | | | | | | | | | | | | | - | |
| 26 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 211 | 93,234.00 | | | | 5,344.00 | | 51,900.00 | - | | 35,990.00 | | | 5,900.00 | **99,134.00** | 106% |
| එකතුව | | | **93,234.00** | **-** | **-** | **-** | **5,344.00** | **-** | **51,900.00** | **-** | **-** | **35,990.00** | **-** | **-** | **5,900.00** | **99,134.00** | **106%** |

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | කටුවපිටිය ශාන්ත සෙබස්තියන් පල්ලියේ දහම් පාසල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **101-2-6-21-2205** | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
| | **5,000,000** | | **ප්‍රතිපාදන වෙන්කිරීම්** | | | | | | | | | | | | | | |
| 1 | කොළඹ | 255 | | | | | | | | | | | | | | - | |
| 2 | ගම්පහ | 256 | 5,000,000.00 | | | | | | | | | | | | 4,999,976.59 | **4,999,976.59** | 100% |
| 3 | කළුතර | 257 | | | | | | | | | | | | | | - | |
| 4 | මහනුවර | 258 | | | | | | | | | | | | | | - | |
| 5 | මාතලේ | 259 | | | | | | | | | | | | | | - | |
| 6 | නුවරඑළිය | 260 | | | | | | | | | | | | | | - | |
| 7 | ගාල්ල | 261 | | | | | | | | | | | | | | - | |
| 8 | මාතර | 262 | | | | | | | | | | | | | | - | |
| 9 | හම්බන්තොට | 263 | | | | | | | | | | | | | | - | |
| 10 | යාපනය | 264 | | | | | | | | | | | | | | - | |
| 11 | මන්නාරම | 265 | | | | | | | | | | | | | | - | |
| 12 | වවුනියාව | 266 | | | | | | | | | | | | | | - | |
| 13 | මුලතිව් | 267 | | | | | | | | | | | | | | - | |
| 14 | කිලිනොච්චිය | 268 | | | | | | | | | | | | | | - | |
| 15 | මඩකලපුව | 269 | | | | | | | | | | | | | | - | |
| 16 | අම්පාර | 270 | | | | | | | | | | | | | | - | |
| 17 | ත්‍රිකුණාමලය | 271 | | | | | | | | | | | | | | - | |
| 18 | කුරුණෑගල | 272 | | | | | | | | | | | | | | - | |
| 19 | පුත්තලම | 273 | | | | | | | | | | | | | | - | |
| 20 | අනුරාධපුරය | 274 | | | | | | | | | | | | | | - | |
| 21 | පොළොන්නරුව | 275 | | | | | | | | | | | | | | - | |
| 22 | බදුල්ල | 276 | | | | | | | | | | | | | | - | |
| 23 | මොණරාගල | 277 | | | | | | | | | | | | | | - | |
| 24 | රත්නපුර | 278 | | | | | | | | | | | | | | - | |
| 25 | කෑගල්ල | 279 | | | | | | | | | | | | | | - | |
| 26 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 211 | | | | | | | | | | | | | | - | |
| 27 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 112 | | | | | | | | | | | | | | - | |
| 28 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 309 | | | | | | | | | | | | | | - | |
| 29 | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 123 | - | | | | | | | | | | | | | - | |
| එකතුව | | | **5,000,000.00** | | | | **-** | | | **-** | **-** | **-** | **-** | **-** | **4,999,976.59** | **4,999,976.59** | **100%** |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. **000**

| වත්කම් කේතය | කේත විස්තරය | **2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම් කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 378,500 | 378,500 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 288,051 | 288,051 | - | 100% |
| 9153 | ඉඩම් | 352,000 | 352,000 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 92,520 | 92,520 | - | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | - | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඒඒ/සී/එමඑබී/2/2024/30    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 ජූලි 04 දින

ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 101 - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම්ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත.  මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති  රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය සතුව පැවති වාහන 06ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර එදිනට අමාත්‍යාංශය සතුව නොපැවැති රු.12,300,000ක වටිනාකමකින් යුතු වාහන 03ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණි.

### 1.6.2 ශුද්ධ වත්කම්/ස්කන්ධය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් වටිනාකම රු.(21,339,070) ක් විය යුතු වුවද රු.(22,977,221) ක් වශයෙන් රු.1,638,151ක් අඩුවෙන් සඳහන් කර තිබුණු අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි රු.1,638,152ක අග්‍රිම ශේෂයක් පැවතුණද එම වටිනාකමට අදාළව මුදල් ශේෂයක් දක්වා නොතිබුණි.

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) නිවාඩු ලේඛනය | XII පරිච්ඡේදයේ 1.7 උප වගන්තිය | පවත්වා නොතිබුණි. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2 | අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබූ වාහන 02 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | 1.6.1 |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් රු.427,033ක අග්‍රිම ශේෂයක් මහා භාණ්ඩාගාරය වෙත මුදලින් පියවා තිබුණද, තවදුරටත් රු.1,638,152ක නොපියවූ අග්‍රිම ශේෂයක් පැවතුණි.

### 3.2 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරන ලද එකතුව රු.8,151,912 ක් වූ ප්‍රතිපාදනවලින් රු.5,352,809 ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 65 සිට සියයට 83 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ආ) මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.10,000,000කින් රු.9,692,719 ක වැය කිරීමකින් පසු ඉතිරිය රු.307,281ක් වූ අතර, මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබූ රු.2,255,577 ක සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.1,100,000ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.600,000ක් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයයකට මාරු කර තිබූ අතර ඉතිරි ප්‍රතිපාදිත මුදල ද අදාල අරමුණ වෙනුවෙන් වැය කර නොතිබුණි.

(ඈ) මූලධන වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් මාරු කරන ලද එකතුව රු.41,541,657 ක් වූ ප්‍රතිපාදනවලින් රු.26,771,010 ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 55 සිට සියයට 69 දක්වා පරාසයක පැවතුණි.

(ඉ) මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොමැති මූලධන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින්ද රු.5,037,326 ක ප්‍රතිපාදන ලබා ගෙන වර්ෂය අවසානයේ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඊ) පුනරාවර්තන වැය විෂයයන් හතළිහක් (40) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.167,060,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.95,495,612ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 97 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් අටක් (08)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.160,700,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.137,405,940ක් ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 30 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඈ) පුනරාවර්තන වැය විෂයයන් දහයක් (10) ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.7,140,000ක් හා මූලධන වැය විෂයයන් තුන (03)ක් සඳහා ප්‍රතිපාදිත, එකතුව රු.1,002,200ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

## 3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) අමාත්‍යාංශයට අයත් මූලධන වැය විෂයයන් දෙකක් සඳහා වෙනත් දෙපාර්තමේන්තු දෙකක් (වැය ශීර්ෂ අංක 258 හා 265) මගින් එකතුව රු.84,560 ක් වූ බැරකම් පහක් සිගාස් වැඩසටහනෙහි අමාත්‍යාංශයේ බැඳීම් බැරකම් ලේඛනයට ඇතුළත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 211(i) සහ මු.රෙ.447 ප්‍රකාරව සියලුම බැරකම් ඒවා සිදු වූ වහාම බැරකම් ලේඛනයේ සටහන් කළ යුතු වුවත්, 2024 වර්ෂයේදී අමාත්‍යාංශයේ ගෙවීම් වවුචර් 26කට අදාළව ගෙවන ලද එකතුව රු.3,541,342 ක් 2025 වර්ෂයේ මුල් මාස 03 තුලදී ගෙවීම් කර තිබුණද බැඳීම් බැරකම් ලේඛනයෙහි බැරකම් ලෙස ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

## 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 22.4 උප වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩලය විසින් ලබා ගන්නා වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර 96 වැනි පොදු ආකෘති පත්‍රයේ ලියා මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ නිලධාරීන් හා සේවකයින් 14 දෙනෙකු විසින් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වුවද, අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.6 තැන්පතු

(අ) අමාත්‍යාංශයේ පොදු තැන්පතු ගිණුම් 03කට අදාළව එකතුව රු.56,304,096 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) හා (3) හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මු.රෙ 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙළ කල මාසික සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 101 යටතේ කාර්යයන් තුනක් සඳහා වෙන වෙනම පොදු තැන්පත් ගිණුම් තුනක් පවත්වා ගෙන ගොස් තිබුණද සංස්කෘතික අංශය හා ජාතික උරුම අංශය විසින් ද එම කාර්යයන් සඳහාම වෙන් වෙන් වශයෙන් පොදු තැන්පත් ගිණුම් පවත්වා ගෙන ගොස් තිබුණි. මෙලෙස එක් අමාත්‍යාංශයක අංශ වෙනුවෙන් පොදු තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාමට අදාළ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම පොදු තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව විගණනයට ගැටළු සහගත විය.

## 3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

2019 දෙසැම්බර් 31 දිනැති අංක 09/2019 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා 209 අග්‍රිම ගිණුම් අංකයද ගිණුම් අංක 7040101 දරන ලංකා බැංකුවේ නිල බැංකු ගිණුම් අංකය පමණක් හඳුන්වා දී තිබියදී ඊට අමතරව අමාත්‍යාංශය විසින් ගිණුම් අංක 7040782 සහ ගිණුම් අංක 7040115 දරන බැංකු ගිණුම් දෙකකට ප්‍රධාන ගිණුමෙන් වරින් වර මුදල් මාරු කර තිබුණි. එම බැංකු ගිණුම් පවත්වාගෙන යාම සඳහා වන විධිමත් අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශය සඳහා වන නිල බැංකු ගිණුමෙන් වෙනත් බැකු ගිණුම් සඳහා මුදල් මාරු කිරීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ විගණනයට සහතික විය නොහැකිය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරිම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි විසර්ජන පනත යටතේ වැය ශීර්ෂයෙන් අනුමත වී ඇති සියළුම අමාත්‍යාංශ විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. ඒ අනුව 101 වැය ශීර්ෂය යටතේ ඇති බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා එක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් හා එක් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, බුද්ධශාසන අංශය, සංස්කෘතික අංශය හා උරුම අංශය සඳහා වෙන් වෙන් වශයෙන් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් 03ක් හා ක්‍රියාකාරී සැලසුම 03ක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර සකස් කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.

(ඇ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව 101-2-5-44-1409 වැය විෂයය යටතේ කලා සංස්කෘතික කඳවුරු දෙකක් පැවැත්වීම සඳහා රු.මිලියන 3.3 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, රු.මිලියන 0.64 ක් පමණක් වැය කරමින් මෙම සංස්කෘතික කඳවුරු දෙක පවත්වා තිබුණි. ඒ අනුව, මෙම වැඩසටහන් සඳහා නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය පිහිටුවීමේ අරමුණු වන සාම්ප්‍රදායික අස්පර්ශනීය හා පාරම්පරික උරුමයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය, එම උරුමයන් මතු පරපුර වෙත දායාද කිරීමට අවශ්‍ය නිර්මාණශීලී පියවර ගැනීම, උරුමයන්හි මූලයන් ශක්තිමත් කිරීම හා ඒවායේ නියැලි ශිල්පීන්ට අභිමානයක් ලබා දීම සහ අස්පර්ශනීය උරුමයන් පිළිබඳ ලොව දැනුවත් කිරීම යන අරමුණු ලඟා කර ගැනීමට ප්‍රමාණවත් වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය කිරීමට අදාළව ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම, සාම්ප්‍රදායික උඩරට ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ග්‍රාමීය වැව් හා වාරිමාර්ග පද්ධති නඟා සිටුවීම, සාම්ප්‍රදායික පැරණි කර්මාන්ත සංවර්ධනය හා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම හා එම කර්මාන්ත සංරක්ෂණය හා ප්‍රවර්ධනය වැනි අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම ආයතනය ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා ප්‍රමාණවත් වැඩසටහන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව 101-2-5-44-1409 වැය විෂයය යටතේ ආදිවාසි ගම්මානවල සමාජ සජීවීකරණ වැඩසටහන් සිදු කිරීම හා ජාතික උරුමයන් සඳහා පර්යේෂණ හා සංරක්ෂණ කමිටුව පවත්වාගෙන යාම සඳහා පිළිවෙලින් රු.මිලියන 1.7 ක හා රු.මිලියන 0.3 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද, වර්ෂය තුළ එම කාර්යයන් සිදුකර නොතිබුණි.

(ආ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය මගින් 2024 වර්ෂය තුළ මූර්ති නිර්මාණය පිළිබඳ නව පාඨමාලාවක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, එම කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) 101-2-5-037-2104 වැය විෂයය යටතේ අමරදේව අසපුව ඉදි කිරීම සඳහා රු.මිලියන 38.69 ක වාර්ෂික ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද රු.මිලියන 17.351 ක කාර්යයන් පමණක් වර්ෂය තුලදී ඉටු කර තිබුණි. තවද, මෙම අසපුවේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණ ද එහි අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීම සඳහා 101-2-5-037-1509 වැය විෂයය යටතේ රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. එසේ වුවද, එහි කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන භාවිතයෙන් තොරව පැවතුණි.

(ඈ) අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන දහම් පාය ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය පැනල සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.14,200,000 ක් වෙන් කර ගෙන අදාළ ඉල්ලුම් පත්‍ර වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට රු.8,500ක් සහ පුවත්පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු.178,416ක් වශයෙන් රු.196,916ක් වැය කර තිබූ අතර ප්‍රතිපාදන වෙන් කර ගත් කාර්යය ඉටු කර නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තු හා ආයතන වල මෘදුකාංග සංවර්ධනය සඳහා රු.35,000,000ක මූලධන ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද එම කාර්යය ඉටු කිරීම සඳහා රු.1,600,000 ක් මුස්ලිම්, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණි. ඊට අමතරව, මෘදුකාංග සංවර්ධනයට අදාල නොවන ත්‍රිපිටකයේ මහාවග්ග පාලි ග්‍රන්ථය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම හා මුද්‍රණය කිරීම වෙනුවෙන් මේ සඳහා වෙන් කර ගත් මුදලින් රු.184,797ක් වැය කර තිබුණු අතර ප්‍රතිපාදිත මුදල අපේක්ෂිත කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.

(ඊ) අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනා ගෙන තිබූ ආගමික කටයුතු නගා සිටුවීම සඳහා රු.24,200,000ක ශුද්ධ ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද අදාල කාර්යයන්ගෙන් සියයට 25 ක් පමණක් ඉටු කර තිබුණි.

### 4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රයේ හා අපේ ගම පරිශ්‍රයේ සංවර්ධන කටයුතු සඳහා 101-2-5-43-2001 හා 101-2-5-43-2509 යන වැය විෂයයන් සඳහා රු.මිලියන 23 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, වර්ෂය තුළ එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබූ අතර සමස්ත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10.5 ක්, එනම් සියයට 46 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ආ) වාර්ෂික අයවැය මගින් 101-2-5-43-2001 හා 10-2-5-43-2509 වැය විෂයයන් යටතේ අපේ ගම හා ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සඳහා රු.මිලියන 23 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේ ගම හා ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය සඳහා පිළිවෙලින් රු.මිලියන17.29 ක් හා 5.5 ක් වශයෙන් මුළු ප්‍රතිපාදන රු.මිලියන 22.79 ක් සඳහා පමණක් වියදම් ඇස්තමේන්තු සකස් කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 0.21 ක ප්‍රතිපාදන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා 101-02-05-31-2509 වැය විෂයය යටතේ රු.මිලියන 27.58 ක් වෙන් කර තිබුණු අතර එයින් රු.මිලියන 7.746ක් ඉතිරි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නේවාසික නාට්‍ය හා රංග කලා පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කර නොතිබුණු අතර ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ස්වයං ලිඛිත චරිතාපදාන සංග්‍රහය, මානව ග්‍රන්ථ කියවීම සහ සමාජ සමානාත්මතා ආකල්ප ප්‍රවර්ධන ළමා කතා පොත් නිර්මාණය යන වැඩසටහන් සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) ඉහත කාර්යයන්වල ඇතුලත් කර තිබූ අස්පර්ශනීය උරුමයන් ආරක්ෂිත කිරීම යටතේ අස්පර්ශ උරුමයන් පිළිබඳ සුරක්ෂණ සැලැස්මක් සකස් කර නොතිබුණි. තවද, ආන්තික ප්‍රජාවන් බලගැන්වීම සඳහා පවත්වන සමාජ සංස්කෘතික වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ සංක්‍රාන්තික ප්‍රජාව මහ සමාජයේ පුරවැසියන් ලෙස පිළිගැනීමට ලක් කිරීම යන වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 101-2-05-2103 වැය විෂයය යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 12.26 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබූ අතර සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සහ මධ්‍යස්ථාන 218 ක් සඳහා ඇඹිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුලදී රු.මිලියන 9.69 ක ප්‍රතිපාදන පමණක් වැය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 2.55 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණ ද සමාලෝචිත වර්ෂය තුලදී සංස්කෘතික මධ්‍යස්ථාන 50 ක් සඳහා පමණක් ඇඹිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන තිබුණි.

(ඊ) 101-2-05-09-1409-099 වැය විෂයය යටතේ රු.මිලියන 19 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණු අතර විවිධ උත්සව සඳහා සංස්කෘතික අංග ඉදිරිපත් කිරීමට අමතරව විවිධ සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද එයින් රු.මිලියන 15.312 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව සැලසුම් කල පරිදි ප්‍රවර්ධන වැඩසටහන් නොපැවැත්වීම නිසා රු.මිලියන 3.688 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 4.2 වත්කම් කළමනාකරණය

(අ) 2022 වර්ෂයේදී අපහරණය කළ යුතු බවට නිර්දේශ කර තිබූ අමාත්‍යාංශයේ කාර් රථයක අපහරණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

(ආ) 2023 වසරේදී බුද්ධශාසන අංශයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌණතා ලෙස හඳුනාගෙන තිබූ වත්කම් අයිතම 70ක් සහ අතිරික්තතා ලෙස හඳුනා ගෙන තිබූ වත්කම් අයිතම 108 ක් සම්බන්ධයෙන් මු.රෙ 757 (2) (අ) අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව, වාහන දැනට පරිහරණය කරනු ලබන ආයතනයට අයිතිය ලබා ගැනීමට නොහැකි අවස්ථාවලදී වාහනයේ ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශයට අයත් එකතු වටිනාකම රු.49,000,000 ක් වූ වාහන දෙකක් සම්බන්ධයෙන් ප්‍රවර්තන වර්ෂයේදීත් එලෙස කටයුතු කර නොතිබුණි.

## 4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 883 ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය තනතුරුවලට අදාළ සියලුම අලුත් පත්වීම් සහ ඇප තබා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් වන මාරු කිරීම්, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහ කිරීම්, මිය යෑම් යනාදිය සම්බන්ධයෙන් සෑම මසක් පාසාම විගණකාධිපතිවරයාට වාර්තා කළ යුතු වුව ද අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 12 වන අධිකාරියට අනුකූලව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 20 දෙනෙකුගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 පාඩු හා හානි

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම 1හි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුළ අලාභ අයකරගැනීම/ කපා හැරීම/ අත්හැරීම් යටතේ රථ වාහන අනතුරුවලට අදාළ අයකර ගැනීම් රු.474,398 ක් ලෙස දක්වා තිබුණද, හානි පාඩු ලේඛණය අනුව අයකර ගත් මුදල රු.375,257 ක් විය. ඒ අනුව වර්ෂය තුළ අයකර ගැනීම් රු.99,141 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) අනතුරකට ලක්ව තිබූ මෝටර් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා රු.474,398 ක මුදලක් වැය වී රක්ෂණාවරණයෙන් රු.375,257ක මුදලක් ආවරණය කර ගෙන තිබුණද ඉතිරි මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු නොකිරීමෙන් රු.99,141ක අලාභයක් රජයට සිදු වී තිබුණි.

## 4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වෙත ඉදිරිපත් කර තිබූ එක් විගණන විමසුමක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.6 කළමනාකරණ දුර්වලතා

(අ) 2023 වර්ෂයේදී අමාත්‍යාංශයේ සිදුවූ A4 ප්‍රමාණයේ ඡායා පිටපත් සොරකමට අදාළව රජයට සිදුව තිබූ රු.312,439ක් වූ අලාභය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන වලට

පටහැනිව වසර 1-3 අතර කාලයක් පවතින විශ්‍රාම ගිය අමාත්‍යාංශයේ නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු.200,763 ක එකතු ණය ශේෂයක්ද වසර 10-20 අතර පවතින එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.128,372 ක ණය ශේෂයක්ද පැවතුණි.

(ඇ) වසර 1-3 අතර කාලයක් ගතවූ සේවය අතහැර ගොස් තිබුණු අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.266,990 ක එකතු ණය ශේෂයක්ද වසර 10-20 අතර කාලයක් ගතවූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.96,130ක එකතු ණය ශේෂයක්ද සම්බන්ධයෙන් 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 1-2 කාලයක් පවතින වැඩ තහනම් කල අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.354,530 ක ණය ශේෂයක් හා වසර 5-10 ත් අතර පවතින එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.110,650ක ණය ශේෂයක්ද සම්බන්ධයෙන් 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08/ පොදු (I) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) වසර 1-3 අතර කාලයක් පවතින මියගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.263,003ක ණය ශේෂය සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඊ) විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.24,080 ණය ශේෂයක්ද, වැඩ තහනම් කල නිලධාරීන් 6 දෙනෙකුගෙන් අය විය යුතු රු.148,205 ක එකතු ණය ශේෂයක් ද වශයෙන් එකතුව රු.172,285 ක ණය ශේෂයක් සම්බන්ධයෙන් 2024 මැයි 29 දිනැති අංක 1 /2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(උ) 2024 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ ශේෂය සමග සැසඳීමේ ප්‍රකාශයේ, කේවල ශේෂ වර්ගීකරණ ශේෂය සහ පාලන ගිණුමේ ශේෂය අතර රු 1,426,148 ක වෙනසක් සඳහන් කර තිබුණු අතර එම වෙනසට හේතු වශයෙන් 2004 සිට 2010 දක්වා වූ හඳුනා නොගත් ශේෂ වෙනස්කම් 04ක් සහ 2008 දෙසැම්බර් මස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් කර ඇති වැරදි හර කිරීමක් දක්වා තිබුණද, ඒවා නිවැරදි කිරීමට 2024 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඌ) 2021 පෙබරවාරි 16 දිනැති අමප/21/0191/305/007 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපේ ගම් ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය නිශ්චිත කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද විගණිත දින දක්වා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

(එ) 2021 නොවැම්බර් 02 දිනැති අමප/21/1883/305/007-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පවතින වත්කම් ඵලදායි අයුරින් උපයෝජනය කිරීම හා මහජනතාව ආකර්ෂණය වන අයුරින් අපේ ගම පරිශ්‍රය ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබුණද, විගණිත දින වන විටත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර අපේ ගම් ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය ආරම්භක අවධියේ පැවති ආදායම් මාර්ග මත පමණක් පදනම් වී මෙහෙයුම් කටයුතු සිදු කර තිබුණි.

(ඒ) 2024 සැප්තැම්බර් 10 දිනැති අමප/24/1687/620/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇති ඉඩම්වල විභවතාව සලකා ආයෝජන ව්‍යාපෘතියක් ලෙස හෝ රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස මූල්‍ය ස්වාධීනත්වයකින් යුක්තව පවත්වාගෙන යාම සඳහා පියවර ගත යුතු වුවද, විගණිත දින වන විටත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඔ) උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දැනට උත්පාදනය කරනු ලබන ආදායමින් වියදම් ආවරණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ අතර උපයන ආදායම රජයේ ආදායමට බැර කර, ජනකලා කේන්ද්‍රය සඳහා වෙන් කර ඇති වැය විෂයය යටතේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම හරහා වියදම් පියවා ගැනීමට කටයුතු කරමින් විගණිත දින දක්වා අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.

(ඕ) 2024 දෙසැම්බර් 31 දිනට අපේ ගම පරිශ්‍රය තුළ ඉදිකරන ලද වෙළඳ කුටි 45 න් වෙළඳ කුටි 18 ක් අලෙවිකරුවන්ට ගිවිසුම්ගත වීමකින් තොරව රු.1,000 ක මාසික කුලියක් මත ලබා දී තිබූ අතර එම වෙළෙඳ කුටි භාවිතා කිරීමේදී සිදුවන හානි සම්බන්ධයෙන් ආරක්ෂිත තැන්පතුවක්ද ලබා ගෙන නොතිබීමෙන් රාජ්‍ය දේපළ වලට යම් හානියක් සිදුවුවහොත් එය අයකර ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි. එමෙන්ම මාසිකව අදාළ කුලී මුදල් නිසි පරිදි අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් ද සකස් කර නොතිබුණු අතර ඉහළ වෙළඳ වටිනාකමක් සහිත භූමියක පිහිටි මෙම වෙළඳ කුටි සඳහා මාසික කුලිය ලෙස රු.1,000 ක් නියම කර තිබීම ද ගැටළු සහගත විය.

(ක) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 උපවගන්තිය අනුව රාජ්‍ය ආයතන විසින් මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15ක උපරිමයකට යටත්ව සංශෝධනය කළ යුතු වුවද අපේගම සම්බන්ධයෙන් එසේ සංශෝධන සිදු කර නොතිබුණි.

(ග) අංක 20 සිට 28 දක්වා වන වෙළඳ කුටි 9 ක් ශිල්ප සභාවට ලබා දී තිබුණද, ඒ සඳහා ගිවිසුම්ගත වීමක් සිදු කර නොතිබුණු අතර අදාළ වෙළඳ කුටි ලබා දීම සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ච) විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී, යම් මසක බිල්පත ලැබී දින 15 ක් තුල ගෙවීම් කළ යුතු බවත්, ප්‍රමාද වන ගෙවීම් සඳහා 16 වන දින සිට සියයට 1.2 ක මාසික පොලී මුදලක් ඊළඟ බිල්පත් වටිනාකම මත අය කරනු බවත් බිල්පතෙහි සඳහන්ව තිබුණද, අමාත්‍යාංශය විසින් මාසික විදුලි බිල්පත් සඳහා දින 15 ක් ඇතුළත ගෙවීම් නොකිරීම හේතුවෙන් 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු.40,014 ක ප්‍රමාද පොලී මුදලක් ගෙවා තිබුණි.

(ජ) අපේ ගම පරිශ්‍රයේ පිහිටි පුරාණ ගම කොටස නරඹන්නන් සඳහා විවෘත කර පවත්වාගෙන යාමට හැකි වන පරිදි සකස් කල යුතු වුවද, එම කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර මේ හේතුවෙන් ටිකට් පත් අලෙවි කිරීමෙන් උපයාගත හැකිව තිබූ ආදායම වසර කිහිපයක සිට අහිමි වී තිබුණි.

(ට) පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජූනි 17 දිනැති

අංක 09/2009 (I) හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සේවා ස්ථානයක සිටින සේවක සංඛ්‍යාව ගැන නොසලකා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර සෑම කාර්යාලයකම භාවිතා කළ යුතු වුවද කාර්යාලයීය නිලධාරීන්ගේ හා ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් අපේ ගම පරිශ්‍රයේ සවිකර නොතිබුණු අතර මේ හේතුවෙන් අත්සන් ලේඛනයේ සටහන් කර ඇති වේලාවන්හි නිරවද්‍යතාව සනාථ නොවීය.

## 5. යහපාලනය

### 5.1 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ විධිවිධාන හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් රැස්වීම් දෙකක් ද තෙවන කාර්තු රැස්වීම 2025 ජනවාරි 09 දින ද පවත්වා තිබූ අතර සිව්වන කාර්තු රැස්වීම පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

අමාත්‍යාංශයට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර විගණනය විසින් ඉල්ලුම් කළද තොරතුරු ඉදිරිපත් නොකෙරුණු අතර අමාත්‍යාංශයේ 2024 වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1325 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1230 ක් වූයෙන් පුරප්පාඩු 95 ක් පැවතුණි. ඒ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10ක, තෘතීය මට්ටමේ තනතුරු 03ක, ද්විතීක මට්ටමේ තනතුරු 53ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 29ක පුරප්පාඩු පැවතුණි.

ආර්.එස්.කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ) වෙනුවට

## 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100-90 % | 75-89 % | 50-74 % |
| 1. පූජාභූමි වල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය | √ | - | - |
| 2. ග්‍රාමීය විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය | √ | - | - |
| 3. කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදි කිරීම් නිම කිරීමේ ප්‍රමාණය | √ | - | - |
| 4. අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රමාණය | √ | - | - |
| 5. සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ පුද්ගලයන් ඇති වීමේ ප්‍රමාණය | √ | - | - |
| 6. බෞද්ධ විහාරස්ථාන සඳහා ලබාදුන් සූර්යයබල විදුලි පද්ධති ප්‍රමාණය | - | - | √ |

# 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 (%) | 50-74 (%) | 75-100 (%) |
| 1. පූජාභූමිවල සංරක්ෂණය සහ සංවර්ධනය. | පූජාභූමිවල භෞතික/යටිතල පහසුකම් ඉහළ නැංවීම. | පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය | | | √ |
| 2. විහාරස්ථානයන්හි පවතින භෞතික අඩුපාඩු අවම කිරීම. | විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් ඉහළ නැංවීම. | විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය | | | √ |
| 3. අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම. | කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ දහම්පාසැල් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් නිම කිරීම. | දහම්පාසලේ භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය | | | √ |
| 4. අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම | පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් නිර්මාණය කිරීම. | ඉදිකිරීම් අවසන් කිරීමේ ප්‍රමාණය | | | √ |
| 5. සමාජීය, ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පූර්ණ පුද්ගලයින් බිහි කිරීම. | සමාජීය , ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බල ගැන්වූ පුද්ගලයන් බිහිකිරීම තුළින් යහපත් සමාජයක් බිහිකිරීම. | සමාජීය ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් බලගැන්වූ පුද්ගලයන් ඇති වීමේ ප්‍රමාණය | - | - | √ |
| 6. බෞද්ධ විහාරස්ථානයන්හි විදුලි අවශ්‍යතාවයන් සඳහා සහන සැපයීම. | විහාරස්ථාන සඳහා සූර්යබල විදුලි පද්ධති සවිකිරීම හරහා විදුලි අවශ්‍යතාවයන් සඳහා සහන සැපයීම. | සූර්යබල විදුලි පද්ධති සවිකරන ලද විහාරස්ථාන සංඛ්‍යාව | √ | - | - |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක අතරින් “තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම” යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම අමාත්‍යාංශය මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින් ළමා සමාජය ඵලදායී හා විනය ගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර දහම් පාසල් යටිතල පහසුකම් සැපයීමට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය සීමා සහිත වීමත්, ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදුවී තිබීමත්, ඉරිදා දින දරුවන් සඳහා වෙනත් උපකාරක පන්ති පැවැත්වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වලවීමත් ළමා සමාජය තුල දහම් දැනුම වර්ධනය කිරීමට පවතින බාධාවන් වේ.

ජනගහනයෙන් 72% ක් පමණ වන බෞද්ධ ජනතාව දිවයින පුරා විසිරී සිටියද දුෂ්කර ප්‍රදේශවල පිහිටි සමහර විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා නොසිටීම හෝ අල්ප වශයෙන් සිටීමද ජනතාවට ලබා දිය යුතු ශාසනික මෙහෙවර ලබා දීමට බාධාවක් වී ඇත.

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනද ඇතුළුව පුණ්‍යග්‍රාම වැඩසටහන තුලින් ජනතාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමට ක්‍රියා කළද සමාජ පරිහානියට බලපාන සාධකවල දැවැන්ත ව්‍යාප්තිය මත අරමුණු ජය ගැනීම දුෂ්කර වේ. එබැවින් සියළු ක්ෂේත්‍ර වල සංවර්ධනයක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය පමණක් ප්‍රමාණවත් නොවන අතර අනෙකුත් ආයතනවල සහායද ලැබීම අත්‍යාවශ්‍යව පවතී.

එසේ වුවද පවතින සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගනිමින් 2024 වර්ෂය තුළ නියමිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ අතර ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතිය ඉහල ප්‍රතිශතයක් ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවක මට්ටම (2024.12.31 දිනට) | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 19 | 14 | 05 |
| තෘතීක | 05 | 03 | 02 |
| ද්විතීයික | 112 | 93 | 19 |
| ප්‍රාථමික | 44 | 41 | 03 |

### 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

අදාළ නොවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධන

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.) | විදේශීය (රු.) | | |
| 1. | ධර්ම දේශනා | නිලධාරීන් 130 | පැය 2 | - | - | දේශීය | |
| 2. | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | නිලධාරීන් 18 | පැය 100 | - | - | දේශීය | |
| 3. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන "සුපිරිපන් නිලධාරීන්" | නිලධාරීන් 01 | දින 03 | - | - | දේශීය | නිලධාරීන් ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය |
| 4. | රාජ්‍ය අංශයේ මානව සම්පත් දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන | නිලධාරීන් 93 | පැය 30 | - | - | දේශීය | නිලධාරීන් ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම |
| 5. | පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම | නිලධාරීන් 02 | පැය 14 | 26.00 | - | දේශීය | |
| 6. | Capacity Building Programme for the officer of Sri Lanka Administrative Service (SLAS) grade1-Intake 2009/2010 | නිලධාරීන් 01 | දින 01 | - | - | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.) | විදේශීය (රු.) | | |
| 7. | Capacity Building Programme for the officer of Sri Lanka Administrative Service (SLAS) grade1-Intake 2009/2010 | නිලධාරීන් 01 | දින 45 | - | - | දේශීය | නිලධාරීන් ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය<br>නිලධාරීන් ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම |
| 8. | විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම | නිලධාරීන් 02 | දින 01 | 12.00 | - | දේශීය | |
| 9. | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම සඳහා පුහුණු වැඩමුළුව | නිලධාරීන් 02 | දින 01 | - | - | දේශීය | |
| 10. | විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව | නිලධාරීන් 02 | දින 02 | 13.00 | - | දේශීය | |
| 11. | ගබඩා කළමනාකරණය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ දෙදින වැඩමුළුව | නිලධාරීන් 03 | දින 02 | 39.00 | - | දේශීය | |
| 12. | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම | නිලධාරීන් 09 | දින 01 | - | - | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.) | විදේශීය (රු.) | | |
| 13. | නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහන | නිලධාරීන් 33 | දින 01 | 23.05 | - | දේශීය | නිලධාරීන්ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය<br>නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම |
| 14. | රාජකාරි ලිපි සම්පාදනය | නිලධාරීන් 130 | දින 01 | 61.20 | - | දේශීය | |
| 15. | රසවින්දනාත්මක වැඩසටහන | නිලධාරීන් 130 | පැය 3 | - | - | දේශීය | |
| 16. | සටහන් ලිපි හා වර්තා ලිපි ලිවීම පිළිබඳ වැඩමුළුව | නිලධාරීන් 130 | දින 01 | 73.82 | - | දේශීය | |
| 17. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 03 වන පන්තියේ III ශ්‍රේණියට 2019 වර්ෂයේදී බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා වන සේවාස්ථ පුහුණු පාඨමාලාව (online) | නිලධාරීන් 01 | දින 05 | - | - | දේශීය | |
| 18. | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධ වැඩමුළුව (online) | නිලධාරීන් 01 | දින01 | 25.00 | - | දේශීය | |

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.) | විදේශීය (රු.) | | |
| 19. | Higher national Diploma in Public Procurement and Contract Administration | නිලධාරින් 01 | මාස 14 | 138.00 | - | දේශීය | නිලධාරීන් ගේ විෂයය දැනුම / ආකල්ප වර්ධනය<br>නිලධාරීන් ගේ කාර්යක්ෂමතාවය ඉහළ යාම |
| 20. | පාර්ලිමේන්තුවට පැමිණෙන නිලධාරීන් / අමුත්තන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අවසර පත්‍ර ලබා ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව | නිලධාරින් 02 | දින01 | - | - | දේශීය | |
| 21. | Seminar on Friendship – city cultural exchange for Indian ocean Rim Countries - China | නිලධාරින් 01 | දින 15 | | | විදේශීය | |
| 22. | Training Course on Building Social Innovation Systems - Vietnam | නිලධාරින් 01 | දින 07 | | | විදේශීය | |
| 23. | Cultural Administrators Training Program - Korean | නිලධාරින් 01 | දින 07 | | | විදේශීය | |

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | √ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | √ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | √ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.9 | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | √ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | √ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට.වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | √ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | √ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | √ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | √ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | √ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | √ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | × | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | √ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | √ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | වර්ෂය තුළ රැස්වීම් 02 ක් පවත්වා ඇත. 2025 ජනවාරි මාසයේදී තුන්වන රැස්වීම පවත්වන ලදී. | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | √ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම. | √ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | √ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | √ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | √ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | √ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | √ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | √ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | √ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | √ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | √ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | √ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | √ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | √ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | √ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | √ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | √ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | √ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | √ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | √ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | √ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | √ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | √ | | |
| 15 | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා.වෙත ඉදිරිපත්කර තිබීම | අදාළ නොවේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | √ | | |
| 16.2 | කාර්යමණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | √ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම | √ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | √ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | √ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | √ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | √ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | √ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | √ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | √ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | √ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | √ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | √ | | |

# සංස්කෘතික කටයුතු අංශය

## පරිච්ඡේදය - 01 ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රෞඪ උරුමයන් සංරක්ෂණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පූර්ණ වගකීම දරමින්, සාහිත්‍ය හා කලාව පෝෂණය කරමින්, අනන්‍ය ශ්‍රී ලාංකීය ජාතියක් බිහි කිරීමේ උදාර කර්තව්‍ය ඉටු කිරීමට සංස්කෘතික කටයුතු අංශය බැඳී සිටී. මේ සඳහා සංස්කෘතික කටයුතු අංශය වශයෙන් අප, ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව, තිරසර සංවර්ධන වැඩසටහන පාදක කරගනිමින් යහ ගුණයෙන් පිරිපුන් වූ සංවේදී මිනිසුන්ගෙන් සපිරුණු තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක් වෙත පිය නැගීමට අවැසි කාර්යභාරය ඉටු කරමින් සිටී. ඒ අනුව 2024 වසර තුළ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ කාර්යයන් අතරින් සංස්කෘතික කටයුතු අංශයේ කාර්ය සාධනය මෙහි අන්තර්ගත වේ.

### 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

"තිරසාර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

**මෙහෙවර**

සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ස්ථානීය හා අස්ථානීය සංරක්ෂණය, සාහිත්‍ය, නර්තනය, සංගීතය, නාට්‍ය හා රංගකලාවන්, ස්පෘෂ්‍ය - අස්පෘෂ්‍ය උරුමය හා රාජ්‍ය ලේඛන සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලාංකීය සංස්කෘතිකාංග සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ප්‍රචාරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

**අරමුණු**

රටක සංස්කෘතිය, එම රටේ ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා හඳුන්වා දෙනු ලබන සියලු වැඩසටහන් වඩාත් ඵලදායී ලෙස සඵල කර ගැනීම සඳහා ඉවහල් වන ජනතා හැසිරීම මෙහෙය වන ප්‍රධාන මෙවලම ලෙස සලකා අරමුණු හඳුනාගෙන ඇත.

- රටේ පොදු ජාතික සංවර්ධන ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීමට හේතුවන ආකාරයෙන් ජනතාව ස්වයංව මෙහෙයවන සාධනීය සංස්කෘතික පරිසරයක් රට තුළ ගොඩනැගීම.

- ශ්‍රී ලාංකීය බහු ජාතිකත්වය පිළිගනිමින්, ඒ එක් එක් උප සංස්කෘතිවල අනන්‍යතාව ආරක්ෂා කරන අතරම සියලු උප සංස්කෘති එක්ව ගෙන ශ්‍රී ලාංකික වූ මහා සංස්කෘතියක් සහිත රටක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සහ විවිධ බලවේග හරහා හානියට පත්වන සාධනීය සංස්කෘතිකාංග, එවැනි හානිවලින් වළක්වා ගැනීම.

- සංස්කෘතික උරුමයන් සංරක්ෂණය, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම මඟින් රටේ ජනතාවගේ ජීවිතයේ සංස්කෘතිකමය හැඩ ගැස්ම සකස්කර ගැනීමට මං සැලසීම.

- සාධනීය සංස්කෘතිකාංග හඳුනා ගැනීමට හා ඒවා තම ජීවිතයට යාකර ගැනීමට ජනතාව පෙළඹවීම හා ඒ මඟින් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇති සංස්කෘතියක් ගොඩනැගීම.

- සංස්කෘතික පරිහානියට හේතුවන බාහිර අභ්‍යන්තර සාධක හඳුනාගැනීමේ හා ඒවා නිශේධනය කිරීමේ ස්වයං ශක්තිය ජනතාවට ලබා දීම.

- දේශාභිමානී චින්තනය පෙරටු කරගත් සංවර්ධන ඉලක්ක සපුරාලීමට සමත්, ස්වයං අභිප්‍රේරණිකවූත්, සාමූහිකවූත්, බලවේගයක් ලෙස සංස්කෘතික සමාජය තුළ මුල් බැස ගැනීමට සැලැස්වීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ජාතික සංස්කෘතිකයේ සියලුම අංගයන් අභිවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- විදේශීය රටවල් සමඟ සංස්කෘතික සබඳතා පවත්වාගෙන යාම.

- සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා වන අයුරින් සංස්කෘතික හා ජාතික උරුමයේ අභිමානය විදහා දක්වන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගීතාව ලබා දීම.

- ජාතීන් අතර සහයෝගය ඇති කිරීමෙහිලා සංස්කෘතිකමය දායකත්වය යොදවා ගැනීමේ ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනය සහ කලා ශිල්පීන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- නාට්‍ය, සංගීතය හා නර්තන ක්ෂේත්‍රයන්ගේ අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම.

- රජයේ සහ පෞද්ගලික අංශයේ අඛණ්ඩ සහයෝගය ලබා ගන්නා සාහිත්‍යය, සිනමාව, නාට්‍ය සහ අනෙකුත් කලා සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම.

- සෑම ප්‍රධාන නගරයකම පිහිටා ඇති කලා හා සංස්කෘතික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා සංස්කෘතික කලාප පිහිටුවීම.

- ලෝක සාහිත්‍යය සහ නාට්‍ය පිටපත් ජාතික භාෂාවලට පරිවර්තනය කිරීම දිරිමත් කිරීම

- රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය හා සංරක්ෂණය කිරීම.

- නවීන තාක්ෂණය හඳුන්වා දීම මඟින් ජාතික ලේඛනාගාර නවීකරණය කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම.

- බහුකාර්ය සංස්කෘතික මධ්‍යස්ථාන ජාලයක් හරහා බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා රංග ශාලාව ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යුහාත්මක සැලැස්මක් නිර්මාණය කිරීම.

- සමකාලීන නාට්‍ය කලාව පිළිබඳ පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ආයතනයක් පිහිටුවීම.

- සංස්කෘතික කටයුතු විෂයට සහ එම විෂය යටතේ අනුබද්ධිත දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට සහ ඊට අදාළව ක්‍රියාත්මක කළයුතු නීති හා අණපනත්වලට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම සහ ඇගයීම.

# 1.4 සංස්කෘතික කටයුතු අංශය - සංවිධාන සටහන - 2024



## 1.5 අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

### I. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

1877 වර්ෂයේ ස්ථාපනය කරන ලද ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින්, සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රදර්ශනය හා ප්‍රචාරණය කිරීමත්, සංස්කෘතික හා ස්වාභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම, අධ්‍යාපනය හා රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීමත් සිදු කරයි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- දිවයින පුරා පිහිටුවා ඇති ජාතික කෞතුකාගාර (10කි)
- මානව විද්‍යා අංශය
- මානව වංශ විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- සංරක්ෂණ අංශය
- පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

### II. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත්ව කළමනාකරණය සහ සංරක්ෂණය උදෙසා ජාතික ලේඛනාරක්ෂක නීතිය සහ ඊට අදාළ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ස්ථිර සංරක්ෂණය සඳහා රාජ්‍ය ලේඛන සහ අද්විතීය පෞද්ගලික ලේඛන ආබද්ධ කර ගැනීම, අදාළ නීති රීතිවලට අනුකූලව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය කිරීම, අදාළ නීතිමය තැන්පතුවට පුවත්පත් සහ ප්‍රකාශන උපචිත කරගැනීම මෙන්ම රාජ්‍ය පරිපාලන ක්‍රියාවලියේ දී සහ මහජන පර්යේෂණය සඳහා, තැන්පතු ලේඛනවලින් තොරතුරු සමුද්ධනය කිරීමට පහසුකම් සැලසීම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- රාජ්‍ය ලේඛන ආබද්ධ කරගැනීම් අංශය
- ප්‍රදර්ශන අංශය
- පොත් සහ පුවත්පත් ලියාපදිංචිය අංශය
- ලේඛන සංරක්ෂණය අංශය
- පුවත්පත් සූක්ෂම ඡායාගත කිරීමේ අංශය
- ලේඛනාගාර ගොඩනැගිල්ල පුළුල් කිරීමේ අංශය
- ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය අංශය
- පර්යේෂණ අංශය
- මහජන සම්බන්ධතා අංශය

## III. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකීය ජනතාව අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය වූ සංවේදී මිනිසුන් බවට පත් කිරීමේ ඒකායන අපේක්ෂාව සපුරා ගැනීම වස්, ශ්‍රී ලාංකික සංස්කෘතිය ගොඩනැගීමේ අරමුණින් යුතුව, ශ්‍රී ලාංකික අනන්‍යතාවයෙන් යුත් සාහිත්‍ය කලා හා සංස්කෘතික කටයුතු සංරක්ෂණය, ප්‍රවර්ධනය, ව්‍යාප්තිකරණය සඳහා වූ වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන

- ජාතික කලාභවන හා ජෝන් ද සිල්වා සමරු රඟහල
- මහාවංශ සම්පාදන කාර්යාලය
- ශබ්දකෝෂ කාර්යාලය
- විශ්වකෝෂ කාර්යාලය
- එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය පුහුණු පාසල
- වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරය හා සංස්කෘතික කේන්ද්‍රය
- ජාතික කලා නිකේතනය - මහනුවර කුන්ඩසාලේ
- උතුරු දකුණු මිතුරු සෙවණ - මිහින්තලේ
- රාජ්‍ය නැටුම් කණ්ඩායම හා රාජ්‍ය සංගීත කණ්ඩායම

මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන අනෙකුත් කටයුතු

- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය උත්සව/උළෙල සංවිධානය කිරීම හා කලාකරු සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- සංස්කෘතික, කලා හා සාහිත්‍ය කටයුතු ප්‍රවර්ධනය උදෙසා විශේෂ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 1.6 අමාත්‍යාංශ යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් -

### IV. ශ්‍රී ලංකා කලා මණ්ඩලය

කලා කටයුතු ප්‍රවර්ධනය, සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය අනුමණ්ඩල පත්කොට ඒවාට නායකත්වය සැපයීම හා මඟ පෙන්වීම, සාහිත්‍ය, නාට්‍ය, සංගීත, නර්තන හා චිත්‍ර අනුමණ්ඩලය මගින් දීප ව්‍යාප්තව කටයුතු සංවිධානය කිරීම, ජාතික මට්ටමේ ඇගයීම්වලට ශිල්පීන් ගෙන ඒම හා ඔවුන් ජාතික තලයට හඳුන්වාදීම මගින් නියමිත ක්ෂේත්‍රයන් තුළ ඉහළම තලයන්හි පිහිටුවීම, ලලිත කලාවන්හි තත්වය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවට ආවේණික කලා ශිල්ප කර්මාන්ත නගා සිටුවීම, කලා කටයුතු සඳහා සම්බන්ධිත වෙනත් දෙපාර්තමේන්තු, ආයතන, ස්වේච්ඡා සංවිධාන සමග සම්බන්ධවී කටයුතු කිරීම, සාරධර්මවලින් පිරි සමාජයක් බිහි කිරීම සඳහා සුදුසු සංස්කෘතික පරිසරයක් ගොඩනැගීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ.

### V. ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය

ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පළමු විධායක ජනාධිපති ජූනියස් රිචඩ් ජයවර්ධන ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව 1988 අංක 77 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම මධ්‍යස්ථානය පුස්තකාලයක්, කෞතුකාගාරයක්, ජනාධිපති ලේඛනාගාරයක් සහ ජපන් කෞතුකාගාරයකින් සමන්විත වේ. එහි කෞතුකාගාරය තුළ ජයවර්ධන මහතාගේ පෞද්ගලික පුස්තකාල එකතුව සහ ඔහුගේ දේශපාලන දිවියට අදාළ ලිපි ලේඛන මෙන්ම ජනාධිපති මහලේකම් කාර්යාලයේ පැවති සමහර ලිපි ලේඛන සහ වාර්තා ද ඔහුගේ ධූර කාලය තුළ ඔහුට ලැබුණු තෑගි භෝග ද තැන්පත් කර ඇත. මෙම මධ්‍යස්ථානය මහජනතාව සඳහා විවෘතව පවතින අතර විවිධ සමාජ සේවා කටයුතු රැසක් ද මේ මගින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබයි.

## VI. ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කරන ලද, 1971 අංක 47 දරන පනත මඟින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව මෙරට සිනමා කර්මාන්තයේ පරිපාලනය සහ නියාමනය සඳහා ඇති එකම රාජ්‍ය ආයතනය වේ. නව තාක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කරමින් තෘප්තිමත්, වගකීම් හඳුනාගත්, සුහදශීලී සේවයක් ගනුදෙනුකරුවන්ට ලබා දෙමින්, නිර්මානකරණයට අවශ්‍ය අධ්‍යාපනය, අනුබලය හා සුහසාධනය ලබා දෙමින් ගුණාත්මක සිනමා සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම ආයතනය කටයුතු කරයි. 1999.06.17 දිනැතිව එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශ ලේකම්, ඩික්සන් නිලවීර මහතා විසින් නිකුත් කරන ලද ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය මඟින් චිත්‍රපට බෙදා හැරීම මණ්ඩල 05ක් යටතේ ක්‍රියාත්මක වේ.

## VII. NATIONAL LIBRARY NLSL OF SRI LANKA ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ජනතාවගේ දැනුම වර්ධනය කිරීම රටක සංවර්ධන ක්‍රියාවලියේ අතිශයින් වැදගත් කාර්යයකි. සමාජයේ විවිධ ජන කොටස්වලට අවශ්‍ය දැනුම විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ලබාදීමට අවස්ථාව සලසාදීම රටක පුස්තකාල පද්ධතියෙහි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතිය සංවර්ධය කිරීමේ අරමුණ ඇතිව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවන ලද අතර 1998 අංක 51 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් එහි කටයුතු වඩාත් පුළුල් කෙරිණි.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම
- ජාතික මට්ටමේ පුස්තකාල සේවා හා සංවර්ධනය කටයුතු ක්‍රියාත්මක කිරීම.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය වන අතර එය දිවයිනේ අනෙකුත් පුස්තකාලවල මව් පුස්තකාලය ලෙස කටයුතු කරයි. එමෙන්ම ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධන කටයුතු යටතේ පුස්තකාල සඳහා උපදේශන සේවා සැපයීම, පුස්තකාල වැඩිදියුණු කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු පැවැත්වීම, පුස්තකාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රාදේශීය වශයෙන් ඩිජිටල් පුස්තකාල ආරම්භ කිරීම සඳහා සහයෝගය ලබාදීම, පොත්පත් සංරක්ෂණය සඳහා පුස්තකාල සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, පුස්තකාල නඟා සිටුවීම සඳහා පළාත් පුස්තකාල සේවා මණ්ඩල සමඟ කටයුතු කිරීම, පුස්තකාල සහයෝගීතා වැඩසටහන් සංවිධානය හා ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ආධාර කිරීම, ජාතික පුස්තකාලයේ තොරතුරු ඩිජිටල්කරණය කිරීම හා එම

තොරතුරු ඇසුරින් ජාතික ඩිජිටල් පුස්තකාලය පවත්වාගෙන යාම වැනි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරේ.

## VIII. සැලසිනෙ මීඩියා සොලූෂන්ස් (පෞද්.) සමාගම

රූපවාහිනී මාධ්‍ය ශ්‍රී ලංකාවේ ආරම්භ වීමත් සමඟ රජයේ ප්‍රචාරණ කටයුතු සිදුකර ගැනීම අරමුණු කර ගනිමින් රූපවාහිනී මාධ්‍ය සඳහා අවශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය කිරීමට 1982 පෙබරවාරි 02 වන දින පූර්ණ වශයෙන් රජයට අයත් ආයතනයක් ලෙස එවක ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යටතේ සැලසිනෙ ආයතනය ආරම්භ කර ඇත.

එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1380/15 දරන, 2005 පෙබරවාරි 16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව රජයට අයත් එකම "වෙළඳ දැන්වීම් ආයතනය" බවට පත් කරන ලදී.

මාධ්‍ය මෙහෙවර පුළුල්වීමත් සමඟ සැලසිනෙ ආයතනය වැඩසටහන් නිෂ්පාදනයෙන් ඔබ්බට ගොස් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ සියලුම දිශාවන් කරා යොමු විය. වර්තමානයේ සැලසිනෙ ආයතනය පෞද්ගලික ප්‍රචාරණ ආයතන හා තරඟ කරමින් සමස්ථ ප්‍රචාරණ ක්ෂේත්‍රයම ආවරණය කරමින් මුද්‍රණ, ඉසව් කළමනාකරණ, උපලේඛනගත කිරීම්, හා ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්/දැන්වීම් නිෂ්පාදනය නව මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ කටයුතු හා ඩිජිටල් අලෙවිකරණය සිදු කරයි. ඒ අනුව ආයතනය, ශ්‍රී ලංකා රාජ්‍ය යාන්ත්‍රණයෙහි සංවර්ධන වැඩසටහන් හා මෙහෙයුම්වල වර්ධනීය තත්ත්වයන් නිර්මාණාත්මක භාවිතයන් තුළින් පොදු ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම මූලික ඉලක්කය කොට, කටයුතු කරමින් පවතී.

සැලසිනෙ ආයතනය සන්නිවේදනයේ හා අලෙවිකරණයේ නව සහශ්‍රකය තුළ රාජ්‍ය වැඩසටහන්වල ශක්තිමත්, පුළුල් ප්‍රචාරණයන් පොදු ජනතාව වෙත නව මුහුණුවරකින් ලබා දෙමින්, ඉසව් කළමනාකරණය, වෙළඳ ප්‍රචාරණය, ඇතුළු අලෙවිකරණයේ හැකියාවෙන් සපිරි නවීන තාක්ෂණික උපකරණවලින් සමන්විත සන්නිවේදන ආයතනයක් බවට මේ වන විට පත්ව ඇත.

සැලසිනෙ රූපවාහිනී ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2023.06.20 දින සිට සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස "සැලසිනෙ මීඩියා සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී" ලෙස සංස්ථාපනය කොට ඇත.

## IX. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් ලෙස, දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියලුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත. එහිදී උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන දැක්ම අනුව විමර්ශනය කර ඇත. ඒ අනුව ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය මගින් මේවා සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂා කර බලා වර්ගීකරණයට ලක් කිරීම, වත්මන් ප්‍රධාන කාර්ය ලෙස දක්වනු ලැබේ.

### 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

2024 වසර තුළ දී සංස්කෘතික කටයුතු අංශය මගින් විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැත.

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන, සංස්කෘතික කටයුතු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටනකි. මේ යටතේ, දිවයින පුරා විසිරී සිටින දරු දැරියන්ගේ හා කලාකරුවන්ගේ කලා කුසලතා ඔප්නැංවීම සඳහා රංගකලා අධ්‍යයනාගාර, පුස්තකාල පහසුකම් සහ නවීන පහසුකම්වලින් යුත් රංග ශාලාවක් ස්ථාපනය කිරීම අරමුණු කරගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ''සංස්කෘතික මධ්‍යස්ථානයක්'' පිහිටුවීමට කටයුතු කර ඇත. මෙය සාම්ප්‍රදායික රංග කලාවන් සහ සම්භාව්‍ය සංස්කෘතික අංග සංරක්ෂණයකර, ඉන් පෝෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට හා මෙම සංස්කෘතිකාංග පොදු මහජනයා අතරට ගෙන යාමට දායක වන විධිමත් යාන්ත්‍රණයකි.

### සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ලබාදෙන මූලික සේවාවන්

#### පුහුණු පාඨමාලා පැවැත්වීම

දීපව්‍යාප්තව පිහිටා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන 221, අගයෙන් ඉහල කලා නිර්මාණ බිහිකිරීමට අවශ්‍ය අධ්‍යයනය හා පුහුණුව ලබාගතහැකි ආයතනික ව්‍යුහයක් බවට පත්කිරීම අරමුණුකර ගනිමින්, එම සංස්කෘතික මධ්‍යස්ථානවල, අංකුර කලාකරුවන් සඳහා නව දැනුමක් ලබා දෙන පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු සලසා ඇත. එහිදී ගායන, වාදන, නර්තන යනාදී කලා කුසලතාවයන් සපුරාගැනීමට අපේක්ෂා කරන්නන් සඳහා සහභාගී විය හැකි පරිදි ප්‍රමිතියෙන් යුතු වැඩසටහන් පැවැත්වේ. තවද, විශේෂයෙන් ජනශ්‍රැති පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා මේවායෙහි අවස්ථාව සලසා දී ඇති අතර, පහත පාඨමාලා ද සංවිධානය කර ඇත.

- උඩරට, පහතරට, සබරගමු, භරත, කථක් සහ ජන නැටුම් පාඨමාලාව
- පෙරදිග සහ අපරදිග සංගීතය පාඨමාලාව
- නාට්‍ය හා රංග කලා පාඨමාලාව
- චිත්‍ර, මූර්ති සහ කැටයම් කලා පාඨමාලාව
- ජ්‍යොතිෂ්‍ය පාඨමාලාව
- කායික හා මානසික සංවර්ධන පාඨමාලාව
- අත්කම් නිපැයුම්, බතික් නිර්මාණ පාඨමාලාව
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි, පාලි හා සංස්කෘත භාෂාවන් පිළිබඳ පාඨමාලාව
- අංගම්පොර ශිල්ප පාඨමාලාව
- මුස්ලිම් රබන් / ලී කෙළි නර්තන පාඨමාලාව
- ජනසන්නිවේදන පාඨමාලාව
- දේශීය හෙළ වෙදකම පාඨමාලාව
- චීන සාම්ප්‍රදායික සටන් කලා පාඨමාලාව
- රූපලාවන්‍ය පාඨමාලා

**පුස්තකාල සේවාවන් සැපයීම**

සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පිහිටුවා ඇති පුස්තකාල මගින් පාසල් ළමුන්ගේ සහ ජනතාවගේ කියවීමේ රුචිය ඉහළ නැංවීමේ සහ අධ්‍යාපනයට රුකුලක් වීමේ අදහසින් මෙම සේවාව ක්‍රියාත්මක කර ඇත. ඇතැම් මධ්‍යස්ථාන මගින් දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ග්‍රාමීය සමාජ සඳහා ජංගම පුස්තකාල සේවා ද ආරම්භ කර ඇත.

**සංස්කෘතික සේවාවන් සැපයීම**

ප්‍රාදේශීය ජනතාවගේ අවශ්‍යතාවය මත ආගමික/සංස්කෘතික උත්සව අවස්ථා සඳහා ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සංස්කෘතික සේවාවන් සැපයීම සිදු කරයි. මේ යටතේ ජය මංගල ගාථා කණ්ඩායම්, හේවිසි කණ්ඩායම්, මඟුල් බෙර කණ්ඩායම්, වෙස් නැටුම් කණ්ඩායම්, නර්තන කණ්ඩායම්, වීදි නාට්‍ය කණ්ඩායම් හා ගිහි පිරිත් කණ්ඩායම් ආදිය සපයනු ලබයි.

**ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික හා සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රාදේශීය වශයෙන් වසර පුරා විවිධ ආගමික/සංස්කෘතික/අධ්‍යාපනික වැඩසටහන් තම සංවර්ධන අරමුදලින් /ප්‍රදේශවාසීන්ගේ මූල්‍ය දායකත්වයෙන්/රජයේ දායකත්වයෙන් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

**සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික නර්තන සංචිතය පවත්වා ගැනීම**

සංස්කෘතික මධ්‍යස්ථානවල සෞන්දර්යය පාඨමාලා හදාරන සිසුන් අතුරින් ප්‍රතිභා පූර්ණ සිසු සිසුවියන්ගෙන් සමන්විත නර්තන සංචිතයක් පවත්වාගෙන යනු ලබයි. රාජ්‍ය/ජාතික උත්සව සඳහාත් විදේශීය සංස්කෘතික සංචාර සඳහාත් මෙම නර්තන සංචිතය දායකත්වය සපයනු ලබයි.

## 2.1 සංස්කෘතික කටයුතු අංශය මගින් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැය විෂය විස්තරය | 2024 ප්‍රතිපාදන රු.මි. | වියදම 2024.12.31 දිනට රු.මි. | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 1. | සංස්කෘතික මධ්‍යස්ථාන 101-02-05-09-1409 (112) | 60.00 | 51.37 | 86% | 93% |
| 2. | ගොඩනැගිලි හා ඉදිකිරීම් 101-02-05-2001 | 29.42 | 28.00 | 95% | 93% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ<br>101-02-05-2002 | 5.00 | 3.91 | 78% | 96% |
| 4. | සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ ලබාදීම<br>101-02-05-2102 | 17.75 | 12.73 | 72% | 96% |
| 5. | සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ලබාදීම.<br>101-02-05-2103 | 12.26 | 9.69 | 79% | 98% |
| 6. | සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් හා වැඩිදියුණුකිරීම<br>101-02-05-23-2104 | 37.00 | 30.71 | 83% | 93% |
| 7. | සංස්කෘතික මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම<br>101-02-05-2401 | 1.00 | 0.85 | 85% | 100% |
| **විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (පුනරාවර්තන) ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 8. | වෙනත්<br>101-02-05-09-1409(99) | 19.00 | 15.31 | 81% | 81% |
| 9. | විදේශ සංස්කෘතික සබඳතා වැඩසටහන<br>101-02-05-09-1409(113) | 6.00 | 2.19 | 37% | 37% |
| **විශේෂිත සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් (ප්‍රාග්ධන) ක්‍රියාත්මක කිරීම** | | | | | |
| 10. | ජාතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධන වැඩසටහන්<br>101-02-05-31-2509 | 27.58 | 19.83 | 72% | 83% |
| 11. | අමරදේව අසපුව ඉදිකිරීම<br>101-02-05-37-2104 | 38.69 | 17.35 | 45% | 93% |

## 2.2 සංස්කෘතික කටයුතු අංශය මගින් 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය විස්තරාත්මකව

### 2.2.1. සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම -

**1. සංස්කෘතික මධ්‍යස්ථාන**

**101-02-05-09-1409 (112)**

2024 වර්ෂයට අදාළව සම්පත්දාකයන් ලියාපදිංචි කර ඇති මධ්‍යස්ථානවල පාඨමාලා ආරම්භ කර සම්පත්දායකයින් සඳහා ගෙවීම් සිදුකර ඇත. එසේම පූර්ව ළමාවිය සංවර්ධන පාඨමාලා ආරම්භ කර ඇති මධ්‍යස්ථානවල සම්පත්දායකයින් සඳහා ගෙවීම් සිදු කිරීම හා 2024 වසරේ කුසලතා සංවර්ධන පාඨමාලා පවත්වන ලද සංස්කෘතික මධ්‍යස්ථාන 221 න් සංස්කෘතික මධ්‍යස්ථාන 212 ක කුසලතා සංවර්ධන වැඩසටහන් ද, ආරම්භ කර ඇත.

**2. ගොඩනැගිලි හා ඉදිකිරීම්.**

**101-02-05-2001**

2024 ක්‍රියාකාරී සැලැස්මට අනුව දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානවල සුළු අලුත්වැඩියා කටයුතු සහ වැඩිදියුණු කිරීම් සිදුකිරීම

| 19. | කේ.එම්.පී.කේ. කුලතුංග මිය (සැලසුම් - අධ්‍යක්ෂ) | ප්‍රසම්පාදන ඩිප්ලෝමා පාඨමාලාව | දෙසැම්බර් 30 | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය |
| 20. | අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරි | ධාරිතා සංවර්ධන වැඩසටහන | දෙසැම්බර් 28, 29 | SDFL ආයතනය |
| 21. | අමාත්‍යාංශ නිලධාරීන් | විශ්‍රාම වැටුප් පුහුණුව | දෙසැම්බර් 12 | සංස්කෘතික කටයුතු අංශ ශ්‍රවණාගාරය |

පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන් දැනුවත් කිරීම් හා ඔවුන් ලබන අත්දැකීම් රාජකාරි කටයුතු සඳහා උපයෝගී කර ගැනීමෙන් ආයතනයේ කාර්යසාධනය වැඩිදියුණු කර ගත හැකිය.

## පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අමාත්‍යාංශය යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් හැර වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වනු නොලැබේ | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | - |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | - |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරියන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අදාළ අංශ විසින් තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම. | - |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී පවතින ලදි. 2024 වර්ෂය තුළ රැස්වීම් 2ක් පවත්වන ලදී. | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | - | - |
| | සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| **9** | වාහන කළමනකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වි මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කිරීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම අනතුරක් සම්බන්ධයෙන්ම මු.රේ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල් බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල නොවේ | කල්බදු ලෙස ලබාගත් වාහන නොමැති වීම. | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර ඇත. | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූලවීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ඉදිරියේදී ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකරගනිමින් පවතී. | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම | අනුකූල නොවේ | 6000 – 13 – 0 – 138 තැන්පතු ගිණුම මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත. තවමත් ඉදිකිරීම් කටයුතු කරගෙන යන කොන්ත්‍රාත් තිබෙන බැවින් 6000 – 0 – 16 – 0 – 73 කොන්ත්‍රාත් රැඳවුම් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නැත. | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරිම | අනුකූල නොවේ | ප්‍රධාන කාර්යාලය වන බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් සිදු කරයි. | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබිම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ (නියමිත දිනට බුද්ධශාසන අංශයට යොමු කර ඇත.) | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 2017/04 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | කටයුතු කරමින් පවතී | දැනටමත් අදාළ පහසුකම් සැලසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | දැනට අදාළ තොරතුරු ක්‍රමානුකූලව සකසමින් පවතී | - |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක (1) 05/2018 හා 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | - | ඉදිරි කටයුතු කරමින් පවතී. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක | අනුකූල නොවේ | - | ඉදිරි කටයුතු කරමින් පවතී. |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් පවතී | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | සැලැස්ම පිළියෙල කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම | | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වාදි ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

# ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය

# 01.ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය පිළිබඳ හැඳින්වීම.

මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට හා වේදිකා නාට්‍ය සංදර්ශන සඳහා අනුමැතිය ලබා දීම ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ මූලික කාර්යය බව එහි මුල්ම ආඥා පනත වන වර්ෂ 1912 අංක 07 දරණ ප්‍රසිද්ධ රඟුම් ආඥා පනතෙහි (Public Performances Ordinance) සඳහන්ව ඇත. එසේම ආරම්භයේදී මෙම පනතෙන් ආවරණය වූ විෂය ක්ෂේත්‍රය වඩා පුළුල් විය. එනම් සැණකෙළි (Carnivals) චිත්‍රපට (Cinema) හා සමාජ ශාලා (Clubs) යන ක්ෂේත්‍රයන් ද එහි බලාධිකාරයට යටත් විය.

1912 ආඥා පනත 1918, 1919 යන වර්ෂයන්හිදී සංශෝධනය කරන ලද අතර ස්ථිර රඟුම් පාලක මණ්ඩලයක් ස්ථාපනය කෙරෙනුයේ වර්ෂ 1952 අංක 23 දරණ ආඥා පනතිනි. වර්ෂ 1956 සංස්කරණයක් සිදුවූ අතර වර්ෂ 1961 (අංක 41), 1964 (අංක 26), 1969 (අංක 11) සංශෝධනයන් සිදුකර ඇත. මුල් ආඥා පනත ප්‍රසිද්ධ රඟුම් සඳහා පමණක් සීමා වූ පනතක් බවට පත්වූයේ වර්ෂ 1961 සංශෝධන අනුවය.

ආරක්ෂක කටයුතු විෂය භාර අමාත්‍යවරයා යටතේ තිබූ ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වර්ෂ 1989 දී අධ්‍යාපන සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරුණි. වර්ෂ 2004 දී එය ක්‍රියාත්මක වූයේ සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙන්ය. වර්ෂ 2015 සිට එය අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත් වී තිබූ අතර 2019 වර්ෂයේ නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත්ව පැවතිණ. 2019 අග භාගයේ සිට බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයටද 2022 වර්ෂයේ සිට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට පවරා ඇත.

**ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය**

ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සාමාජික මහත්ම මහත්මීන්ගේ වගකීම වනුයේ ලංකාව තුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට,වේදිකා නාට්‍ය,සංදර්ශන නිරීක්ෂණය කර අනුමැතිය ලබා දීමයි.

පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සංයුතිය 1983 දී 25 දක්වා වැඩි කල අතර 1997 සේනක බණ්ඩාරනායක කමිටු වාර්තාව අනුව එහි සාමාජිකයන් ගණන 15 කට සීමා කල යුතු බවට යෝජනා කෙරිණි. ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ඉහලම බලාධිකාරිය යටතේ ප්‍රතිෂ්ඨාපනය කල යුතු අතර එහි විෂය ක්ෂේත්‍රය රූපවාහිණී මාධ්‍ය හා වීඩියෝ කර්මාන්තයද අනාවරණය වන පරිදි පුළුල් විය යුතු බවට වැඩි දුරටත් යෝජනා කෙරිණ. වීඩියෝ කර්මාන්තය ද ආවරණය වන පරිදි පුළුල් විය යුතු බවට වැඩිදුරටත් යෝජනා කෙරිණි. නමුත් රූපවාහිනී ක්ෂේත්‍රය මෙතෙක් රඟුම් පාලක මණ්ඩලයේ අධීක්ෂණයට ලක් වී නොමැත.

රඟුම් පාලක මණ්ඩලයේ චිත්‍රපට සමීක්ෂණ මණ්ඩලයේ වගකීම වනුයේ ලංකාව තුළ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන චිත්‍රපට, වේදිකා නාට්‍ය, චිත්‍රපට හෝ වේදිකා නාට්‍ය නොවන සංදර්ශන නිරීක්ෂණය කර අනුමැතිය ලබා දීමයි.

මෙහිදී කිසිදු ප්‍රමාදවීමකින් තොරව අවසරය ලබා දීම සඳහා එක් දින සේවයකින් හා පැය විසිහතරේ සේවයකින් වැඩකටයුතු තවත් එලදායී කර තිබේ.

රඟුම් පාලක මණ්ඩලය සිය යුතුකම් හා වගකීම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, ශ්‍රී ලංකාවේ ඇති තානාපති කාර්යාල, චිත්‍රපට නිශ්පාදකයන් ආනයනකරුවන්, නාට්‍ය අධ්‍යක්ෂකයන් ප්‍රසංග සංවිධායකයන් සමග කටයුතු කරමින් සිටී.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණ

**ඉදිරි දැක්ම**

නිදහස් හා යහපත් නිර්මාණ පරිසරයක් ගොඩනැඟීම.

**මෙහෙවර**

චිත්‍රපට,නාට්‍ය,සංගීත හා ප්‍රාසාංගික සංදර්ශන සඳහා වර්ගීකරණ සහතික ලබාදීම සහ කලා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීම.

**අරමුණ**

සමාජ වගකීම නිර්මාණ නිදහස ජනතා සුබසෙත ආදිය පදනම් කරගනිමින් මහජන ප්‍රදර්ශනය සඳහා සංදර්ශන හා කලා නිර්මාණ ඉදිරිපත් කිරීම දිරිමත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ලාංකීය සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය, විදේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියළුම මහජන සංදර්ශන යන විෂය පථයන් දක්වා ඇත.
- එහිදි උක්ත විෂය පථයන් ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කරනු ඇත.

## 1.4 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සමාජ වගකීම.

- ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය චිත්‍රපට, නාට්‍ය, සහ සංදර්ශන සඳහා මහජන ප්‍රදර්ශනයට අනුමැතිය දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලබන අතර අවශ්‍ය සංශෝධන යෝජනා කරනු ලබයි.

- මහජන ප්‍රදර්ශනය සඳහා අනුමත කිරීමේදී හෝ වාරණයට ලක් කිරීමේදී පහත සඳහන් ප්‍රතිපත්ති කෙරෙහි ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සැලකිළිමත් වී අනුමැතිය ලබා දෙමින් බලවත් වගකීමක් ඉටු කරයි.

  - ➢ රටේ පවතින නීතිය හැල්ලුවට ලක් නොකළ යුතුය.
  - ➢ සියලුම ජාතීන්ගේ සහ වාර්ගිකයින්ගේ සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට ගරු කළයුතුය.
  - ➢ සියලුම ජනතාවගේ ආගමික හැඟීම් වලට ගරු කළ යුතුය.
  - ➢ අපරාධ, සාවද්‍ය ක්‍රියා, දුෂ්ට ක්‍රියාවන් හෝ පාපයන් පිළිබඳව ප්‍රේක්ෂක අනුකම්පා

    නොඉපදිය යුතුය.
  - ➢ විවාහයේ පාරිශුද්ධත්වය පිළිගත යුතු අතර දුශ්චරිතය ඉස්මතුවන ආකාරයට

    ලිංගිකත්වය ඉදිරිපත් නොකළ යුතුය.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ඉහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමේදී මානව ප්‍රගතියට කලා ලොවේ පවත්නා වැදගත්ම කලාව රස විඳීම සඳහා ප්‍රේක්ෂකයාට ඇති අයිතියත් සැලකිල්ලට ගනිමින් නිදහස් අදහස් ප්‍රකාශනයට ඇති අයිතිය වැරදි ආකාරයට පාවිච්චි කරන්නේද යන වග ද සිහි තබා ගනී. ඒ සඳහා සමාජ වගකීම මුල් තැනෙහි ලා සැලකිල්ලට ගනු ලැබේ. සමාජයට අහිතකර දේ බැහැර කිරීම, රැඟුම් පාලක මණ්ඩලයේ ප්‍රතිපත්තියයි.

ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ වගකීම කිසියම් චිත්‍රපටයක්, නාට්‍යක් හෝ සංගීත සංදර්ශනයක්, එය මහජන ප්‍රදර්ශනයට සුදුසු විෂයයක්ද යන වග තීරණය කිරීමයි. මේ තීරණයට එළඹීමේදී ඊට නිසි වාරණ සීමා හා වගකීම් අදාළ ප්‍රේක්ෂකයන් වෙත පැනවිය හැකිය.

ඉහතින් පැනවූ නීති රෙගුලාසි මණ්ඩලයට පැවරී ඇති බලතල හා කාර්යයන් අනුව ක්‍රියාත්මක වේ.

චලන චිත්‍රය සංනිවේදනය තුළ පවත්නා බලවත්ම මාධ්‍යයයි. ඉන් ප්‍රබල බලපෑමක් චිත්‍රපට ප්‍රේක්ෂකයන් වෙත ඇතිකළ හැකිය. එය ජනතා යහපත සඳහාද මෙහෙයවිය හැකිය.

ඉහත සඳහන් වූ ප්‍රතිපත්ති සලකා බැලීමට අමතරව අදාළ කරුණු ඉදිරිපත් කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම සඳහා පූර්ණ අයිතිය ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය සතුය.

වර්තමානයේ ජාත්‍යන්තර වශයෙන් සමාජ වගකීම් න්‍යායන් භාවිතාවේ. මෙහිදී විශේෂයෙන් අපරදිග කලාව හුදු නිදහස් කලාවක් වශයෙන් ව්‍යාප්තවීමට තිබෙන නිදහස පෙරදිග රටවල පවතින සමාජ වගකීම යන තීරණාත්මක සාධකයෙන් තුලනය වේ.

මෙහිදී සරළ වශයෙන් කියන්නේ නම් මේ කලා නිර්මාණ මහජන ප්‍රදර්ශනයන් බැවින්, සමාජයට ඉන් වන අහිතකර තත්වය සලකා බලා තීරණයන් කෙරෙහි එළඹීම මණ්ඩලයේ මූලික වගකීමකි.

1912 අංක 07, 1919 අංක 07 දරණ ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩල ආඥා පනත් පසුව 1951 අංක 23, 1961 අංක 40, 1964 අංක 26, 1969 අංක 11 පනත්වලින් ප්‍රසිද්ධ රංගනයන්, සැනකෙලි සහ ඒවාට සම්බන්ධව හෝ ඒවායින් මතුවන අවස්තා වඩාත් හොදින් විධිමත් කිරීම සඳහා බලය ඇත. මෙම ආඥා පනත ප්‍රසිද්ධ රැගුම් පාලන ආඥා පනත යනුවෙන් හැදින්විය හැකිය.

## 2. ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය - සංවිධාන සැළැස්ම-2024



## 3. කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | ක.සේ.ව.අංක 03/2016 අනුව වැටුප් කේතය | තතය | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 1. | ලේකම් | JM 1-1 | - | 01 | දැනට මෙය සංවර්ධන නිලධාරී තනතුරින් ආවරණය වේ. |
| 2. | වැඩසටහන් නිලධාරී | MN 4 2006 | 04 | 04 | - |
| 3. | තොරතුරු තාක්ෂණ සහායක | MA2-1 | - | 01 | 01 |
| 4. | කළමනාකරණ සහකාර | MA1-2 | - | 01 | 01 |
| 5. | රියදුරු | PL3 | - | 02 | 02 |
| 6. | ප්‍රක්ෂේපණ යන්ත්‍ර ක්‍රියාකරු | PL2 | - | 01 | 01 |
| 7. | කාර්යාල කාර්ය සහායක | PL1 | 01 | 01 | - |
| **එකතුව** | | | **05** | **11** | **05** |

## 4. මූල්‍යමය තොරතුරු

### 4.1 බලපත්‍ර ආදායම.

| අනු අංක | වර්ෂය | ආදායම (රු.මි.) |
|---|---|---|
| **1.** | **2022** | **4.82** |
| **2.** | **2023** | **8.29** |
| **3.** | **2024** | **10.00** |

### 4.2 ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්.

| **2024** | | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රුපියල්) (රු.මි.) | සමස්ත වියදම (%) |
|---|---|---|---|---|
| **1.** | පුනරාවර්තන | **9.0** | **8.41** | **93** |
| **2.** | ප්‍රාග්ධන | **10.0** | **5.88** | **58** |
| | | **19.0** | **14.29** | **75** |

## 5. ආයතන ප්‍රගතිය

### 5.1 චිත්‍රපට නිරීක්ෂණය -2024

| නිරීක්ෂණය කළ මුළු චිත්‍රපට සංඛ්‍යාව | භාෂාව | | | | | | **U** වර්ගීකරණය අසීමිත මහජන ප්‍රදර්ශනය | **A** වර්ගීකරණය වැඩිහිටියන්ට වඩාත් සුදුසු | **X** වර්ගීකරණය වැඩිහිටියන්ට පමණයි | වාරණය කළ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල | ද්‍රවිඩ -දේශීය | ද්‍රවිඩ -විදේශීය | ඉංග්‍රීසි | හින්දි | වෙනත් | | | | |
| **216** | **42** | **10** | **74** | **53** | **29** | **08** | **171** | **36** | **09** | **0** |

## 5.2 DVD නිරීක්ෂණය -2024

| නිරීක්ෂණය කළ මුළු DVD සංඛ්‍යාව | අනුමත කළ | අනුමත නොකළ |
|---|---|---|
| 90 | 90 | 0 |

## 5.3 වේදිකා නාට්‍ය නිරීක්ෂණය -2024

| නිරීක්ෂණය කළ මුළු නාට්‍ය සංඛ්‍යාව | • **(X - වර්ගීකරණය)**<br>**වැඩිහිටියන්ට පමණයි = 05**<br>• **ප්‍රදර්ශනය වාරණය කළ = 03** | | | | | |
|---|---|---|---|---|---|---|
| | සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | |
| | කෙටි | දීර්ඝ | කෙටි | දීර්ඝ | කෙටි | දීර්ඝ |
| **306** | **101** | **106** | **22** | **06** | **20** | **51** |

## 5.4 ප්‍රසංග නිරීක්ෂණය-2024

| චිත්‍රපට හෝ නාට්‍ය නොවන ප්‍රසංග | දේශීය | | විදේශීය | |
|---|---|---|---|---|
| | සාමාන්‍ය ප්‍රසංග | රූපවාහිනී මාධ්‍ය ප්‍රසංග | එළිමහන් ප්‍රසංග | ඇතුළත ප්‍රසංග |
| **642** | **589** | **05** | **08** | **40** |

# ජාතික උරුම අංශය

## පරිච්ඡේදය 01 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 01. ජාතික උරුම අංශය

### 1.1 හැඳින්වීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම යන ප්‍රතිපත්තිය අනුව හා අංක 2412/08-2024 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින්, මෙම අමාත්‍යාංශයෙහි ජාතික උරුම අංශය ස්ථාපනය කිරීම හා කාර්යභාරය නෛතික පැවරීම සිදු කර ඇත. මේ සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පරිපාලන වගකීම පවරා ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම ජාතික උරුම අංශය වෙත පවරා ඇත.

### 1.2 දැක්ම

ජාතික උරුමයන් සංරක්ෂණය, සාහිත්‍ය සහ කලාව ප්‍රවර්ධනය තුළින් අභිමානවත් ශ්‍රී ලංකාවක්.

**මෙහෙවර**

ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය, කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, පාරම්පරික හා ග්‍රාමීය කලා ශිල්පී කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහය වීම සහ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම සඳහා සහය වීම.

**අරමුණු**

1. ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම.
2. ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
3. ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය.
4. දැයේ දරුවන් සහ තරුණයින් ඇතුළු ප්‍රජාව ජාතික උරුම සංරක්ෂණය හා සාරධර්ම පිළිබඳ දැනුවත් කිරීම.
5. සංස්කෘතික විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශනවල නිර්මාණශීලීත්වය හා විවිධත්වය පෝෂණය කිරීම.
6. සෑම ආයතනයකම පවත්නා ව්‍යවස්ථාපිත තත්වය හා නෛතිකව තහවුරු කිරීම හා යාවත්කාලීන කිරීම.
7. ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් කිරීම.

8. කලා ශිල්පීන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම.
9. දේශීය කලා නිර්මාණයන් ජාත්‍යන්තර ප්‍රජාවට වින්දනය කිරීමට අවස්ථාවන් හා පහසුකම් සැලසීම.
10. දේශීය කලා නිර්මාණ සංරක්ෂණය හා ප්‍රවර්ධනය හා ඉහළ ප්‍රමිතියකින් යුතුව ප්‍රජාවට වින්දනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
11. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමණාකරණය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම" සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව සංස්කෘතික හා ප්‍රාසාංග කලා විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ දෙපාර්තමේන්තු , රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , පසු විපරම් කිරීම හා ඇගයීම.

## 1.4 සංවිධාන සටහන



ජාතික උරුම අංශය
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අධ්‍යක්ෂ (සැලසුම්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර ලේකම්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
පරිවර්තක
සංවර්ධන නිලධාරී /කළමනාකරණ සහකාර නිලධාරී
සංවර්ධන නිලධාරී /කළමනාකරණ සහකාර නිලධාරී
සංවර්ධන නිලධාරී /කළමනාකරණ සහකාර නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහයක

## 1.5 පරිපාලන වගකීම් පැවරී ඇති ආයතන

1. ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
2. ගාලු උරුමය පදනම
3. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
4. අපේ ගම
5. ටවර් හෝල් රඟහල පදනම
6. මධ්‍යම සංස්කෘතික අරමුදල
7. ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ)
8. කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

## 1.1 පරිපාලන වගකීම් පැවරී ඇති ආයතන පැතිකඩ හා කාර්යභාර්ය

### 1.6.1 ග්‍රාමෝද්‍ය ජනකලා කේන්ද්‍රය

**හැඳින්වීම**

ග්‍රාමෝද්‍ය ජනකලා කේන්ද්‍රය 1988 නොවැම්බර් මස 17 වන දින ශ්‍රී ලාංකේය සංස්කෘතියෙන් කෙමෙන් වියැකෙමින් පවතින ජනකලාවන් සහ අස්පර්ශනීය උරුමයන් ආරක්ෂා කරමින් මතු පරපුර වෙත දායාද කිරීමේ උදාර සංකල්පයකට අනුව එවකට ගරු අග්‍රාමාත්‍ය රණසිංහ ප්‍රේමදාස මැතිඳුන් විසින් ආරම්භ කරන ලදී. ආරම්භයේ දී වෘත්තීය පාඨමාලාවලට පමණක් සීමා වූ ග්‍රාමෝද්‍ය ජනකලා කේන්ද්‍රයේ අනතුරුව සෞන්දර්ය පාඨමාලාවන් ආරම්භ කර ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවල සිසුසිසුවියන් සහභාගී වීම හේතුවෙන් නේවාසික පාඨමාලා ලෙස මෙම පාඨමාලාවන් පවත්වාගෙන ගොස් ඇත.

2013 වර්ෂයේ සිට නර්තන, සංගීත, චිත්‍ර හා මූර්ති යන පාඨමාලාවන් පවතින අතර වර්තමානයේ වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන කොමිෂමේ සහ ජාතික අධුනිකත්ව පුහුණු අධිකාරියේ අනුමැතියෙන් NVQ 4, 5 සහ 6 ප්‍රාසාංගික කලා වෘත්තීය පාඨමාලාවන් ලෙස වැඩි දියුණු කර ඇත. සෞන්දර්ය විෂයන් සඳහා ජාතික නිපුණතා මට්ටම ලබාගත් ප්‍රථම ආයතනය ලෙස ජනකලා කේන්ද්‍රය හැඳින්විය හැක.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අස්පර්ශනීය උරුමයන් හා බැඳි පාරම්පරික ශිල්ප ක්‍රම ගවේශණය, සුරක්ෂිත කිරීම හා එම ශිල්ප ඥානය මතු පරපුර වෙත පැවරීම හා අනාගත ශිල්පීන් බිහි කිරීම පිණිස දැනුම හා පරිසරය ගොඩ නගමින් ලොව පුරා ශ්‍රී ලාංකීය අස්පර්ශනීය උරුමයන් හා බැඳි පාරම්පරික ශිල්ප ක්‍රම ප්‍රචලිත කිරීම.

**මෙහෙවර**

ශ්‍රී ලාංකේය අස්පර්ශනීය උරුමයන් හා බැඳි පාරම්පරික ශිල්ප ක්‍රම ගවේශණය, සුරක්ෂිත කිරීම හා එම ශිල්ප ඥානය මතු පරපුර වෙත පැවරීම හා අනාගත ශිල්පීන් බිහි කිරිම පිණිස දැනුම හා පරිසරය ගොඩ නගමින් ලොව පුරා ශ්‍රී ලාංකීය අස්පර්ශනීය උරුමයන් හා බැඳි පාරම්පරික ශිල්ප ක්‍රම ප්‍රචලිත කිරීම.

**අරමුණු**

1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හා පාරම්පරික අස්පර්ශනීය උරුමයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය
2. එම උරුමයන් මතු පරපුර වෙත දායාද කිරීමට අවශ්‍ය නිර්මාණශීලී පියවර ගැනීම.
3. අස්පර්ශනීය උරුමයන් පිළිබඳ නිර්මාණශීලී වෘත්තිකයන් බිහිකිරීමට අවශ්‍ය දැනුම. හා ඊට අදාළ පරිසරය ගොඩ නැගීම.
4. අස්පර්ශනීය උරුමයන්හි මූලයන් ශක්තිමත් කිරීම හා ඒවායේ නියැලි ශිල්පීන්ට අභිමානයක් ලබා දීම.
5. ශ්‍රී ලාංකේය අස්පර්ශනීය උරුමයන් පිළිබඳව ලොව දැනුවත් කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. අස්පර්ශනීය උරුමයන් රැකගැනීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. රටට අවශ්‍ය නිර්මාණශීලී වෘත්තියිකයින් බිහිකිරීම සඳහා දායක වීම.
3. සෞන්දර්ය විෂයන් සඳහා ජාතික නිපුණතා මට්ටම NVQ 4, 5 සහ 6 ප්‍රාසාංගික කලා වෘත්තීය පාඨමාලාවන් පවත්වාගෙන යාම.
4. ආයතනය සමාජ ගත කිරීම මඟින් වැඩි අභ්‍යාසලාභීන් පිරිසක් බඳවා ගැනීමට හැකිවීම.
5. දේශීය ලලිත කලාවන් අගයන තරුණ පරම්පරාවක් බිහිකරීම.
6. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයය සඳහා සෞන්දර්යය විෂයයන් හැදෑරීම සඳහා උත්ප්‍රේරණයක් ඇති වීම

## 1.6.2 ගාලු උරුමය පදනම

**හැඳින්වීම**

ගාලු උරුමය පදනම 1994 අංක 07 දරන පාර්ලිමේන්තු පනත මගින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි. මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.
ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

**දැක්ම**

ගාල්ල කොටුව දකුණු ආසියාවේ ප්‍රශස්ථම බලකොටු නගරයකි.

**මෙහෙවර**

සංස්කෘතික ලෝක උරුමයක් වශයෙන් එහි කැපී පෙනෙන විශ්වීය වටිනාකම ආරක්ෂා කර ගනිමින්, ප්‍රජා සහභාගීත්ව උරුම කළමනාකරණ ක්‍රමවේදයක් තුළින් වඩාත් ආකර්ෂණීය සංස්කෘතික උරුම සංචාරක ගමනාන්තයක් ලෙස ගාලු කොටුව හා එහි හාත්පස භූමියේ තිරසාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

**අරමුණු**

1. ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙස ද, පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙසද, ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම , සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම.
2. ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටියා වූ ද, ඓතිහාසික, සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූද යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීම , දැරීම, පවත්වාගෙන යාම සහ බැහැර කිරීම.

3. ගාලු කොටුව හා එහි ඓතිහාසික පසුබිම ඇතුලත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපල සංරක්ෂණය කිරීමෙහිලා ගාලු කොටුව තුල පදිංචිකරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම හා එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද, එකී කොටුවේ සහ එහි ඓතිහාසික පසුබිමේ ඓතිහාසික, සංස්කෘතික, පුරාවිද්‍යාත්මක හා සෞන්දර්ය අංශ සම්බන්ධයෙන් ද, එකි කොටුව තුල පදිංචිකරුවන් දැනුවත් කිරීම ද, එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම තුළ පිහිටා ඇති නිවාස හා ගොඩනැගිලි නැවත තැනීම ,අලුත්වැඩියා කිරීම හා සංරක්ෂණය කිරීම , තත්වය උසස් කිරීම, යථාතත්වයට පත් කිරීම හා එහි නිවාස ගොඩනැගිලි යොදා ගැනිමේ නව ක්‍රම සොයා ගැනීම.
4. ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමියට ඇතුළු වී සිරිනැරඹීම සඳහා පහසුකම් සැලස්වීම.
5. ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය තුල පදිංචිකරුවන්ගේ සාමාන්‍ය සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.
6. ඉහත කී අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියළු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. ගාලු කොටුව තුළ සංචාරක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
2. ගාලු කොටුව අලංකාරවත්ව සහ පවිත්‍රව පවත්වාගෙන යාම.
3. ගාල්ල කොටුව පිළිබඳ දැනුවත් කිරීමේ දේශන හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
4. ගාලු කොටුව තුළට අවශ්‍ය රථවාහන සැලැස්මක් සකස් කර හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
5. ගාල්ල කොටුව පිළිබඳ තොරතුරු ලබාගත හැකි කේන්ද්‍රයක් (තොරතුරු මධ්‍යස්ථානයක්) පවත්වාගෙන යාම.
6. වර්ෂය පුරා සංස්කෘතිකමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. ගාලු කොටුව තුළ යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
8. ගාලු කොටුව තුළ පිහිටි පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීමට අවශ්‍ය සංරක්ෂණ සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය කටයුතු කිරීම.
9. ප්‍රදර්ශන ගැලරි ලෙස සංවර්ධනය කර තිබෙන සඳු ගැලරිය හා අනෙකුත් යුධ කාමර නඩත්තු කිරීම, ඒවා නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට පහසුකම් සැලසීම, සංචාරකයන්ට ප්‍රවේශපත්‍ර අලෙවිකර ආදායම් උත්පාදනය කිරීම.
10. ගාලු කොටුව වටා වෙරළ තීරය පවිත්‍රව තබා ගැනීම, මුහුදේ දිය නෑමට පැමිණෙන ජනතාවට අවශ්‍ය පහසුකම් සහ ආරක්ෂිත උපක්‍රම සැලසීම.
11. ගාලු කොටු පවුරේ විටින් විට අවශ්‍යවන නඩත්තු කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් සමඟ එක්වී නිසියාකාරව සිදුකිරීම.
12. ලෝක උරුමයක් ලෙස ගාලු කොටුවේ සුවිශේෂී විශ්වීය වටිනාකම ආරක්ෂාකර ගනිමින් පවත්වා ගෙන යාම සඳහා අදාල සියලු ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
13. ගාලු කොටුව ප්‍රජාවගේ ගැටලු විසඳීම සඳහා උරුම සේවා පියසක්. උරුම සායන හා ගොඩනැගිලි වඩාත් ඵලදායිව නඩත්තු හා සංරක්ෂණය කිරීම සඳහා උරුම සම්මාන වැඩසටහන් පැවැත්වීම.
14. ගාල්ල කොටුව හා බැඳුනු අනෙකුත් බලකොටු ආශ්‍රිතව ජීවත් වන විවිධ ජන කණ්ඩායම් සමග සංස්කෘතික සබඳතාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.6.3 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා සමීක්ෂණ කටයුතු ආරම්භ වුයේ ක්‍රිස්තු වර්ෂ 1871 දි ශ්‍රීමත් හකර්යුලිස් රොබින්සන් (Sir Hercules Robinson) ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේදී ලෝටන් (Lowton) නම් තැනැත්තා අනුරාධපුරයේ හා පොළොන්නරුවේ ස්මාරකවල ඡායාරූපගත කිරීමෙනි. කුතුහලය මත පදනම්ව ද්‍රව්‍යාත්මක සංස්කෘතිය ගවේෂණය තුළින් ආරම්භ වු පුරාවිද්‍යා සමීක්ෂණ කටයුතු විධිමත් ලෙස සිදු කිරීම සඳහා 1980 දී පුරාවිද්‍යා සමික්ෂණ දෙපාර්තමේන්තුව (Deportment of Archaeological Survey) පිහිටවන ලදි. 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥාපනතින් මෙම දෙපාර්තමේන්තුව නිතිගත කර පසු කාලීනව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නමින් ප්‍රතිව්‍යුහගත කර ඇත. පුරාවිද්‍යා ස්ථාන ගවේෂණය, කැණීම් හා සංරක්ෂණය හා මනා ලෙස නඩත්තු කර අනාගත පරපුර වෙත ලබා දීම දෙපාර්තමේන්තුවෙන් සිදුවිය යුතු වැදගත්ම කාර්යයභාරය ලෙස සැලකේ. 1890 ජුලි මස 07 වන දින ආරම්භ කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 2023.07.07 දිනට වසර 133 කි.

පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක නඩත්තු කර පවත්වා ගෙන යාම දිවයින පුරා පුරාවිද්‍යා නඩත්තු කලාප 99 ක් යටතේ සිදුවන වන අතර, මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය යටතේ පළාත් හා දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාල 15 ක් හා පළාත් කාර්යාල යටතේ කලාප කාර්යාල 86 ක් ස්ථාපනය කර ඇත. දෙපාර්තමේන්තුවේ කටයුතු ශාස්ත්‍රීය හා ශාස්ත්‍රීය නොවන අංශ දෙක යටතේ ක්‍රියාත්මක වන අතර අරමුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන, පොදුතැන්පත් හා බාහිර ආයතන / පෞද්ගලික ආධාර යටතේ සිදු වේ.

**දැක්ම**

සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනා ලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමන ආයතනය ලෙස කටයුතු කිරීම.

**අරමුණ**

ඉහත මෙහෙවර ඉෂ්ය කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු කිහිපයකි.

01. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂණය
02. පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම
    i). ස්ථාන සහ ස්මාරක
    ii). චංචල පුරාවස්තු
03. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
04. පුරාවිද්‍යාත්මක ස්ථාන / ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව.
05. පර්යේෂණ.
06. සම්පත් ප්‍රවර්ධනය
    i). මානව
    ii). ආයතනික

**ප්‍රධාන කාර්යයන්**

1. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
3. පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
4. පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
5. සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
6. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
7. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

## 1.6.4. අපේ ගම

**හැඳින්වීම**

2013 වර්ෂයේ දී පවත්වන ලද පොදුරාජ්‍ය මණ්ඩලීය සමුළුවට සමගාමීව අපේ ගම ස්ථාපිත කිරීමත් සමඟ විවිධ අමාත්‍යාංශ යටතේ පාලනය වීමෙන් අනතුරුව අවසාන වශයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස පරිපාලනය වූ නමුත් 2021.11.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2021.04.01 දින සිට ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විශය පථයට පවරා ඇත. මේ වන විට බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ජාතික උරුම අංශය යටතේ ක්‍රියාත්මක වේ.
අපේ ගම ජන උරුම ප්‍රදර්ශන මධ්‍යස්ථානය කොළඹ දිස්ත්‍රික්කයේ බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 13, රූඩ් 03, පර්චස් 25.1 කින් යුත් භූමි භාගයක ස්ථාපිත කර ඇත.

**දැක්ම**

ශ්‍රී ලංකාවේ දේශීය හා පාරම්පරික කර්මාන්ත කරුවන් හා කලා කරුවන් දිරි ගැන්වීම.

**මෙහෙවර**

දේශීය හා පාරම්පරික කර්මාන්ත කරුවන් හා කලා කරුවන් හට තම ගුණාත්මක නිර්මාණ එළිදැක්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් වානිජ වශයෙන් ශක්‍ය හා සමාජ වගකීමක් ඇති ප්‍රමුඛ ආයතනයක් වීම.

**අරමුණ**

දේශීය හා විදේශීය පාරිභෝගිකයන් සඳහා ගුණාත්මක සේවාවක් සැපයීම හා පාරිභෝගික ආකර්ශනය වැඩිකිරීම මගින් අපේ ගම පරිශ්‍රයේ ආදයම ඉහළ නැංවීම.

**ප්‍රධාන කාර්යයන්**

1. අපේ ගම පරිශ්‍රය මුළුමනින්ම හෝ වෙන් වෙන් වශයෙන් කුලියට දීම
2. පුරාණ ගම නැරඹීමට අවස්ථාව ලබා දීම
3. සාම්ප්‍රධායික දේශීය ආහාරපාන අලෙවි කිරීම
4. සාම්ප්‍රධායික හස්ත කර්මාන්ත නිෂ්පාදනය අලෙවි කිරීම
5. දේශීය සංස්කෘතික අංග ඇතුළත් සේවා සැපයීම
6. නැවුම් පරිසරය විදීමට අවශ්‍ය පහසුකම් ලබා දීම
7. පාරම්පරික ශිල්ප ක්‍රම ප්‍රදර්ශනය කිරීම
8. අධ්‍යාපනික සේවා සැපයීම

## 1.6.5. ටවර් හෝල් රඟහල පදනම

**දැක්ම**

ශ්‍රී ලංකාවේ ජාතික නාට්‍ය මධ්‍යස්ථානය බවට පත්වෙමින් ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා පුරෝගාමී ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතියක් බිහිකිරීමට සහ ප්‍රවර්ධනයට දායකවෙමින් ඒ සඳහා අවශ්‍ය දැනුම යටිතල පහසුකම් සපයමින් නූතන විශ්ව නාට්‍ය හා රංගකලා භාවිතයේ නව අත්දැකීම් තාක්ෂණය සහ ඥානය නොඅඩුව ලබාගැනීමට අවශ්‍ය නව මංපෙත් සකසා දෙමින් නාට්‍ය හා රංග කලා නිර්මාණවේදීන් දිරිගන්වමින් රටේ සංවර්ධනයට මෙන්ම මානව වර්ගයාගේ යහපත සඳහා නිර්මාණකරණයේ යෙදීමට ඔවුන් පෙළඹවීම.

**අරමුණු**

1. ගුණාත්මක නාට්‍ය හා රංගකලා සංස්කෘතිකයක් බිහිකිරීම සහ ප්‍රවර්ධනයට දායකවීම.
2. සියවසක් සපුරා ඇති ටවර් රඟහල ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ ජාතික සළකුණ ලෙසින් සංස්ථාපනය කිරීම.
3. ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව වැදගත් කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට දායකවීම සඳහා ජාතික නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයේ දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත් වෙමින් නාට්‍ය හා රංගකලා විෂය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අවශ්‍ය වන්නා වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික ශිල්ප ඥානය පූර්ණ කාලීනව ලබාදෙන අංග සම්පූර්ණ නාට්‍ය හා රංගකලා පාසලක් ස්ථාපිත කර එමගින් එම ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් බිහිකිරීම.
4. අගනුවර මෙන් ම පිටතදීත් නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන්ට එක හා සමාන රසවින්දනයක් ලැබිය හැකි නූතන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි නවීකරණය වූ රංග ශාලා ජාලයක් රටපුරා ඇති කිරීම.
5. විශිෂ්ට ගණයේ නාට්‍යවේදීන්ට ගුණාත්මක භාවයෙන් යුත් උසස් නාට්‍ය නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා මූල්‍යමය ආධාර සැපයීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
6. ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික දේශීය ජන නාට්‍ය සම්ප්‍රදායන්හි සංරක්ෂණය කළයුතු නිර්මාණ ආනුෂාංග, ඇඳුම් - පැළඳුම්, උපකරණ, පොත්පත්, සඟරා සහ එම නිර්මාණවේදීන්ගේ තොරතුරු, සිහිවටන, ඔවුන්ගේ නිර්මාණ රූස්කර ඇති තැටි, පටි, විද්‍යුත් මෙන්ම අස්පර්ශ උරුමයන් අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය කිරීම.

7. නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහා තම නිර්මාණ කාර්යයෙන් පුළුල් මෙහෙවරක් කළ ජ්‍යෙෂ්ඨතම නිර්මාණවේදීන් සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රම ඇති කිරීම සහ වියපත් කළ ඔවුන් රැකබලා ගැනීම සහ ඔවුන් දිරිගැන්වෙන දීමනා ලබාදීම සහ සත්කාර සේවා ඉටුකිරීම.
8. ජාත්‍යන්තර නාට්‍ය ආයතනයේ ශ්‍රී ලාංකේය නියෝජිතයා ලෙසින් එම ආයතනය සමඟ සහ අනෙකුත් රටවල් සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වමින්, නාට්‍ය හා රංගකලාවේ නව ප්‍රවණතා මෙන් ම ඒ පිළිබඳ නව තාක්ෂණික දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගැනීමට සහ පර්යේෂණ කාර්යයන් සඳහා අප නිර්මාණවේදීන් පෙළඹවීම.
9. නාට්‍ය හා රංගකලා නිර්මාණවේදීන්ගේ කේන්ද්‍රස්ථානය වශයෙන් ජාතික නාට්‍ය පුස්තකාලයක්, ජාතික නාට්‍ය කෞතුකාගාරයක්, ජාතික නාට්‍ය සංරක්ෂණාගාරයක්, පුහුණුවීම් සහ පර්යේෂණ කිරීමට සහ දැනුම බෙදා හැරීම සඳහා සුදුසුකම් සහිත ජාතික නාට්‍ය මධ්‍යස්ථානයක් ඇති කිරීම.
10. නාට්‍ය හා රංගකලාව සියලු ජන කොටස් වල සුහදතාව සුරැකෙන මෙවලමක් ලෙස භාවිත කරමින්, ඔවුන් ප්‍රඥාසම්පන්න ජනතාවක් ලෙසින් ශ්‍රී ලාංකේය මානව සම්පත් සංවර්ධනයට දායක කර ගැනීම.

**ප්‍රධාන කාර්යයන්**

1. ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම
2. රඟහල පිළිබඳ දැනුම, අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම
3. නාට්‍ය හා ප්‍රාසාංගික කලාශිල්පීන්ගේ සුභසාධන කටයුතු කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම
4. නාට්‍ය ,නැටුම් හා සංගීතය නිෂ්පාදනය කිරීම ඒ පිලිබඳ පර්යේෂණ කිරීමේ සහ ඒවා ප්‍රදර්ශනයේ නියුක්ත වීම
5. ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා සුදුසු යැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යෑම සහ ප්‍රයෝජනයට ගැනීම.

## 1.6.6 මධ්‍යම සංස්කෘතික අරමුදල

**දැක්ම**

ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන් ගෝලීය ආශ්වර්ය බවට පත් කිරීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආකර්ෂණය, සංරක්ෂණය , සංවර්ධනය, ප්‍රවර්ධනය හා තිරසර සංස්කෘතික ආර්ථික සාධනය මඟින් පෙරදිග සංස්කෘතික උරුම කළමනාකරණය පිළිබඳ විශිෂ්ඨතම ආයතනය වීම.

**අරමුණු**

1. පුරාවිද්‍යාත්මක ගවේෂණ, පර්යේෂණ, කැණීම් හා සංරක්ෂණය සිදු කිරීම
2. ස්පර්ශණීය හා අස්පර්ශණීය සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම

3. ආයතනික මානව සම්පත දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පරිපූර්ණ තෘප්තිමත් පිරිසක් බවට පත් කිරීම
4. ආයතනය සතු තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය, බෙදා හැරීම සහ ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය සහ පවත්වාගෙන යාම
5. සංස්කෘතික අගයයන් රකිමින් පෙර අපර දෙදිග සංචාරක ආකර්ෂණය තුළින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් ප්‍රචලිත කිරීම
6. ආයතනයේ ආදායම් ඉලක්කයන් ඉදිරි වසර හතර තුළදී 30% කින් වර්ධනය කර ගැනීම සහ ඒ තුළින් ආයතනික සේවාවන් වඩාත් කාර්යක්ෂමව සහ උසස් පාරිභෝගික තෘප්තියකින් පවත්වාගෙන යාම
7. හඳුනාගත් සංස්කෘතික අගයන් සහ හර පද්ධතීන් සමාජගත කිරීම
8. බහු ආගමික සහ බහුජන සංහිඳියාවට සහ ජාතික සමගියට උරදීම
9. ජාතික ප්‍රතිපත්තීන්ට අනුව අන්තර්ජාතික සංවිධාන සහ ආයතනික සහයෝගීතාව ගොඩනැගීම
10. නූතන සමාජයට ගැළපෙන අයුරින් ආයතනයේ සේවාවන් නවීකරණය හා විවිධාංගීකරණය

**ප්‍රධාන කාර්යයන්**

1. සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇති මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී වන වියදම් දැරීම
2. ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ හා සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් දැරීම
3. ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම
4. ආගම නංවාලීම, ආගමික ස්ථාන හෝ ආගමික වත්පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම
5. සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්ගෙන් ජාතියට සේවය කර ඇති අය සඳහා ප්‍රදානයන් පිරිනැමීම
6. කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට ආධාර සැලසීම
7. මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයන්ට ආධාර ලබා දීම

## 1.6.7 ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය(නෙළුම් පොකුණ)

**හැඳින්වීම**

ප්‍රාසාංගික කලාව සබැඳිව, ශ්‍රී ලංකාව වසර 2500ක පමණ ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියයි. විවිධ ස්වරූපයෙන් දක්නට ලැබෙන ප්‍රාසංගික කලාව, ප්‍රදේශය හා ශෛලිය පදනම් කර ගනිමින් සුවිශේෂ වූ ගති ලක්ෂණ විදහා දක්වයි. ඉපැරණි අතීතය මුළුල්ලේම මේ සඳහා රාජකීය අනුග්‍රහය ලැබී ඇත. ප්‍රාසාංගික කලාවේ උන්නතියට රාජ්‍ය අනුග්‍රහය අත්‍යාවශ්‍ය වේ. ශ්‍රී ලංකා රජය ප්‍රාසාංගික කලා රඟහල පිහිටුවනු ලබන්නේ වෙසෙසින්ම මෙම අරමුණ පෙරදැරි කරගෙනය. මෙය ශ්‍රී ලංකා කලාකරුවන් වසර ගණනාවක් මුළුල්ලේ දුටු සිහිනයකි. වත්මනෙහි සැබෑ වෙමින් පවතින මෙම සිහිනය ශ්‍රී ලංකා ජනතාවට කලාව සහ සංස්කෘතිය ඇගයීම සඳහා වූ ඉතාමත් උචිත ස්ථානයක් වනු ඇත. මෙම රඟහල විවිධ ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් දේශීය ප්‍රාසාංගික කලාවක් හුවමාරු කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය ගොඩනගා ගැනීම සඳහා තෝතැන්නක් වන්නේය.

**දැක්ම**

ශ්‍රී ලාංකීය ප්‍රාසාංගික කලාව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියළුම පහසුකම් සැපයීම සඳහා ප්‍රාසාංගික කලා නිර්මාණ කරුවන්ට හා ප්‍රේක්ෂකයන්ට උසස් අන්දමේ ප්‍රාසාංගික කලා අත්දැකීම් ලබා ගැනීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම සඳහා පහසුකම් සැපයීම.

**මෙහෙවර**

ශ්‍රී ලාංකීය ප්‍රාසාංගික කලා සංකල්පය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම හා ප්‍රසංග කලා ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා හා එහි නියුතු වූවන්ට අවශ්‍ය සහාය ලබා දීම, ප්‍රසංග කලා ක්ෂේත්‍රයෙහි ප්‍රගමනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවන් වර්ධනය කිරීම.

## 1.6.8 කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

**හැඳින්වීම**

2020/76 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් "කන්ද උඩරට උරුමය" මැයෙන් විෂයක් ව්‍යවස්ථාපිත කරනු ලැබූ අතර එහි විෂය ක්ෂේත්‍රය ලෙස දක්වා ඇත්තේ "කන්ද උඩරට උරුමය සුරැකීම හා සංවර්ධනය" ලෙස ය. ඒ සඳහා, 2017.07.05 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට 2017.08.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය නිල වශයෙන් 2018 මාර්තු 02 වන දින ස්ථාපනය කරන ලදී.

**දැක්ම**

"උරුමය සුරකිමින් සෞභාග්‍ය කරා"

**මෙහෙවර**

කන්ද උඩරට උරුමයට අනන්‍ය වූ සමාජ ආර්ථික සංස්කෘතික උරුමයන් හඳුනාගැනීම, මතු පරපුර වෙත දායාද කොට දීම සඳහා දායක වීම, යුගයට ගැලපෙන අයුරින් භාවිතය හා යටිතල පහසුකම් සංවර්ධනයෙන් සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන ලෙස කටයුතු සැලසුම් කිරීම මඟින් තිරසාර සංවර්ධනය සඳහා දායක වීම.

**අරමුණු**

1. කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය කිරීමට අදාලව ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් කිරීම, සම්බන්ධීකරණය , ක්‍රියාත්මක කිරීම.
2. ඓතිහාසික ස්ථාන සංරක්ෂණය සහ සංවර්ධනය
3. සාම්ප්‍රදායික උඩරට ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයන ග්‍රාමීය වැව් හා වාරිමාර්ග පද්ධති නඟා සිටුවීම.
4. සාම්ප්‍රදායික පැරණි ගම්මානවල රන්, රිදී, තඹ, පිත්තල හා වානේ කර්මාන්ත සංවර්ධනය සහ වෙළඳපල අවස්ථා පුළුල් කරදීම.
5. සාම්ප්‍රදායික කර්මාන්ත සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
6. සාම්ප්‍රදායික ගම සංවර්ධනය කිරීම.
7. සාම්ප්‍රදායික කලා ශිල්පවල හා කලාකරුවන්ගේ ප්‍රවර්ධනය හා සුභසාධනය ඇතිකිරීම.

**ප්‍රධාන කාර්යයන්**

1. කන්ද උඩරට උරුමය අධිකාරි පනත කෙටුම්පත් කිරීම හා පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගැනීම.
2. කන්ද උඩරට උරුමය බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම
3. ඓතිහාසික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ සාම්ප්‍රදායික ගම සංවර්ධන කටයුතු උඩරට පවතින විනාශ වී ගිය වෙහෙර විහාර, පන්සල් හා කෝවිල් ප්‍රතිසංස්කරණය
4. පාරම්පරික උඩරට නැටුම් හා ජන කලා ආරක්ෂා කරගැනීම.
5. සාම්ප්‍රදායික පැරණි ගම්මානවල රන්, රිදී, තඹ, පිත්තල හා වානේ කර්මාන්ත සංවර්ධනය හා වෙළඳ පොළ අවස්ථා පුළුල් කරදීම.
6. උඩරට සාම්ප්‍රදායික ඇඳුම් ආයිත්තම් නිෂ්පාදනය, අත්කම් නිෂ්පාදනය ආදියෙහි යෙදෙන කර්මාන්තකරුවන් ආරක්ෂා කරගැනීම හා වෙළඳ පොළ සකසාදීම.
7. ලාක්ෂා කර්මාන්තය, ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, වේ වැල්, පන් හා හණ භාණ්ඩ නිෂ්පාදන ශිල්ප ක්‍රම හා නිෂ්පාදන රැකගැනීම සහ වෙළඳපළ ශක්තිමත් කිරීම.

## පරිච්ඡේදය 02

### ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### ජාතික උරුම අංශය විශේෂ ජයග්‍රහණ - 2024 වර්ෂය

### 1.1 ජාතික උරුම අංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන්.....

ජාතික උරුම අංශයහි වගකීම වනුයේ "ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව සංස්කෘතිය, ජාතික උරුම, ප්‍රාසාංග කලා, ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, ජාතික ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි". වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් සෘජුවම ජාතික උරුම අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර 2024 වර්ෂය සඳහා වෙන් වී තිබූ ප්‍රතිපාදනය උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව උපයෝජනය කිරීම සිදු කරන ලදි.

❖ **ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම.......**

- **ආදිවාසී දිනය සැමරීම සහ දඹාන / හෙනානිගල වාර්ෂික හැක්ම ශාන්තිකර්මය සිදු කිරීම.**

ආදිවාසී දින සැමරුම් උත්සවය, හැක්ම ශාන්තිකර්මය ආදිවාසී නායකයන්ගේ හා ආදිවාසී ජනතාවගේ සහභාගීත්වයෙන් සාර්ථක අයුරින් සිදු කරන ලදී. ආදිවාසී දිනය සාර්ථකව සිදු කිරීම සඳහා රු. 1,711,768.02 ක මුදලක් ද, හැක්ම ශාන්තිකර්මය සිදු කිරීම සඳහා රු.209,975.00 ක මුදලක් ද මෙම සංස්කෘතික උරුමයන් සංරක්ෂණය සඳහා අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් වෙත යොදවා ඇත. මීට අමතරව ආදිවාසීන් විසින් සිදු කරන ලද දළදා මාලිගාවේ මී පැණි පූජා කටයුතු සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට අමාත්‍යාංශය මැදිහත් වී ඇති අතර ඒ සඳහා රු. 83,000.00 මුදලක් වැය කර ඇත.

  

- **දඹාන ජනඋරුම කෞතුකාගාරයේ වහල අලුත් වැඩියා කටයුතු සිදුකිරීම.**

දඹාන ජන උරුම කෞතුකාගාරයේ නවීකරණ කිරීම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.10,570,368.39කි. වහලය සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රු. 3,804,500.00 ක මුදලක් වැය වී ඇත. නවීකරණය කරන ලද වහලයේ සිවිලිම නිම කිරීම සඳහා රු.මි. 2,169,618.52 ක මුදලක් වැය කර ඇත. එම කෞතුකාගාර පරිශ්‍රයට පැමිණෙන විදේශීය ජනතාවට ගැලපෙන පරිදි වැසිකිළි පද්ධතියක් සකස් කිරීමේ කටයුතු අමාත්‍යංශයේ උපදෙස් හා ප්‍රතිපාදන ලබා දීම මත ක්‍රියාත්මක වේ. ඒ සඳහා වැය කළ මුදල රු.4,225,031.54කි. කොටස් 03ක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියේ සියලු කටයුතු මේ වන විට අවසන් වී ඇත.මූල්‍ය ප්‍රගතිය වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් 72% කි.




- **පාහියංගල ඇටසැකිලි සංරක්ෂණය සඳහා උෂ්ණත්ව පාලන යන්ත්‍රය මිල දී ගැනීම.**





පාහියංගල ඇටසැකිලි සංරක්ෂණය කිරීමේ කාර්යයන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තැම්පත් කර ඇති අතර සංරක්ෂණ කාර්යයන් අවසන් වූ පසු ජාතික කෞතුකාගාරයේ තැම්පත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත.අස්ථි ඇටසැකිල්ල තැම්පත් කරන වීදුරු කුටියට සවි කිරීමට සාපේක්ෂ ආර්ද්‍රතාව පාලන යන්ත්‍රය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් මිල දී ගෙන ඇත.

## ❖ දැයේ උරුමය දරුවන්ටයි..... ජාතික උරුම හා සංස්කෘතික කඳවුරු පැවැත්වීම

දැයේ ජාතික උරුමයන් සුරැකීම පිළිබඳව අවධානය අඩුවෙමින් පවතින කාල වකවානුවක ජාතික උරුම, උරුමස්ථාන හඳුනා ගැනීම සහ වාර්තාකරණය, පුරාවිද්‍යාව, ඉතිහාසය වැනි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව පාසල් සිසුන් තුළ දැනුම, කුසලතා. ආකල්ප වර්ධනය කිරීම සහ උරුමයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන පසුබිම සැකසීම උදෙසා ඓතිහාසික සහ කාලීන වැදගත්කමින් යුත් ස්ථානයක් හඳුනා ගෙන එම ස්ථානය කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන් පැවැත්වීම සිදුවේ. එම කේන්ද්‍රස්ථානය අවට ඇති පාසල් හා ජනකලා කේන්ද්‍රයේහි තෝරාගෙන සමස්ථයක් ලෙස පාසල් සිසුන් 110 දෙනෙක් සඳහා දෙදිනක ජාතික උරුම හා සංස්කෘතික කඳවුරු පැවැත්වීම සිදු විය.

2024 වර්ෂයේ රු. 657,640.00 ක මුදලක් වැය කර පාසල් ළමුන් සඳහා කඳවුරු වැඩසටහන් 2 ක් සාර්ථකව සිදු කර ඇත.

- **දැයේ උරුමය දරුවන්ටයි - ජාතික උරුම හා සංස්කෘතික කඳවුරු වැඩසටහන අදියර I - වේයන්ගොඩ සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානය**






- **දැයේ උරුමය දරුවන්ටයි - ජාතික උරුම හා සංස්කෘතික කඳවුරු වැඩසටහන අදියර II -කෝට්ටෙ පුරාවිද්‍යා කෞතුකාගාරය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**





## ❖ නායකත්ව පුහුණු වැඩමුළුවක් .......

ජාතික උරුම අංශයේ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම, ධාරිතා ප්‍රවර්ධනය කිරීම, නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම, අභියෝග කළමනාකරණය කර ගැනීම සහ කණ්ඩායම් හැඟීම් ප්‍රවර්ධනය කිරීම යන කරුණු මූලික කරගෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් දෙදින පුහුණු වැඩමුළුවක් බාහිර කථිකාචාර්ය කෑගල්ල දිස්ත්‍රික් පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ විරාජ් නෙරංජන් බාලසූරිය මහතාගේ සම්පත් දායකත්වයෙන් මහාචාර්ය සේනක බණ්ඩාරනායක ක්ෂේත්‍ර පුහුණු පාසල සීගිරිය පරිශ්‍රයේ දී පැවැත්විණි.





## ❖ 2024 ජාතික උරුම අංශයෙන් සුවිශේෂී ප්‍රතිපත්තිමය තීරණ.......

| අනු අංකය | ප්‍රතිපත්තිමය තීරණ/ අමාත්‍ය මණ්ඩල තීරණ | ප්‍රගතිය |
|---|---|---|
| 01 | MBRCA/CA/CP/2024/06<br>2024.02.28<br>ඓතිහාසික සීතාවක ප්‍රදේශයේ කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම.<br>❖ 24/0419/620/011 හා 2024.03.07 දිනැතිව අනුමැතිය ලබා දී ඇති අතර ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සකස් කරනු ලබන සංකල්ප පත්‍රිකාවක්, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.<br>❖ අංක අමප/24/0782/620/011-I හා 2024.05.14 දිනැතිව වාර්තාවේ ඇති නිර්දේශ මත පදනම්ව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | සංකල්ප පත්‍රිකාව 2024.04.25 දින අමාත්‍ය මණ්ඩල සටහනක් මගින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී<br>මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත දන්වා යවා ඇත |
| **02** | MBRCA/CA/CP/2024/08<br>2024.05.27<br>1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනත අනුව පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත නව ගාස්තු අය කිරීම. | |
| **03** | MBRCA/CA/CP/2024/13<br>2024.05.27<br>ටවර් හෝල් රඟහල පදනමට අයත් සව්සිරිපාය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලබන කාර්යාලය එම අධිකාරියට අයත් බත්තරමුල්ල සීටුැක් පරිශ්‍රය වෙත විතැන් කිරිම හෝ රජයේ තක්සේරුගත වටිනාකම මත නව බදුකුලී ගිවිසුමකට එළැඹීම.(ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය)<br>❖ අමප/24/1286/620/022 හා 2024.07.16 දිනැතිව ටවර් හෝල් ආයතනය ස්වයං උත්පාදන ආයතනයක් ලෙස ඉදිරියේ දී කටයුතු කළ යුතු බවත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ගෙවිය යුතු රු.මි. 145 ක හිඟ මුදල වහාම ගෙවන ලෙසත් දැනුම් දී ඇත. | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම් වෙත 2024.07.23 දිනැතිව දන්වා යවා ඇත. |
| **04** | MBRCA/CA/CP/2024/19<br>2024.06.20<br>මහින්ද රාජපක්ෂ ජාතික ප්‍රසාංග කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ රඟහල) වෙන් කිරීම 75 වන යුනෙස්කෝ - ශ්‍රී ලංකා මිත්‍රත්වය | 24/1247/620/021 හා 2024.07.02 දිනැතිව අනුමැතිය ලබා දී ඇත. |

| අනු අංකය | ප්‍රතිපත්තිමය තීරණ/ අමාත්‍ය මණ්ඩල තීරණ | ප්‍රගතිය |
|---|---|---|
| 05 | MBRCA/CA/CP/2024/18<br>2024.07.02<br>ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහා විහාරයේ ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිමගෙය ආරක්ෂා කිරීම. | අමප/24/1331/620/023 හා 2024.07.30 දිනැති මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි පියවර ගැනීමට යටත්ව හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හි සඳහන් විධිවිධාන පරිදි ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත අත්තිකාරම් ලබා දීම. |

## ❖ ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය

**(01) පාඨමාලා සංවර්ධනය හා නව පාඨමාලා පවත්වාගෙන යාම**

**i. ජාතික නිපුණතා මට්ටම ලබා ගැනිම**

- **චිත්‍ර NVQ 04** - 2023 වසරතුළදී වලංගුභාවයට පත්වී ඇත. අප ආයතනය ප්‍රතීතනය ලබාගෙන ඇත.
- **සංගීතය NVQ 05** - 2024 වසර තුළදී වලංගුභාවයට පත් වී ඇත. අප ආයතනය ප්‍රතීතනය ලබාගෙන ඇත.

**ii. ජාතික නිපුණතා පාඨමාලා සඳහා බාහිර සම්පත්දායකත්ව ලබා ගැනීම**

- නැටුම් (කතකලි/මනිපුරි/බෙරවාදන/ විදේශීය බෙර වාදන)
- සංගීත (අවනද්ධ වාද්‍ය /උත්තර භාරතීය සංගීතය-ගායනය/ව්‍යවහාරික සංගීතය/කරණාටක හා බටහිර සංගීතය)



iii. ජනාධිපති ලේකම් කාර්යාලය මගින් සංවිධානය තරන ලද **වසත් සිරිය** අවුරුදු උළෙල සඳහා නර්තන හා සංගීත අංග ඉදිරිපත් කිරීම.



iii. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද අවුරුදු උළෙල සඳහා සංගීත අංග ඉදිරිපත් කිරීම



iv. ගංගාරාම නවම් මහ පෙරහැරේ නර්තන අංග ඉදිරිපත් කිරීම





vi. නෙළුම් පොකුණ රගහලේ පැවැති ගීතා ප්‍රසංගයට නර්තන අංග ඉදිරිපත් කිරීම

## ❖ ගාලු උරුමය පදනම

**(1) ක්ලිපන් බර්ග් යුධ අට්ටාලයේ කෝපි අවන්හලක් ස්ථාපිත කිරීම**

ගාලු කොටුවේ පවතින යුධ අට්ටාල 14න් එකක් වන ක්ලිපන් බර්ග් යුධ අට්ටාලය ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ සංරක්ෂණය කිරීමෙන් අනතුරුව ගාලු උරුමය පදනමේ ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස තෙකලා විදුලිය සහ වෙනත් අවශ්‍ය යටිතල පහසුකම් සකස් කර කෝපි අවන්හලක් ස්ථාපිත කිරිම. මේ සඳහා රු.මිලි. 1.4ක ප්‍රතිපාදන වෙන්වී තිබු අතර ඒ සඳහා වියදම රු.මිලි. 1.37ක් විය.






**(2) වෙඩිබෙහෙත් ඇඹරුම්හල අලුත්වැඩියා කිරීම**

ගාල්ල කොටුවේ ඉපැරණි ගොඩනැගිලිවල අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීම තුළින් ඉපැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම යටතේ ගාලු කොටුවේ පැරණි වෙඩිබෙහෙත් ඇඹුරුම්හල පැවති ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම අවසන්ව ඇත. මේ සඳහා වියදම රු. මිලි.01කි.









**(3) Galle Heritage Emporium ගොඩනැගිල්ලේ CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම**

ගාලු උරුමය පදනම විසින් 2023 වර්ෂයේ සංරක්ෂණය කළ පැරණි පොලිස් නිවාස ගොඩනැගිල්ල(Galle Heritage Emporium) ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර එම ගොඩනැගිල්ලේ සංචාරක සහ පාරිභෝගික ආරක්ෂාව වර්ධනය සඳහා CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. මේ සඳහා වියදම රු.මිලි.0.29කි



### (4) ගාලු උරුමය පදනමේ වෙබ් අඩවිය නවීකරණය කිරීම

ගාලු උරුමය පදනම හා එම පදනමින් ප්‍රජාවට සපයන සේවාව සහ ලෝක උරුම ගාලු කොටුව සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම උදෙසා ඩිජිටල් මාධ්‍ය භාවිතා කිරීම හා වෙබ් අඩවිය නවීකරණය (website Revamp) කර එළි දැක්වීම සිදු කළ අතර මේ සඳහා රු.මිලි. 1.8ක් වෙන් කළ ප්‍රතිපාදන වලින් වියදම රු.මිලි.1.63කි.




### (5) උරුම සේවා පියස (Heritage Cell)

ගාලු කොටුවේ ජීවත්වන ගොඩනැගිලි හිමිකරුවන්ට උරුමය පිළිබඳ සේවා පහසුකම් සැපයෙන ස්වකීය ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු හා සංරක්ෂණයකර ගැනීම සඳහා සහ සැලසුම් වඩා කඩිනමින් අනුමත කර ගැනීම සඳහා මාර්ගෝපදේශන සපයනු ලබන හා ප්‍රජාවගේ උරුමයට අදාල ගැටලු විසඳුම් සපයනු ලබන සේවා පියසක් ස්ථාපිත කරන ලදී. එහිදි සේවා පියස ස්ථාපනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම, සේවා පියස පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ සුළු අළුත්වැඩියා කටයුතු ආදිය සිදු කරනු ලැබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වියදම රු.මිලි. 0.48කි.








### (6) ගාලු කොටුව සඳහා වූ කළමනාකරණ සැලැස්ම හා සංචාරක සැලැස්ම යාවත්කාලීන කිරීම

ලෝක උරුම ගාලු කොටුව සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව යුනෙස්කෝ ආයතනය විසින් 2010 වර්ෂයේ සිට පෙන්වා දෙන ලදී. ඒ අනුව 2015 වර්ෂයේ දී විසින් ගාලු කොටුව සඳහා කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කරන ලෙස යුනෙස්කෝ ජගත් උරුම කමිටුව විසින් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින ලදි. මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා ගාලු උරුමය පදනමට අමාත්‍යාංශය හරහා 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර රුපියල් මිලියන 02 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර තිබිණ.
ගාලු කොටුව සඳහා අතීතයට බලපාන කැපි පෙනෙන විශ්වීය අගයට අදාළ ප්‍රකාශන පාදක කරගනිමින් යාවත්කාලීන වූ උරුම හා සංචාරක කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම සඳහා අභිලාෂයන් කැඳවා උපදේශකයෙකු තෝරා ගැනිමේ කටයුතු විවෘත තරඟකාරි ලංසු ක්‍රමවේදය හරහා විධිමත් පරිදි සුදුසු උපදේශක වරයෙකු තෝරා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී. එහි දී අවසන් වශයෙන් සකස් කරන ලද කළමනාකරණ සැලැස්මේ පිටපතට ගාලු උරුමය පදනමේ

කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශයට යොමු කිරීමට ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වියදම රු.මිලි. 2.05කි.






### (7) උරුම සායන (Heritage clinic) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ගාලු කොටුව තුළ ජීවත් වන ප්‍රජාවගේ ගොඩනැගිලිවල උරුම සංරක්ෂණය හා බැඳුණු ගැටලු විසඳීම සඳහා උරුම සායන (Heritage clinic) වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ උරුම ගොඩනැගිලි නිසි පරිදි නඩත්තු කිරීම හා සංරක්ෂණය කිරීමට අදාළව පැන නැගී ඇති ගැටළුවලට නොමිලේ වාස්තු විද්‍යාඥයින්ගේ උපදේශන සැලසීම සිදු කරන ලදී. එසේම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින් පැමිණ ගැටලු ඉදිරිපත්කර ඇති ගොඩනැගිලි පරීක්ෂාකර බලා ඒ සඳහා කළ යුතු සංරක්ෂණ කාර්යන් පිළිබඳ වාර්තා ලබා දීම සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා වියදම රු.මි. 0.06කි





### (8) උරුම සම්මාන උළෙල - 2024 (Heritage Awards 2024)

ගාලු කොටුව ජගත් උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමේ 36 වන සංවත්සරය සැමරීම සඳහා ගාලු කොටුවේ ගොඩනැගිලි උරුම අගයයන් ආරක්ෂා කරමින් නඩත්තුව, සංරක්ෂණය හා සංවර්ධනය කරන උරුම ගොඩනැගිලි අයිතිකරුවන් දිරිමත් කිරීම සඳහා උරුම සම්මාන වැඩසටහන හා එයට සමගාමීව යන උරුම සතිය ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. මෙහි දී ගාලු කොටුවේ සහ එහි පශ්චාත් භූමි ප්‍රදේශයේ පවතින ගොඩනැගිලි නිසි පරිදි සංරක්ෂණයකර, සංවර්ධනයකර පවත්වාගෙන යන ගොඩනැගිලි හිමියන්, එකී ගොඩනැගිලි සැලසුම් කරනු ලැබූ වාස්තු විද්‍යාඥයින් හා එකී ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුවන්ගේ කුසලතා ඇගයීම අරමුණු කරගනිමින්

1. නඩත්තු අංශය
2. සංරක්ෂණ අංශය
3. පසු භාවිතය
4. වෙනස්කම් කල හා අතිරේක ඉදිකිරීම්
5. උරුම පරිශ්‍රයට එකතු කළ නව ගොඩනැගිලි

යන අංශ 05 යටතේ අයදුම්පත් කැඳවා තාක්ෂණික කමිටුවක් හා විනිශ්ච මණ්ඩලයක් මඟින් ජයග්‍රාහකයන් තෝරාපත් කර ගන්නා ලදී. මෙහිදී නඩත්තු අංශය , සංරක්ෂණ අංශය, පසු භාවිතය සහ වෙනස්කම් කළ හා අතිරේක ඉදිකිරීම් අංශ යටතේ ජයග්‍රාහකයන් ජූරි සභාව විසින් තෝරාපත් කරනු ලැබූ අතර ජනතා සම්මානය සඳහා ජයග්‍රාහකයා ගාලු කොටුවේ පදිංචි ජනාතාවගේ මනාප විමසීමක් මඟින් තෝරාපත් කරනු ලැබීය.
ගාලු කොටුව ජගත් උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමේ 36 වන සංවත්සරය සැමරීම සඳහා උරුම සතිය ක්‍රියාත්මක කිරීමට අදාළව සැලසුම් කරනු ලැබූ උරුම සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 03 අතරින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ප්‍රාථමික හා ද්විතියික අංශ යටතේ ***“ගාලු කොටුවේ කැමතිම ස්ථානය හා ඔබ සිත්ගත් සුන්දරම දර්ශනය“*** යන තේමා යටතේ චිත්‍ර තරගය පවත්වන ලදී.
රටේ සිදුවූ දේශපාලනික වෙනස්වීම මත ගාලු උරුමය පදනමේ කළමණාකරන මණ්ඩලය අහෝසි වීම මත 2024.10.08 සිට ගාලු උරුමය පදනමේ සභාපති තනතුර පුරප්පාඩු වීම නිසා උරුම සම්මාන වැඩසටහන 2024ට අදාල ජයග්‍රාහකයන් සඳහා සම්මාන සහතික පත් ලබා දීමත්, චිත්‍ර තරඟයේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග සහ සහතික පත් ලබාදීම සඳහා උරුම සම්මාන වැඩසටහන මෙන්ම උරුම සතියේ සැලසුම් කරන ලද අනෙකුත් උරුම සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 02 පැවැත්වීමට නොහැකි වූවත් මෙම ව්‍යාපෘතියේ මූලික කටයුතු 75% ප්‍රගතිය මත හා ප්‍රතිපාදන මි.0.64 යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

.








**(9) උරුම අර්ථකථන වැඩසටහන් පැවැත්වීම**

ගාලු කොටුව ආශ්‍රිත සංචාරක මගපෙන්වීමේ කටයුතු වල නියැලෙමින් ගාලු කොටුව තුළට පිවිසෙන පුද්ගලයින්ගේ වෘත්තීය දැනුම පුළුල් කිරීමේ වැඩසටහනක් ගාලු කොටුව ආශ්‍රිත වෘත්තීමය ත්‍රිරෝද රථ රියදුරන්, මාර්ගෝපදේශන සේවාව සපයන්නන්, සම්බන්ධ කරගනිමින් පැවැත්වීය. මෙම වැඩසටහන තුළින් ගාලු කොටුවට පිවිසෙනු ලබන දෙස් විදෙස් සංචාරකයින් සමඟ කටයුතු කිරීමේ දී දැනගත යුතු කරුණු සම්බන්ධව හා සංචාරකයන් හට ලබාදෙනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම මගින් සංචාරකයින්ට ඉතා ඉහළ උරුම අර්ථකතනයක් මෙන් ම නවමු අත්දැකීම් සමුදායක් ලබාදීමටත් වර්ථමානයේ ගාලු උරුම අර්ථකතනයන් පුහුණු කර ඔවුන් වෙනුවෙන් හැඳුනුම්පතක් ලබා දෙන එකම ආයතනය ගාලු උරුමය පදනම වේ.
ගාලු කොටුව නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට ඔවුන් බලාපොරොත්තු වන ආකාරයේ සේවයක් ලබාදීමත්, සත්‍යවූත් නිවැරදිවූත් තොරතුරු නිවැරදිව ලබාදීම මගපෙන්වන්නන්ගේ වගකීමක් වන බැවින් එය දේශීයත්වයට හානි නොවන ආකාරයෙන් සුහදශීලි සේවයක් ලබා දීමට අවශ්‍ය මග පෙන්වීම සිදුකිරීම මෙන්ම ගාලු කොටු පවුර පිරිසිදුව පවත්වා ගැනීමට ඔවුනගේ සෘජු

දායකත්වය ලබා ගැනීම ආදී කරුණු මූලික කරගනිමින් ගාලු උරුම අර්ථකතක පුහුණු හැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදී.





### (10) නිලධාරී පුහුණු හා ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම

ගාලු උරුමය පදනමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය සඳහා පුහුණු හා ධාරිතා වර්ධන වැඩසටහනක් පැවැත්විය. ඒ තුළින් කාර්යය මණ්ඩල අභිප්‍රේරණය හා කාර්යක්ෂමතාව වර්ධනය කරගැනීමට හැකි වි ඇත.

### (11) Dutch heritage Post Network meeting (අන්තර්ජාතික සමුළුව)

2024 සැප්තැම්බර් 30 දින සිට ඔක්තෝම්බර් 03 වන දින දක්වා 9 වන ලන්දේසී වෙළඳ මධ්‍යස්ථාන පිළිබඳ ජාත්‍යන්තර ජාල රැස්වීම සහ සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ දී ප්‍රථම වරට ගාල්ල කේන්ද්‍රීයව පවත්වනු ලැබී ය. මේ සඳහා සත්කාරකත්ව දරනු ලැබුයේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ "ගාලු උරුමය පදනම" හා නෙදර්ලන්ත තානාපති කාර්යාලයයි.

මෙහි දි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුයේ දැනුම හුවමාරු කර ගැනීම, පර්යේෂණ දිරිමත් කිරීම, VOC ආශ්‍රිත ඉතිහාසය පිළිබඳ අවබෝධය වැඩි කිරීම සහ හවුල් උරුමය කළමනාකරණය කිරීම පිළිබඳවයි. එහි මහජන සම්මන්ත්‍රණයේ තේමාව වුයේ "හවුල් උරුමය" යන්නයි. ඉන්දියාව, බංග්ලාදේශය, මියන්මාරය, තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව, තායිවානය (චීනය), ජපානය, නෙදර්ලන්තය යන රටවලින් ජාත්‍යන්තර නියෝජිතයන් 23දෙනෙකු සහභාගි වූහ.

සමුළුවේ ආරම්භක උත්සවය 2024 සැප්තැම්බර් 30 සවස ගාල්ල Radisson Blue Resort හි දී නෙදර්ලන්ත තානාපතිතුමගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී. මෙම අවස්ථාවට සංස්කෘතික අමතයාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන ) නිශාන්ති ජයසිංහ මිය මෙන්ම අතිරේක ලේකම් (පාලන) සුජීවා පල්ලියගුරු මියගේ සහ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සනෝජා කස්තුරි ආරච්චි මිය, මධ්‍යම සංස්කෘතික අරමුදල ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ජනරාල් ගාමිණී රණසිංහ මයා, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නදීරා රූපසිංහ මිය ආදී රාජ්‍ය ආයතන ප්‍රධානින්ගේ සහ ගාලු උරුමය පදනම කළමනාකරණ මණ්ඩල සාමාජික මහත්ම මහත්මින්ගේ පැමිණීම ද සනිටුහන් කරන ලදී.

2. වන දින (ඔක්තෝබර් 1) අන්තර්ජාතික සමුළුව ගාල්ල Radisson Blue Resort හි දී පවත්වන ලදී.

3. වන දිනය (ඔක්තෝබර් 2) VOC සම්බන්ධ වෙළඳ ආයතන නියෝජනය කරන සියලුම සහභාගිවන්නන්ගේ ජාල රැස්වීම ගාලු කොටුවේ හෙරිටේජ් හෝටලයේදී පවත්වන ලදී. එක් එක් වෙළඳපළ සමඟ උරුමයන් සුරැකීමේ සහ කළමනාකරණය කිරීමේ ගැටළු සහ අභියෝග අත්දැකීම් බෙදා ගැනීම සහ සාකච්ඡා කිරීම මෙන්ම වෘත්තීය සාකච්ඡා සිදු කරන ලදී.

මෙයට අමතරව 2024.10.01 සහ 02 යන දින දෙකෙහි දී ම ගාල්ල ලෝක උරුම නගරය තුළ (ඓතිහාසික වරාය සහ බලකොටුව ඇතුළුව) සහ මාතර බලකොටු (ප්‍රධාන බලකොටුව සහ තරු කොටුව) ක්ෂේත්‍ර චාරිකා සිදු කරන ලදී.
4. වන දින (ඔක්තෝබර් 3) සමුළුවට සහභාගිවන්නන් කොළඹ ජාතික කෞතුකාගාරයට ගොස් 17 සහ 18 සියවස්වල දී නෙදර්ලන්තයට ගෙන ගිය පුරාවස්තු කිහිපයක් මෑතකදී ආපසු රැගෙන ඒමේ ක්‍රියාවලිය පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා ගැනිම සිදු කරන ලදි.
ඒසේම ශ්‍රී ලංකාවේ VOC වාඩිලාගැනීමේ සියවස් ගණනාවක් සහ කොළඹ ජාතික ලේඛනාගාරය නිරීක්ෂණය කිරීමට VOC ආශ්‍රිත ඉතිහාසයේ ලේඛනාගාර වාර්තා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීමේ උත්සාහයන් පිළිබඳ දළ අවබෝධයක් ලබා ගැනීම ද සිදු කළ අතර එදිනම ඓතිහාසික කොළඹ කොටුව සහ වරාය නැරඹීම ද සිදු කරන ලදී.
කොළඹ කොටුව ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ සමුගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් රංජිත් ආරියරත්න මහතා ද සහභාගිත්වය ද සිදු විය.

ලංකාවේ දි ප්‍රථම වරට පැවැත් වූ මෙම Dutch Trading Post Heritage Network අන්තර් ජාතික සමුළුව සංස්කෘතික අංගයන්ගෙන් ද වර්ණවත්ව ඉතා හරවත්ව බොහෝ දෙනාට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අති සාර්ථක ලෙස නිමාවට පත් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ වියදම රු.8,074,345.00කි.









### (12) නව වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම

ගාලු කොටුවට පැමිණෙන සංචාරකයන් සඳහා නව වැසිකිළි පද්ධතියක් ඉදි කිරීමේ කටයුතුවලට අදාළ මූලික කටයුතු ලෙස අදාළ භූමියේ පුරාවිද්‍යා හානි ඇගයුම් කිරිම හා භූමිය මැන වෙන් කිරීමේ කටයුතු සිදු කරන ලදී.මේ සඳහා වියදම රු.315,180.00කි.





## ❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1890 ජුලි 07 දින ආරම්භ කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, එම දිනය පුරාවිද්‍යා දිනය ලෙස නම් කරමින් සෑම වසරකම රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වනු ලබන පුරාවිද්‍යා සමුළුව 2024.07.07 දින ගරු විෂයභාර අමාත්‍ය තුමාගේ හා පුරාවිද්‍යා විද්‍යාර්ථීකයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි.






**මහනුවර පැරණි රජවාසල සංරක්ෂණය**

ඇමරිකානු තානාපති අරමුදල යටතේ 2021 වර්ෂයේ අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ඉපැරණි රජවාසල හා මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරිම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවේ. රජවාසලේ සංරක්ෂණ කාර්යයන් අවසන් මට්ටමේ පවතින අතර කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු තව දුරටත් සිදුවෙමින් පවති. 2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය.




**තනාපති නිලධාරීන්ගේ නිරීක්ෂණය**




**වහලේ සංරක්ෂණ කාරයයන් අවසන් කර ඇත.**




**දැව සොල්දර තට්ටුව සංරක්ෂණය**



**සංරක්ෂණය කිරීමෙන් පසු**



**වහල සංරක්ෂණය කිරීමෙන් පසු**



**දොර ජනේල සංරක්ෂණය**




**අබාධිත සංචාරකයන් සඳහා ප්‍රවේශ මාර්ගයක් සැකසීම**




**කෞතුකාගාර සැලසුම්වලට අදාල පුවරු සැකසීම**






**පුරාවස්තු රසායන සංරක්ෂණ අංශය යටතේ සංරක්ෂණය**







**ගවේෂණ හා ලේඛනගත කිරීම**

**කල්පිටිය ඕලන්ද කොටුව හා පල්ලිය ගවේෂණය**




කල්පිටිය ඕලන්ද කොටුව හා පල්ලිය පිහිටි පරිශ්‍රය ගවේෂණයේ ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත

**දඹුල්ල, ගලේවෙල මෙගලිතික සුසාන ගවේෂණය**

දිගම්පත සුසාන



බඹරගස්වැව සුසාන



මෙගලිතික සුසානභූමි ගවේෂණයෙ ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත

**හාමිනාකන්ද පුරාවිද්‍යා භූමිය ගවේෂණය**





බදුල්ල දිස්ත්‍රික්කයට අයත් හාමිනාකන්ද පුරාවිද්‍යා ස්ථානයේ ගවේෂණ කටයුතු (ක්ෂේත්‍ර කටයුතු ) සිදුකර අවසන්ව ඇත

මධ්‍යම පළාතට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගවේෂණ කටයුතු සිදු කර අවවසන්ව ඇත





**වෙහෙරගල රක්ෂිතය හා අවට ගවේෂණය**





හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වෙහෙරගල පුරාවිද්‍යා රක්ෂිතයේ ඇති පුරාවිදයා ස්ථාන හා ස්මාරක වාර්තාගත කිරීමේ ගවේෂණ කටයුතු අවසන් කර ඇත.

**වාස්තුවිද්‍යා සංරක්ෂණ**




මීවලපතල දාගැබ සංරක්ෂණය




විල්ගමුව වෙහෙරගල ස්තූපය සංරක්ෂණය




**අපරැක්ක නයි වෙහෙර සංරක්ෂණය අතරතුර**



නැපලාන අම්බලම සංරක්ෂණය

**අභිලේඛන හා නාණකවිද්‍යා**



සමන්ගල මහලෙනේ ලිපිය
පිටපත් කිරීම




දිඹුලාගල සෙල්ලිපිය පිටපත් කිරීම

රාජ්‍ය වෙසක් උළෙල මාතලේ ධර්මරාජ මහා පිරිවෙන් පරිශ්‍රයේ





## ❖ අපේ ගම

අපේ ගම පරිශ්‍රයේ පසුගිය ආදායම් ප්‍රකාශ විශ්ලේෂණය කිරීමෙන් පසු 2022 වර්ෂය තුළ වාර්ෂික ආදායම රුපියල් 11,270,125.00 ක් ද, 2023 වර්ෂය තුළ වාර්ෂික ආදායම රුපියල් 13,322,550.00 ක ද, 2024 වර්ෂය තුළ වාර්ෂික ආදායම රුපියල් 20,229,700.00 වේ. ඒ අනුව, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ රුපියල් 6,907,150.00 වැඩි වීමක් පෙන්නුම් කරනු ලබන අතර ප්‍රතිශතයක් ලෙස 2023 වර්ෂයට සාපේක්ෂව 65% පමණ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.



වහලය අළුත්වැඩියා කිරීම



වෙළඳ කුටි අළුත්වැඩියා කිරීම

## ❖ ටවර් හෝල් රඟහල පදනම

➢ **නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම (සිංහල මාධ්‍ය)**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 4.05** |
| **වියදම** | **-** | **රු.මි. 2.60** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

ටවර් නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ 2024/2025 සඳහා සිසුන් බඳවා ගැනීම (සිංහල මාධ්‍ය)

ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2024/2025 සඳහා සිසුන් 67 ක් අධ්‍යයන කටයුතු සඳහා බඳවාගන්නා ලදී. (සිංහල මාධ්‍ය)

ටවර් නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ 2021/2022 සිසුන් සඳහා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම. (සිංහල මාධ්‍ය)

ටවර් නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන වර්ෂ 2021/2022 සඳහා සිසු සිසුවියන් 53 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු

අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.12.15 දින සච්සිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

ඒ සඳහා බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ඒ.එම්.පී.එම්.බී අතපත්තු මහතා, විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිනිය, ද්විතික හා තෘතියික අධ්‍යනාංශයේ අංශාධිපති, නාට්‍ය හා රංගකලා උපාධි සම්බන්ධීකාරක අයෝමි ඉරුගල්බණ්ඩාර මහත්මිය හා නාට්‍ය පාසලේ ආචාර්ය මණ්ඩලය හා ටවර් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය මෙන් ම සිසු සිසුවියන්ගේ දෙමව්පියන් ඇතුලු පිරිසක් මේ සඳහා සහභාගී විය.





- **නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම (දෙමළ මාධ්‍ය)**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 4.55** |
| **වියදම** | **-** | **රු.මි. 3.69** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

- **ටවර් නාට්‍ය පාසලේ අධ්‍යන වර්ෂ 2024/2025 සඳහා සිසුන් බඳවා ගැනීම (දෙමළ මාධ්‍ය)**

ටවර් නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන වර්ෂ 2024/2025 සඳහා සිසුන් 30 ක් අධ්‍යයන කටයුතු සඳහා බඳවාගන්නා ලදී. (දෙමළ මාධ්‍ය)

ටවර් නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ (දෙමළ මාධ්‍ය) 2022/2023 අධ්‍යයන වර්ෂයේ ඩිප්ලෝමාව සමත් වූ සිසු සිසුවියන් 44 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානෝත්සවය ගරු ධීවර හා ජලජ හා සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.12.28 දින යාපනය ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. ඒ සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරතුමා, උතුරු පළාත් ප්‍රධාන ලේකම්, උතුරු පළාත් අධ්‍යාපන ලේකම්, විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශාධිපති, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමිය හා දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසලේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් හා ටවර් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය මෙන් ම සිසු සිසුවියන්ගේ දෙමව්පියන් ඇතුලු 300 කට අධික පිරිසක් මේ සඳහා සහභාගී විය.






- **රංගනය පිළිබඳ වෘත්තීය ( NVQ 4 ) පාඨමාලාව**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 1** |
| **වියදම** | **-** | **රු.මි. 0.98** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව ( NVQ 4 ) පළමු කණ්ඩායම සඳහා සහතිකපත් ලබාදීම

ටවර් හෝල් රඟහල පදනම විසින් දිවයිනේ ප්‍රථම වරට ආරම්භ කරන ලද රංගනය පිළිබඳ (NVQ 4) වෘත්තීය පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානොත්සවය සව්සිරිපාය ශ්‍රවණාගාරයේදී බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ඒ.එම්.පී.එම්.බී අතපත්තු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, මේ සඳහා බුද්ධශාසන ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) එස්.ජී.පල්ලියගුරුගේ මහත්මිය, ප්‍රසිද්ධ රඟුම්පාලක මණ්ඩලයේ සභාපති,ප්‍රවීණ කලාකරුවන් වන සනත් ගුණතිලක මහතා, පාලිත සිල්වා මහතා ඇතුළු පාඨමාලා සම්පත් දායකයින්, ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය මේ සඳහා සහභාගී විය.




ටවර් හෝල් රඟහල පදනම විසින් දිවයිනේ ප්‍රථම වරට ආරම්භ කරන ලද රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව(NVQ-4) දෙවන කණ්ඩායම බඳවාගැනීම. මේ සඳහා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්තුමා හා පාඨමාලාවේ සම්පත් දායකයින් හා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන සිසුන් සහභාගී විය.






- **හාත්බණ්ඩය විභාගය පැවැත්වීම 2024/2025 වර්ෂයන් සඳහා**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 0.5** |
| **වියදම** | **-** | **රු.මි. 0.277** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

ප්‍රවේශිකා, ප්‍රථම, මධ්‍යම, විශාරද I,II යන අංශ යටතේ හාත්බණ්ඩය විභාගය සඳහා අයදුම්පත් කැඳවා සිසුන් 150 ක් ලියාපදිංචි කිරීමත් ඊට අදාළ සියලු ලිඛිත පරීක්ෂණ පවත්වන ලදි.

- **ලෝක නාට්‍ය දිනය සැමරීම**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 0.153** |
| **වියදම** | **-** | **රු.මි. 0.311** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ යුනෙස්කෝ ආයතනය විසින් 1960 වර්ෂයේ පිහිටුවා ඇති ජාත්‍යන්තර රංගකලා ආයතනය (International Theatre Institute) මේ දක්වා සෑම වසරකම මාර්තු මස 27 දින ලෝක නාට්‍ය දිනය සමරනු ලබයි.

යුනෙස්කෝ ආයතනය විසින් පිහිටුවා ඇති ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ලෙස කටයුතු කරනු ලබන ටවර් හෝල් රඟහල පදනම සෑම වර්ෂයකම මාර්තු මස 27 දින ලෝක නාට්‍ය දිනය වෙනුවෙන් සැමරුම් වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

2024 මාර්තු මස 27 දින මරදාන එල්ෆින්ස්ටන් රංගශාලාවේදී කොළඹ නගරයේ ඇති සිංහල, දෙමළ හා මුස්ලිම් පාසල් වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 800 කට අධික සංඛ්‍යාවගේ සහභාගීත්වයෙන් සැමරුම් උත්සවයක් පවත්වන ලදී.

2024 ලෝක නාට්‍ය දිනය සැමරුම් උත්සවයේ සුවිශේෂී අවස්ථා කිහිපයක්






- **විදෙස් නාට්‍ය උළෙල නියෝජනය කිරීම**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 1** |
| **වියදම** | **-** | **රු.මි. 0.101** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **60%** |

ජාත්‍යන්තර රංගකලා ආයතනය මඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික සම්මේලනය මෙවර බෙල්ජියමේදී හා නෙදර්ලන්තයේදී පවත්වන ලදී. එම සමුළුව සඳහා ටවර් හෝල් රඟහල පදනම නියෝජනය කරන ලදී.

තවද ජාත්‍යන්තර රංගකලා දින සැමරුම් වැඩසටහන ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ආසියානු හා ශාන්තිකර කලාපීය සමුළුව පසුගිය මාර්තු මස චීනයේ ලන්ක්ෆන් නගරයේ දී පවත්වන ලදී. මේ සඳහා ටවර් හෝල් රඟහල පදනම සහභාගී විය.







- **ව්‍යපත් ටවර් කලාශිල්පීන් සඳහා ජීවනාධාර ලබාදීම**

ව්‍යපත් කලාකරුවන් 122 දෙනෙකුට රු10,000/- බැගින් මාසික ජීවනාධාර ලබාදීම ක්‍රියාත්මක කරන ලදී.

**වාර්ෂික ප්‍රතිපාදනය - රු.මි. 13.4**
**වියදම - රු.මි. 12.81**
**භෞතික ප්‍රගතිය - 100%**

- **ව්‍යපත් ටවර් කලාකරුවන් සඳහා අවුරුදු තිළිණ ලබාදීම**

**වාර්ෂික ප්‍රතිපාදනය - රු.මි. 0.172**
**වියදම (ආයතනික) - රු.මි. 0.171**
**අනුග්‍රාහක ආයතන වලින් ලබාගත් භාණ්ඩවල වටිනාකම - රු.මි. 0.80**
**භෞතික ප්‍රගතිය - 100%**

ටවර් හෝල් රඟහල පදනම මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යපත් කලාකරුවන් සඳහා වන මාසික ජීවනාධාර වැඩසටහනට ඇතුලත්ව සිටින ව්‍යපත් කලාකරුවන්ට ඔවුන්ගේ පවුල්වල අය සමඟ සිංහල අලුත් අවුරුද්ද සැමරීම සඳහා 2024 අප්‍රේල් මාසයේදී රු10,000/- කට ආසන්න වටිනාකමකින් යුත් වියලි ආහාර සහිත තෑගි මල්ලක් පිරිනමන ලදී. මේ සඳහා වූ වියලි ආහාර ද්‍රව්‍ය අනුග්‍රාහක ආයතන වලින් ලබාගන්නා ලද අතර, එහිදී කලාකරුවන් 122 ක් සඳහා තෑගි මලු ප්‍රදානය කරන ලදී.

අවුරුදු තෑගි ලබාදීමේ උත්සවය 2024.04.08 දින අරලියගහ මන්දිරයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා හා එම අමාත්‍යාංශයේ ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම්තුමා හා ප්‍රවීණ කලාකරුවන් හා අනුග්‍රාහක ආයතන නිලධාරීන් හා ව්‍යපත් කලාකරුවන්ගේ පවුල්වල සාමාජිකයින් හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය ඇතුළු විශාල පිරිසක් සහභාගී විය.

ටවර් කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ලබාදීමේ උත්සවයේ සුවිශේෂී අවස්ථාවන් කිහිපයක්







- මරණාධාර දීමනා ලබාදීම

**මියගිය ටවර් හා ප්‍රසාංගික කලාකරුවන් 13 ක් සඳහා රු25,000/- බැගින් මරණාධාර ලබාදීම**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 0.25** |
| **වියදම** | **-** | **රු.මි. 0.315** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

- **අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය ටවර් නාට්‍ය උළෙල 2024**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 2.132** |
| **වියදම** | **-** | **රු.මි. 2.14** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **100%** |

රංග ශාලා ප්‍රවර්ධනය කිරීම, නාට්‍යකරුවන් දිරිගැන්වීම, දියුණු ප්‍රේක්ෂකාගාරයක් ගොඩනැගීම, ප්‍රේක්ෂකයින් සඳහා අඩුමිලට සුවිශේෂී නාට්‍ය රසවිඳීම සඳහා අවස්ථාව සැලසීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ටවර් නාට්‍ය උළෙල අති උත්කර්ෂවත් ලෙස විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය සහිතව ඓතිහාසික ටවර් හා එල්ෆින්ස්ටන් රංගශාලාවන්හි දී පුරා දින 12 ක් පවත්වන ලදී.

ප්‍රවීණ නාට්‍යකරුවන්ගේ වේදිකා නාට්‍ය, නව නිර්මාණකරුවන්ගේ වේදිකා නාට්‍ය (දිගු හා කෙටි) හා පාසල් මට්ටමින් නිෂ්පාදිත නාට්‍ය (දිගු හා කෙටි) ඇතුළු වේදිකා නාට්‍ය 44 ක් මෙහිදී ප්‍රදර්ශනය කරන ලද අතර, මේ සඳහා 10000 කට අධික ප්‍රේක්ෂකයින් සංඛ්‍යාවක් මෙම නාට්‍ය නරඹන ලදී.





- **ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංග පැවැත්වීම**

| | | |
|---|---|---|
| **වාර්ෂික ප්‍රතිපාදනය** | **-** | **රු.මි. 3.6** |
| **වියදම** | **-** | **රු.මි. 3.13** |
| **භෞතික ප්‍රගතිය** | **-** | **67%** |

නූතන තරුණ පරපුරට හා පාසල් සිසුන්ට හා දෙමාපියන් ඇතුළු වැඩිහිටියන්ට නූර්ති, නාඩගම්, ථීටර් හා ග්‍රැමෆෝන් යුගයන්හි නිර්මාණ රසාස්වාදය ලබාදීමේ අරමුණින් රසික ජනතාව අතර, අතිශය ජනප්‍රියත්වයට පත්වූ නාට්‍ය ජවනිකා අවස්ථාවන් හා ගීත රංගනයෙන් ඉදිරිපත් කිරීම මෙම ප්‍රසංගයෙන් ඉදිරිපත් කරනු ලබයි.

මෙම ප්‍රසංගය සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් ලැබුණු ඉල්ලීම් වලට අනුව ප්‍රසංග 4 ක් මෙම වර්ෂයේ පවත්වා ඇති අතර, ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය නැරඹීම සඳහා 6000 කට අධික සංඛ්‍යාවක් සහභාගී විය.

ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගයන්හි සුවිශේෂී අවස්ථාවන් කිහිපයක්







➢ ටවර් රංගයාත්‍රා රසවින්දනාත්මක වැඩසටහන

**වාර්ෂික ප්‍රතිපාදනය - රු.මි. 1.2**
**වියදම - රු.මි. 1.01**
**භෞතික ප්‍රගතිය - 100%**

ශ්‍රී ලංකාවේ නාට්‍ය කලා ඉතිහාසයේ විකාශනය හා සන්ධිස්ථාන පිළිබඳව පාසල් සිසුන්ට හා ගුරුවරුන් සඳහා දැනුම හා අවබෝධය හා රසාස්වාදය ලබාදීමේ අරමුණින් ටවර් රංග යාත්‍රා වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ විවිධ පලාත් වල පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ ඉල්ලීම් වලට අනුව ටවර් රංගයාත්‍රා වැඩහටහන් 06 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා ගුරුවරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 4500 කට අධික සංඛ්‍යාවක් සහභාගී විය

➢ ටවර් හෝල් රඟහල පදනම යූ ටියුබ් (You tube) නාලිකාව පවත්වාගෙන යාම

**වාර්ෂික ප්‍රතිපාදනය - රු.මි. 0.6**
**වියදම - රු.මි. 0.162**
**භෞතික ප්‍රගතිය - 100%**

මෙම වර්ෂයේ ටවර් හෝල් රඟහල පදනමේ (You tube) නාලිකාව නරඹා ඇති ප්‍රේක්ෂක සංඛ්‍යාව 152,511 වන අතර, එය සාමාන්‍යයෙන් 2.32කි. වැඩසටහන් නරඹන ප්‍රේක්ෂකයින්ගේ සාමාන්‍ය ප්‍රතිශතය 20.1% කි





➢ වෙසක් හා පොසොන් උත්සව නිමිති කරගෙන බැති ගී හා නූර්ති ගී ප්‍රසංග පැවැත්වීම

**වාර්ෂික ප්‍රතිපාදනය - රු.මි. 1.249**
**වියදම - රු.මි. 1.222**
**භෞතික ප්‍රගතිය - 100%**

රාජ්‍ය වෙසක් උත්සවය හා පොසොන් උත්සවයට සමගාමීව ටවර් හෝල් රඟහල පදනම විසින් ප්‍රවීණ ටවර් කලා ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් ටවර් නූර්ති ගී හා බොදු ගී ඇතුලත්ව බොදු ගී ප්‍රසංග 4 ක් පැවැත්වන ලදී. ඒ සඳහා ටවර් හෝල් රඟහල පදනම සමඟ කටයුතු කරනු ලබන ප්‍රවීණ කලාකරුවන්ගේ දායකත්වය මේ සඳහා ලබාදෙන ලදී. ගීත ජවනිකා ඇතුලත් මෙම බොදු ගී ප්‍රසංග නැරඹීම සඳහා විශාල පිරිසක් සහභාගී විය.

ටවර් බොදු බැති ගී ප්‍රසංගයේ වැඩසටහන් හි ප්‍රචාරක බැනර් ඡායාරූප කිහිපයක් පහතින් දක්වා ඇත.






## ❖ මධ්‍යම සංස්කෘතික අරමුදල



ගුරුගොඩ ස්තූප සංරක්ෂණ



පෝයගෙයසංරක්ෂණ



පඩුවස්නුවර සීමාමාලකය සංරක්ෂණ



දිගම්පිටිය පුරාණ ටැම්පිට විහාරයේ සංරක්ෂණ

## ❖ ජාතික ප්‍රසාංගික කලා මධ්‍යස්ථානය (නෙළුම් පොකුණ රඟහල )

➢ 2024.01.19 ප්‍රජා පොලිස් සමුළුව





➢ 2024.01.19 යෝර්ක් ඉන්ටර්නැෂනල් - උපාධිය





➢ 2024.01.29 චීන වසන්ත උත්සවය - සංස්කෘතික උත්සවය





➢ 2024.03.01,02,03 ගීතා මහෝත්සව්





➢ 2024.03.06 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - සම්මාන උළෙල






➢ 2024.04.09 CJ අවුරුදු කුමාර





## ❖ කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය

- **ඓතිහාසික හාරිස්පත්තුව කටාරංගල රජමහා විහාරයේ විහාරගෙය ප්‍රතිසංස්කරණය කිරීම**

සුරැකිමු උරුමය හෙටට වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය මඟින්, කන්ද උඩරට ඓතිහාසික අතින් ඉතා වැදගත් සුවිශේෂී විහාරස්ථාන සංවර්ධනය හා සංරක්ෂණය කිරීම ප්‍රධානතම අරමුණ බවට පත් විය. ඓතිහාසික හාරිස්පත්තුව කටාරංගල රජමහා විහාරස්ථානය යනු ඓතිහාසික මෙන් කන්ද උඩරට පිහිටි සුවිශේෂී විහාරයකි. ඒයට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ දැනට ඇති දඹු රන් පිළිම දෙකෙන් ඒකක් තැන්පත් කර ඇති විහාරස්ථානයක් වීමයි. දඹු රන් පිළිම ලෙස ජනප්‍රවාදයේ පවතින්නේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන අවස්ථාවේ දී උන්වහන්සේ ආදාහනය කරන විට ඒම චිතකයට ජනතාව විසින් භක්තියෙන් දමන ලද රත්තරන් උණු කොට නිර්මාණය කරන ලද පිළිම වීමයි. දැවුනු රත්තරන් පිළිම එසේත් නැතහොත් දඹු රන් පිළිම ලෙස හඳුන්වන ලදී. මෙම පිළිමය තැන්පත් කර ඇති විහාර ගෙයෙහි බිම ගල් පතුරු අල්ලා වේයන් බෝ වීම පාලනය කර අනාගත පරපුරේ උරුමය සංරක්ෂණය සඳහා මෙමඟින් කටයුතු සිදු කර ඇත. ඒ අනුව 2024 වසර සඳහා රුපියල් 750,000.00 ක මුදලක් මේ සඳහා වෙන්කර තිබූ අතර, 100%ක මූල්‍ය ප්‍රගතියක්ද, 100% ක භෞතික ප්‍රගතියක්ද 2024 වසර සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ලඟාකර ගැණින. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකරන ලදී.





සංවර්ධනය කරන ලද විහාර ගෙයෙහි බිම

- **කැලෑ බොක්ක ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල සංවර්ධනය කිරීම**

කන්ද උඩරට සුරකිමු උරුමය හෙටට වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය මඟින්, උඩරට ඓතිහාසික අතින් ඉතා වැදගත් සුවිශේෂී අන්‍යාගමික උරුමයන් සංවර්ධනය හා සංරක්ෂණය කිරීම ප්‍රධානතම අරමුණ බවට පත් විය. ඓතිහාසික කැලෑ බොක්ක ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල යනු ඓතිහාසික මෙන් කන්ද උඩරට වතු දමිල ජනයා අතර ප්‍රචලිත මෙන්ම ඉතා භක්තියෙන් යුතුව අදහන ලබන ආගමික ස්ථානකි.

වසර 200කට වඩා පැරණි මෙම කෝවිල කන්ද උඩරට ජන සංස්කෘතිය තුල කියැවෙන පැරණිතම අන්‍යාගමික ස්ථානයක් වනු ඇත. ඒ අනුව 2024 වසර සඳහා රුපියල් 200,000.00 ක මුදලක් මේ සඳහා වෙන්කර තිබූ අතර, 100%ක මූල්‍ය ප්‍රගතියක්ද, 100% ක භෞතික ප්‍රගතියක්ද 2024 වසර සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ලඟාකර ගැණින. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකරන ලදී

  

සංවර්ධනය කරන ලද කැලෑ බොක්ක ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිල

- **උඩරට ගැමි සංස්කෘතියේ මූලස්ථානයක් වන මිණිපේ ගලමුදුන සාම්ප්‍රදායික ගම්මානයේ කෘෂි ආරක්ෂණ වැඩසටහනට සමගාමීව ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් පවුල් 34ක් සඳහා විදුලි පඹයා උපකරණය ලබා දීම සහ අපනයන කෘෂි භෝග (ගම්මිරිස්/බුලත්/එනසාල්) ලබාදීම**

සාම්ප්‍රදායික ගම සංවර්ධන වැඩසටහන (අධ්‍යාත්මික , සංස්කෘතික, සමාජීය හා ආර්ථික සංවර්ධනය හා ආහාර සුරක්ෂිතතාවය තුළින් ලෝකය දිනන අපේ ගම) යටතේ ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය, කන්ද උඩරට උරුමය හා සබැඳි පාරම්පරික ගම්මාන සංවර්ධනය හා ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය නඟා සිටුවීම යන අරමුණු මුල් කරගනිමින්, ගලමුදුන ගම්මානය හා ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලදී. ඒ අනුව මෙම ගම්මානය, කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ නව ජනපද ඇති කලද පාරම්පරික ජන කොටසක් ලෙස මෙම ගම්වාසීන් ගම අතහැර නොගොස් පවුල් 100ක් පමණ ජීවත් වුවද රටේ සංවර්ධනය ගමට විතැන් නොවීම හේතුවෙන්, මේ වන විට එය පවුල් 38කට පමණ සීමා වී ඇත.

පරම්පරා ගනනාවක් මෙම ග්‍රාමය තුල ජීවත් වුවද, වසර 2021 වන විටත්, මෙහි නිසි ප්‍රවේශ පහසුකමද ලැබී නොමැත. එසේ වුවද මෙම ගම තුල මිණිපේ කොට්ඨාශයේ පැරණිතම පාසලක්ද, නටඹුන් බවට පත්ව ඇති පන්සලක් ද, සුසාන භූමියක් ද පිහිටා ඇති අතර ගමේ පාසලේ ඡන්ද මධ්‍යස්ථානයක්ද ක්‍රියාත්මක වේ. පාසලේ ගුරුවරුන් කිහිප දෙනෙක්ද, ග්‍රාම නිලධාරී වරයෙකුද, සංවර්ධන නිලධාරී වරයෙකුද, කෘෂිකර්ම නිලධාරී වරයෙකුද ලෙස රජයේ නිලධාරීන්ද පත්කර ඇතත්, දුෂ්කරතා හේතුවෙන් ඔවුන්ගේ පැමිණීමද ගැටළුකාරී බව නිරීක්ෂණය විය.

මෙහි ජනයාගේ නිශ්පාදන වලට වෙළඳපොලක් නිර්මාණය කරගැනීමට අවකාෂ නොමැති බැවින් ඒ සඳහා මිලක් ලබාගැනීමට අතිෂය දුෂ්කර වී ඇත. ගම හුදකලා වීමෙන් පවුල් කිහිපයක දරුවන් අතර සිදුවන විවාහ හේතුවෙන් දරුවන් විවධ රෝගී තත්වයන්ට ලක්වීමක් පවතී. ග්‍රාමය හා නගරය සම්බන්ධ කිරීම තුලින් ආර්ථික සහ සමාජීය සංවර්ධනය නිතැතින්ම ලඟාකර ගත හැකි බව ප්‍රායෝගිකව නිරීක්ෂණය වූ කරුණකි.

කන්ද උඩරට බලප්‍රදේශයේ අතිශය පැරණි සහ දුෂ්කරතම ග්‍රාමයක් ලෙස හඳුන්වන මෙම ග්‍රාමයේ ජනතාව බාහිර සමාජයට සාපේක්ෂව දැඩි දුෂ්කරතාවන්ට පත්ව ඇති බැවින්, ආහාර නිශ්පාදනයෙන් ස්වයංපෝෂිත මෙම ගම්මානය බාහිර සමාජයෙන් හුදකලාභාවයට පත්ව ඇති බව පෙනී ගියේය. කන්ද උඩරට උරුමයට අදාල විශේෂීකරණය වූ සංස්කෘතික රටාවක් මේ තුල පවතින අතර, වර්තමානයේ වෙසෙන පවුල් 38ද ග්‍රාමයෙන් ඇත් වුවහොත් මෙම විශේෂීකරණය වූ සංස්කෘතිය සමාජයෙන් වියැකී යනු ඇත.

රක්ෂිත කඳුකර වනය මැදින් කිලෝමීටර් 5ක් පමණ දුරට වැටී ඇති මෙම ග්‍රාමයට ඇති ප්‍රවේශ මාර්ගය මෙම ග්‍රාමයේ වෙසෙන ජනතාවට සැබවින්ම තම පැවැත්මට දුෂ්කර අභියෝග නිර්මානය කරනු ඇත. තවද අලි ඇතුළු වන සත්ව හානි හේතුවෙන් තම කෘෂි වගාකටයුතුද දුෂ්කරතාවයන්ට හේතු වී ඇත. එමෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගම්වාසීන් විකල්ප ගම්මානයක පදිංචි කරවීමට යෝජනා ඉදිරිපත් කළද, මෙතෙක් හුරුවූ ග්‍රාමීය ජීවිතයද, ජීවනෝපාය සරිකර ගැනීමට ප්‍රමානවත් පහසුකම් නොසැපයීම හේතුවෙන් ද ග්‍රාමය අතහැර යාමට ප්‍රජාව ප්‍රතික්ෂේප කරමින් පවතී.

මෙම කරුණු පිළිබඳ අධ්‍යයනයකින් අනතුරුව, කන්ද උඩරට උරුමයට විශේෂීකරනය වූ ගලමුදුන ග්‍රාමයේ සංවර්ධන කටයුතු වෙනුවෙන්, ගෙවතු සංවර්ධන වැඩසටහන් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනක් වශයෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, හුදකලාව ජීවත්වන ගලමුදුන ප්‍රදේශවාසීන් සඳහා සංවර්ධනයේ අරුණලු උදාකරදීම මෙම ව්‍යාපෘති මඟින් සැලසුම් කර තිබිණ.

ඒ අනුව 2024 වසර සඳහා රුපියල් 2,000,000.00 ක මුදලක් මේ සඳහා වෙන්කර තිබූ අතර, ඉන් රුපියල් 1,861,114.45ක් වියදම් දරා ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් 95%ක් වේ. තවද, 100% ක භෞතික ප්‍රගතියක්ද 2024 වසර සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ලඟාකර ගැණුනු අතර, ව්‍යාපෘතියද සාර්තකව නිමකරන ලදී.





විදුලි පඹයා උපකරණය හා අපනයන කෘෂි භෝග පැල ලබාදෙන අවස්ථා

- **වියමනක උරුමය සිත්කළු පන් රටා පුහුණු වැඩසටහන - බණ්ඩාරවෙල**

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා එක්ව සිදුකරන ලද මෙම ව්‍යාපෘතිය තුලින් සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධනය හා ප්‍රචාරණය මූලික අරමුණු කරගනු ලැබීය. මෙහි දී ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස පන් කර්මාන්ත හඳුනාගන්නා ලදී. ඒ අනුව එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ තවත් සුවිශේෂී අරමුණක් විය. මෙම කර්මාන්තයෙන් දිවි රැකගන්නා ගම්වාසීන්, සිය පරම්පරාවෙන්ම විවධ දක්ෂතා ඇති පුද්ගලයෝ බව හඳුනාගන්නා ලදී.

කර්මාන්තයට අවශ්‍ය දැනුම යාවත්කාලීන නොවීම, නවීන තාක්ෂණික දැනුම භාවිතා නොකිරීම, දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට ගැලපෙන අයුරින් නිෂ්පාදන විවිධාංගීකරණය සිදු නොකිරීම,වර්තමාන ශිල්පීන්ගෙන් අනතුරුව පැවත එන නව පරම්පරාව මෙම කර්මාන්තයෙහි නිරත නොවීම ආදී ගැටළු හඳුනාගෙන ඒවාට හැකි අයුරින් විසඳුම් ලබා දී බණ්ඩාරවෙල සාම්ප්‍රදායික පන් කර්මාන්ත කරුවා දිරිගැන්වීම මෙමඟින් සිදුවිය.

ඒ අනුව පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් සඳහා  අවශ්‍ය උපකරණ ලබාදී එම භාණ්ඩ හා නිෂ්පාදන වල ගුණාත්මක භාවය උසස් කොට ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්වය උසස් කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් දායක විය. මෙම ව්‍යාපෘතිය කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සේවය කරනු ලබන රසිකා අතපත්තු මියගේ (සංවර්ධන නිලධාරී) මූලිකත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී.  ඒ අනුව 2024 වසර සඳහා රුපියල් 350,000.00 ක මුදලක් මේ සඳහා වෙන්කර තිබූ අතර, 100%ක මූල්‍ය ප්‍රගතියක්ද, 100% ක භෞතික ප්‍රගතියක්ද 2024 වසර සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ලඟාකර ගැණුනු අතර, ව්‍යාපෘතියද සාර්තකව නිමකරන ලදී.





පුහුණු වැඩසටහන අතරතුර සහ බෙදා හරින ලද උපකරණ

- **වැලලී යමින් පවතින ඓතිහාසික රණමුරේ ගම්මානයේ පවත්නා සාම්ප්‍රදායික රාවණ යක්කම සජීවීව පැවැත්වීම හා සංරක්ෂණය කිරීම**

වර්තමාන සමාජයෙන් වියැකීයන විශේෂිත වූ සංස්කෘතිකාංග අනාගත සමාජයේ අභිවෘද්ධිය උදෙසා සුරක්ෂා කිරීමේ අවශ්‍යතාවය වර්තමාන සමාජය තුල නිරන්තරයෙන් දැකගත හැකිය. එමෙන්ම අතීත උරුමය හරහා පෞඪ අනාගතයක් ගොඩනැගීමට ඇති අවශ්‍යතාවය, පුරාණ සංස්කෘතික කාරණා වර්ථමාන සමාජයෙන් බැහැර වී යන අවධියක ඔවුන් මේ සඳහා යොමුකොට අධ්‍යයන අවශ්‍යතා පුළුල් කිරීමට ඇති අවශ්‍යතාවය, අභිමානවත් ජන සමූහයක් නිර්මාණය කිරීමේ ඇති අවශ්‍යතාවය සහ නිවැරදි හා පැහැදිලි වශයෙන් අදාල වත් පිළිවෙත් පිළිබඳ සත්‍ය දැනුම සමාජ ගත කිරීමේ අවශ්‍යතාවය වර්ථමාන සමාජය තුල අත්‍යාවශ්‍ය කාරණා ලෙස හඳුනාගන්නා ලදී. එමෙන්ම සජීවී අත්දැකීම් මහජනතාව වෙත ලබාදීම තුළින් පෞඪත්වය පිළිබඳ ධනාත්මක ආකල්ප මහජනයාගේ සිත් තුල වර්ධනය කිරීම සහ වර්ථමාන ආර්ථික තත්වය හේතුවෙන් කලා ශිල්පීන් මුහුණපා ඇති විවිධ සමාජ ගැටළු සඳහා සහනයක් ලබාදීම අවශ්‍ය වීම මෙන්ම රටට සෙත් පැතීම යන කාරණා මුල් කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

"රාවනා යක්කම" ශාන්තිකර්මය හා සබැඳි උරුමය ආරක්ෂා කිරීම සහ දැනුමෙන් පිරි සමාජයක් බිහිකිරීම් විවිධ ශාන්තිකර්ම ක්‍රම සමාජගත කිරීම, ක්ශේත්‍රයේ දැනට සිටින ශිල්පීන් දිරිගැන්වීම, ආධුනිකයින් පුහුණු කිරීම හා සමාජයෙන් තුරන් වී යන අස්පෘශ්‍ය සංස්කෘතිකාංග සංරක්ෂණය යන ඉලක්ක සපුරාගැනීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදුකරන ලදී. තවද යලිපුබුදමු හෙළ කලාව වැඩසටහන යටතේ කන්ද උඩරට බල ප්‍රදේශයට පමණක් ආවේණික මෙම  යක්කමක් වසර 39කට පසු සමාජගත කිරීමට හැකිවීම අපගේ පර්යේෂණාත්මක කාර්යයන්ගේ ප්‍රගතිය විදහාපාන සාධකයක් විය. දැණුම පිපාසයෙන් පෙලෙන අනාගත පරපුර වෙත සාම්ප්‍රදායික දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා සජීවී අත්දැකීම් සමඟ සංරක්ෂණය සඳහා කටයුතු කල මෙම ව්‍යාපෘතියද, ඉතාමක් සාර්ථක අන්දමින් සාමාන්‍යයෙන් යක්කම පුරාණයේ සිට පැවත ඒන කාල පරාසය තුලම රඟදැක්වීයද මෙහිලා ව්‍යාපෘතියේ සාර්ථකත්වය පෙන්වා දෙයි. අදාල ව්‍යාපෘතිය කන්ද උඩරට උරුමය සුරැකීම සඳහා අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සේවය කරණු ලබන සී.ඒ.බී ගමගේ මයාගේ (සංවර්ධන නිලධාරී) මූලිකත්වයෙන්

ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2024 වසර සඳහා රුපියල් 400,000.00 ක මුදලක් මේ සඳහා වෙන්කර තිබූ අතර, 100%ක මූල්‍ය ප්‍රගතියක්ද, 100% ක භෞතික ප්‍රගතියක්ද 2024 වසර සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ලඟාකර ගැණුනු අතර, ව්‍යාපෘතියද සාර්තකව නිමකරන ලදී.









ශාන්ති කර්මය සජීවීව පවත්වන අවස්ථාවන්හිදී

## 2.2 අභියෝග හා ඉදිරි ඉලක්ක

### <u>ජාතික උරුම ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u>

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ආරම්භ කළ/ යෝජිත දිනය | අපේක්ෂිත ප්‍රතිලාභ | | ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව |
|---|---|---|---|---|
| | | ප්‍රමාණාත්මක | ගුණාත්මක | |
| **1.** ආදිවාසී ප්‍රජා සංරක්ෂණ කාර්යයන් 101-2-05-044-2001 | | | | |
| • දඹාන කෞතුකාගාරය ආශ්‍රිත භූමි අලංකරණය | 2025 වර්ෂය සඳහා | • ආකර්ශණීය කෞතුකාගාරය හා ඒ ආශ්‍රිත භූමි | • සංචාරක ආකර්ෂණය වැඩිවීම. | දිගුකාලීන |
| • ආදිවාසින් පිළිබඳ වාර්තාමය වීඩියෝ නිර්මාණය කිරිම. | | • ආදිවාසීන් පිළිබඳ සංරක්ෂණ වීඩියෝ පට | • ආදිවාසීන්ගේ සමාජ තත්ත්වයන් හා උරුමයන් පිළිබඳව දැනුවත් වීම | |
| 2. උරුමයන් ප්‍රවර්ධනය හා ස්වදේශික ජනතාව ආරක්ෂා කිරිම. 101-02-05-044-2509 | | | | |
| • ජාතික උරුම ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම සහ තොරතුරු තාක්ෂණය පියස නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය | 2025 වර්ෂය සඳහා | • අස්පර්ශනිය හා ස්පර්ශනීය ජාතික උරුමයන් සංරක්ෂණය කිරිම හා සංචාරක ප්‍රවර්ධනය | • විද්‍යුත් මාධ්‍ය හා සමාජ මගින් ජාතික උරුම සංරක්ෂණය වීඩියෝ ව්‍යාප්ත වීමෙන් ජාතික උරුම ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සංරක්ෂණය විම හා තරුණ පරපුර අතර ප්‍රචලිත වීම | දිගුකාලීන |
| • දැයේ උරුමය දරුවන්ටයි සංස්කෘතික විද්‍යාගාර ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය (සංස්කෘතික කඳවුරු) | | • කලා සංස්කෘතික කඳවුරු පැවැත්වීම මගින් උරුම පිළිබඳ දැනුම හා සංරක්ෂණය පිළිබඳව සිසුන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය | • ශ්‍රී ලාංකීය දරු පරපුර ජාතික උරුමයන් හා සාම්ප්‍රදායික අගයන් පිළිබඳව දැනුවත් වීම සහ ඒම උරුමයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සමත් සංස්කෘතික මිනිසෙකු බිහිවීම | |
| • වාකරේ, දළුකාන, දඹාන, රතුගල, පොල්බැද්ද සහ හෙනානිගල යන ආදිවාසි ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය | | • තෝරාගත් යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද ආදිවාසී ගම්මාන | • ආදිවාසි ප්‍රජාවගේ දෛනික කටයුතු පහසු වීම. | |
| 3.ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම101-2-05- 044-1409 | | | | |
| • ආදිවාසී/ සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාව සංරක්ෂණ සේවාවන් පැවැත්වීම | 2025 සඳහා ප්‍රතිපාදන | • ලෝක ආදිවාසී දින සැමරුම, දඹාන/ හෙනානිගල හැක්ම ශාන්ති කර්ම වැඩසටහන් අවසන් කර තිබීම. | • ආදිවාසී හා සුවිශේෂී අනන්‍යතාවයකින් යුත් ප්‍රජාවන්ගේ අයිතීන් සුරැකීම හා තෘප්තිමත් ජන කොටසක් බවට පත් වීම. | දිගුකාලීන |

| ව්‍යාපෘතිය/ වැඩසටහන | ආරම්භ කළ/ යෝජිත දිනය | අපේක්ෂිත ප්‍රතිලාභ | | ප්‍රතිලාභ ලැබෙන කාල වකවානුව |
|---|---|---|---|---|
| | | ප්‍රමාණාත්මක | ගුණාත්මක | |
| • ආදිවාසි ගම්මාන වල සමාජ සජීවිකරණ වැඩසටහන සිදු කිරිම. | | • සමාජ සජීවිකරණ වැඩසටහන සම්පූර්ණ කර තිබීම. | • ආදිවාසී ප්‍රජාව තම අනන්‍යතාවයන් සුරකිමින් නව සමාජ තත්වයන්ට අනුගත වීම | |
| • ජාතික උරුම හඳුනා ගැනීම හා සංරක්ෂණය | | • ප්‍රකාශිත ජාතික උරුමයන් | • ජාතික උරුමයන් සංරක්ෂණය හා පර්යේෂණය සඳහා ස්ථායි හා විධිමත් ක්‍රමවේදයක් පැවතීම | |
